# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016 සැප්තැම්බර් 20 වන අඟහරුවාදා**
2016 புரட்டாசி 20 செவ்வாய்க் கிழமை
Tuesday 20th September 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.46 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப. 09.46 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.46 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනයක් වේවා. 2016 සැප්තැම්බර් මස 20 වන දිනට නියමිත න්‍යාය පත්‍රය. මම ඉතාම කනගාටු වෙනවා සභාපතිවරයා මූලාසනයට එනකොට විපක්ෂයේ සංවිධායකවරයා, ජෝර්ජ් පෙරේරා මැතිතුමා ඔබතුමාගේ හැසිරීම ඉතාම කනගාටුදායකයි. සභාපතිතුමා කියලා නිවේදනය කරලා කියනවා. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ජ්‍යෙෂ්ඨ සංවිධායකවරයෙක්. පෙනී පෙනී ඔබතුමා කථා කර කර ඉන්නවා. 100 යි, 150 යි. මොනවාද මේ ඔබතුමන්ලාගේ බාල වැඩ. 100 යි, 150 යි. මෙතැන මාර්කට් එකක් නොවෙයි. එහෙම කරන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දැක්කේ නැහැ. සමාවෙන්න. මම ඒක පිළිගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මෙතැනින් එනකොට පේන්නේ නැද්ද? මම ඔබතුමාගේ හරහා එන්නේ. පේන්නේ නැහැ කිව්වොත් -

# සභාපතිවරයාගේ නිවේදන
ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"2016.08.23 දින සභා සම්මත වූ බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2016 පරිපූරක ඇස්තමේන්තුව - 01 ට අදාළ 2016 අංක 02 දරන විසර්ජන ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2016.08.31 දින අනුඥාව ලබා දී ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"2016.05.03 දින සභා සම්මත වූ බස්නාහිර පළාතේ 2016 අංක 01 දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් 2016.09.07 දින අනුඥාව ලබා දී ඇති බව දැනුම් දෙනවා."*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මේ පරිපූරකය සම්මත වීම පිළිබඳව ඔබතුමා නිවේදනය කරපු නිසා වචන කිහිපයක් කථා කරනවා. එදා පරිපූරකයේදී වාහන සම්බන්ධව ධූරධාරීන් කියලා තිබුණා. අපි නොමඟ ගියා. අද ධූරධාරීන්ට ඒ වාහන නැහැ. ඒ සම්බන්ධව අපට හරි පැහැදිලි කිරීමක් තිබුණෙත් නැහැ. අපි සභා කටයුතු රැස්වීමේ හිටියා. සභා කටයුතු රැස්වීමෙන් පස්සේ ගරු ප්‍රධාන ඇමැතිතුමාටත් අපි ප්‍රකාශ කළා. අපි විපක්ෂ නායකතුමාගේ තත්ත්වයත් කිව්වා. එතුමාගේ වාහනයත් ගැරේජ් එකේ. එතුමාම කිව්වා. අද ඒ නොමඟ යැවීම සම්බන්ධව අපි කනගාටු වෙනවා. අපේ වාහනත් අපට තිබුණාට, කිලෝ මීටර් 150,000 ක් වාගේ දුවපු වාහන තියෙන්නේ. ඉතින් මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරලා, අමාත්‍යවරුන්ට වාහන ගන්නවා නම්, එතුමන්ලා පාවිච්චි කරපු වාහන හරි අපේ ධූරධාරීන් හතර දෙනාට ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. සභාගත කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ න්‍යාය පත්‍රයේ තියෙන්නේ ධූරධාරීන් කියලා. සභාපති, උපසභාපති කියලා නැහැ. ඒක හරි වැරැදියි. එහෙම නම් ඒ න්‍යාය පත්‍රය හදපු කණ්ඩායම වැරැදියි. සභාපති, උප සභාපති කියලා විතරක් දාලා අනුමත වුණා නම්, කමක් නැහැ. ධූරධාරීන් කිව්වාම අපිත් අයිතියි. මම ධූරධාරියෙක්. මෙතුමා ධූරධාරියෙක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රකාශය පැහැදිලියි. මම අගය කරනවා. ඇත්තටම ඒක සිදු වුණේ එහෙමයි. වාහන සම්බන්ධ චක්‍රලේඛය මුදල් අමාත්‍යාංශයෙන් අපට ලැබුණේ. මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. නමුත් ඒ සම්බන්ධව ගරු ප්‍රධාන ඇමැතිතුමාට මම කරුණු කිව්වා. අපේ ගාමිණී තිලකසිරි ගරු ඇමැතිතුමාටත් මම කරුණු කියලා තියෙන්නේ. ඉදිරියේදී ඒ ගැන අනිවාර්යයෙන්ම සාධාරණයක් ඉෂ්ට වෙනවා. ඒ ගැන සලකා බලනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාත් කිව්වා, අපි ඒ ගැන මොනවා හරි කරන්න බලමු කියලා. අනිවාර්යයෙන් අපි ඒක කරමු.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරක සභා වාර්තා පිළිගැන්වීම යටතේ ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව පිළිගැන්වීමට කාරක සභාවේ සභාපතිතුමාට හෝ කමිටුවේ සාමාජික මන්ත්‍රීවරයෙකුට අවස්ථාව.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, 2016.07.20 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම පිළිගන්වනවා.

i. 2016.08.02 වන දින පැවැති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2016.09.02 දින හා 2016.09.07 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු යසපාල කෝරළගේ - නියෝජ්‍ය සභාපතිතුමා**
Hon . Yasapala Koralage - Deputy Chairman

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. ගල්පාත, මනාන හි පදිංචි යටවතුරගේ සුමනාවතී යන අයගේ පෙත්සම,

ii. මීවනපලාන, අංක 108 ඒ හී පදිංචි එච්. විජේතිලක හපුතන්ත්‍රී යන අයගේ පෙත්සම සහ

iii. හොරණ, කලාප අධ්‍යාපන කලාපයේ ආර්.එච්.එම්. රණසිංහ යන අයගේ පෙත්සම.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පොල්ගම්පොල, පල්ලිගොඩ හි පදිංචි යූ.ඩී.ඒ.කේ. ගුණසිංහ යන අයගේ පෙත්සමසහ

ii. දර්ගා නගරය, කොස්වත්ත ගොඩ හි පදිංචි කේ.කේ. ධම්මික යන අයගේ සහ දර්ගා නගරය, වරාපිටිය, අංක 205 හි පදිංචි එච්.එස්. වීරසිරි ප්‍රනාන්දු යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු සභාපතිතුමනි, වෙයන්ගොඩ, බණ්ඩාරනායක මාවත, අංක 605/1/ඒ හි පදිංචි එම්.ටී ජයසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, පානදුර, ගල්තුඩේ, සපුගහවත්ත පාර, අංක 72 හි පදිංචි මහේන්ද්‍ර ප්‍රේමලාල් සොයිසා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

ගරු සභාපතිතුමනි,කිරිගම්පමුණුව, මත්තේගොඩ, ගෝල්ඩන් මොඩෝස්, අංක 32/50 හි පදිංචි ආර්.එච්. අමරසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

ගරු සභාපතිතුමනි, අතුරුගිරිය, රතුවිලවත්ත, අංක 708/16 හි පදිංචි එම්.පී. සීතා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නවලට වාචික පිළිතුරු සැපයීමේ අවස්ථාව. මම ඒ යටතේ සියලුම ගරු අමාත්‍යවරුන්ව දැනුවත් කරනවා, මීට පෙර සභා රැස්වීම්වලදී පිළිතුරු දීමට කල් ගත් ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට ඔබතුමන්ලා ලැහැස්ති නම්, ඒ සඳහා මේ අවස්ථාවේදී, එකී අවස්ථාව ලබා දෙන්න පුළුවන්.

**ගරු ලලිත් වනිගරත්න** (මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, ගිය පළාත් සභා රැස්වීම අවස්ථාවේදී මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් මධ්‍යම අධිවේගී මාර්ගයෙන් පීඩාවට පත් වූවන්ගේ සාධාරණ ඉල්ලීම පිළිබඳව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවා. එම අභියාචනකරුවන් වෙත සහන ඉල්ලූ සියලු දෙනා සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සඳහා විශේෂයෙන්ම මගේ අමාත්‍යාංශයට අයිති කරුණක් නොවන බැවින් මධ්‍යම ආණ්ඩුවේ ගරු මහ මාර්ග හා උසස් අධ්‍යාපන ඇමැතිතුමාට දන්වා ලිපියක් යොමු කළ බව කාරුණිකව දැනුම් දෙනවා. ඒ වාගේම එහි පිටපත් මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාටත් යවා ඇති බව දන්වා සිටිනවා.

**01.**

**කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)/16/71)**

අ. i බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් සහ අමාත්‍යාංශ ලේකම්වරු සභාව මගින් වියදම් දරා 2014 අප්‍රේල්වලින් පසු විදේශ සංචාර සඳහා සහභාගී වී තිබේද?

ii. එක් එක් අය සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද?

iii. කුමන රටවල් වෙතද?

iv. සංචාරයේ නියුතු වූ දින ගණන කීයද?

v. එමගින් සභාව ලද ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිද?

vi. එක් එක් සංචාරය සඳහා දැරූ වියදම කොපමණද?

vii. කුමන වැය ශීර්ෂය යටතේද?

viii. සංචාර සඳහා ඉහත සඳහන් ප්‍රධානීන්ට අමතරව සහභාගී වූ අය කවුරුන්ද? ඒ සඳහා තෝරා ගත් පදනම සහ දැරූ වියදම කොපමණද?

ආ. i ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු වර්තමාන අමාත්‍ය මණ්ඩලය පළාත් සභාව මගින් වියදම් දරා විදේශ සංචාර සඳහා සහභාගී වී තිබේද?

ii. එක් එක් අය සහභාගී වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද?

iii. කුමන රටවල් වෙතද?

iv. සංචාරයේ නියුතු වූ දින ගණන කීයද?

v. එමගින් සභාව ලද ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් දැක්විය හැකිද?

vi. එක් එක් සංචාරය සඳහා දැරූ වියදම කොපමණද?

vii. කුමන වැය ශීර්ෂය යටතේද?

viii. සංචාර සඳහා ඉහත සඳහන් ප්‍රධානීන්ට අමතරව සහභාගි වූ අය කවුරුන්ද? ඒසඳහා තෝරා ගත් පදනම සහ දැරූ වියදම කොපමණද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. i ඔව්.

ගරු මන්ත්‍රීතුමා, අනෙක් ටික සභාගත කරන්නද? උත්තර ගොඩක් තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**

Hon. K.D. Aruna Deepal

කමක් නැහැ. දැන් ප්‍රශ්නය සහමුළුලින්ම විසඳිලා තිබෙන නිසා සහ අතුරු ප්‍රශ්නත් නැති නිසා කමක් නැහැ.

** [සභාගත කරන ලද පිළිතුර]*
*[Tabled Answer]*

අ. ii.

| නම | තනතුර | වාර ගණන |
|---|---|---|
| ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය | ප්‍රධාන ලේකම් | 02 |
| එස්.ටී. කොඩිකාර මහතා | ලේකම්, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය | 01 |
| එම්.සී.එල්. රුද්‍රිගෝ මහතා | ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 02 |
| එස්.ජී. විජයබන්දු මහතා | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය | 01 |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | 06 |
| එම්.ජී.බී. දයා සෙනරත් මහතා | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය | 03 |
| ටී.වී.ඩී. දමයන්ති කරුණාරත්න මහත්මිය | ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 01 |

iii.

| නම | විදේශගත වූ රටවල් | කාල සීමාව | දින ගණන |
|---|---|---|---|
| ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය | තායිලන්තය | 2014.11.21 – 2014.11.25 | 4 |
| | දකුණු අප්‍රිකාව | 2016.05.09 – 2016.05.14 | 5 |
| එස්.ටී. කොඩිකාර මහතා | ඉන්දියාව | 2014.06.08 –2014.06.23 | 14 |
| එම්.සී.එල්. රුද්‍රිගෝ මහතා | ඉන්දියාව | 2014.06.08 – 2014.06.22 | 14 |
| | නවසීලන්තය | 2014.11.09 – 2014.11.17 | 8 |
| එස්.ජී. විජයබන්දු මහතා | නවසීලන්තය | 2014.11.09 – 2014.11.17 | 8 |
| එන්. නිල්වල මහතා | කොලොම්බියාව | 2014.08.27 – 2014.09.05 | 9 |
| | ඇමරිකා එක්සත් ජනපදය | 2014.09.20 – 2014.09.26 | 6 |
| | බෙල්ජියම හා ජර්මනිය | 2015.06.06 – 2015.06.14 | 8 |
| | ප්‍රංශය | 2015.11.30 –2015.12.13 | 14 |
| | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | 8 |
| එම්.ජී.බී. දයා සෙනරත් මහතා | දකුණු කොරියාව | 2015.05.15 – 2015.05.20 | 5 |
| | දකුණු කොරියාව | 2016.04.03 – 2016.04.10 | 7 |
| | රුසියාව හා පින්ලන්තය | 2016.08.10 – 2016.08.18 | 9 |
| ටී.වී.ඩී. දමයන්ති කරුණාරත්න මහත්මිය | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | 8 |

viii. ඉහත iii පිළිතුරෙහි දක්වා ඇත.

viii. මෙම නිලධාරීන් බස්නාහිර පළාතේ ජොෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් වන අතර මෙම නිලධාරීන් විදේශ පුහුණු වැඩ සටහන් මගින් ලබා ගන්නා දැනුම හා අත්දැකීම් පළාත් සභාවේ උන්නතිය හා අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා වැදගත් වේ.



vi. ඇමුණුම 01 හි දක්වා ඇත.

vii. ප්‍රධාන ලේකම් කාර්යාලයේ විදේශ ගමන් වියදම් වැය ශීර්ෂයෙන් 109-3-1-1102

viii. ඇමුණුම 01 හි දක්වා ඇත.

**අ. Vi හා viii ට අදාළ ඇමුණුම 01**

**2014 අප්‍රේල් මාසයෙන් පසුව ප්‍රධාන ලේකම් සහ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ විදේශ සංචාර සඳහා සහභාගී වීම් (සභා අරමුදල් මගින් වියදම් දරන ලද)**

| නම | තනතුර | වැඩ සටහන | රට | කාල සීමාව | දින ගණන | වියදම | | | | එකතුව | වැය ශීර්ෂය | සහභාගි වූ වෙනත් අය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | සංයුක්ත දීමනා | අනියම් දීමනා | ගුවන් ගමන් ගාස්තු | වෙනත් | | | නම | වියදම | වෙනත් |
| එස්.ටී. කොඩිකාර මහතා | ලේකම්, අධ්‍යාපන හා පළාත් පාලන අමාත්‍යාංශය | Capacity Building programme on Proformance Management and Leadership Development | ඉන්දියාව | 2014.06.08 – 2014.06.23 | 14 | | 59292 | 52000 | 3691.59 | 114983.59 | විදේශ ගමන් වියදම් | | | |
| එම්.සී.එල්. රුද්‍රිගෝ මහතා | ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | Capacity Building programme on Proformance Management and Leadership Development | ඉන්දියාව | 2014.06.08 – 2014.06.22 | 14 | | 59310 | 52000 | | 111310 | විදේශ ගමන් වියදම් | | | |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාසය පිළිබඳ සමුළුව | ජර්මනිය | 2014.06.08 – 2014.06.12 | 14 | 263480 | 32935 | 156100 | 19587.75 | 472102.75 | විදේශ ගමන් වියදම් | | | |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | කොලොම්බියාවේ පැවැත්වෙන තිරසාර සංවර්ධනය පිළිබඳ කලාපීය ජාලය විසින් පවත්වනු ලබන වාර්ෂික | කොලොම්බියාව | 2014.08.27- 2014.09.05 | 9 | | | | | 684933 | විදේශ ගමන් වියදම් | බී.ඒ.එන්.එච්. පෙරේරා මිය<br>එච්.ආර්. ලක්මිණි මෙනවිය | | |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ දේශගුණික සතිය හා දේශගුණික සමුළුව | ඇමරිකා එක්සත් ජනපදය | 2014.09.20 – 2014.09.26 | 6 | 418844.48 | | 177800 | 2451.37 | 599095.85 | විදේශ ගමන් වියදම් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත වෙන් කර ඇති මුදල් | | | |
| එම්.සී.එල්. රුද්‍රිගෝ මහතා | ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | Strategic Leadership Training for Top Level Decision Makers | නවසීලන්තය | 2014.11.09 – 2014.11.17 | 8 | 513000 | | | 321561 | 834561 | විදේශ ගමන් වියදම් | කේ.එච්.ඩී.කේ. සමරකෝන් මහතා<br>පී. සෝමසිරි මහතා<br>ඩබ්ලිව්.එම්.ඩී.එන්. රණසිංහ මහතා<br>පී.පී. චම්පිකා මහත්මිය<br>විනීතා රාජපක්ෂ මහත්මිය | 513000<br>513000<br>513000<br>513000<br>513000 | මෙම වැඩ සටහන සඳහා වැඩ සටහන් ගාස්තු වශයෙන් නවසීන්ත ඩොලර් 19550 ක් ගෙවා ඇත. |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එස්.ජී.විජයබන්දු මහතා | ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය | Strategic Leadership Training for Top Level Decision Makers | නවසීලන්තය | 2014.11.09 – 2014.11.17 | 8 | 513000 | | | 321561 | 834561 | විදේශ ගමන් වියදම් | |
| ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය | ප්‍රධාන ලේකම් | E Governance & Local Government Services Delivery Innovation | තායිලන්තය | 2014.11.21 – 2014.11.25 | 4 | 187355 | | 35800 | | 223155 | විදේශ ගමන් වියදම් | වන්ද්‍රානි සමරකෝ මහත්මිය |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස වැඩ සටහන | බෙල්ජියම හා ජර්මනිය | 2015.06.06 – 2015.06.14 | 8 | | | | | 639000 | විදේශ ගමන් වියදම් | |
| එම්.ඒ.බී දයා සෙනරත් මහතා | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය | 16th Interspecialized Couse on Environment Technology (ISCET) | දකුණු කොරියාව | 2015.05.15 – 2015.05.20 | 5 | | 57172 | | 17728 | 74900 | විදේශ ගමන් වියදම් | |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | COP 21, Paris 2015 | ප්‍රංශය | 2015.11.30 – 2015.12.13 | 14 | 922899.6 | 69652.8 | 89900 | 4368 | 1086820.4 | විදේශ ගමන් වියදම් | |
| එම්.ඒ.බී. දයා සෙනරත් මහතා | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය | කසළ කළමනාකරණ ව්‍යාපෘති පිළිබඳ අධ්‍යයන වැඩ සටහන | දකුණු කොරියාව | 2016.04.03 - 2016.04.10 | 7 | | 35167.2 | | 15745.5 | 50912.7 | විදේශ ගමන් වියදම් | ජී.සුරනිමල පෙරේ මහතා |
| ජේ.එම්.සී. ජයන්ති විජේතුංග මහත්මිය | ප්‍රධාන ලේකම් | තිරසාර සංවර්ධන ඉලක්ක කරා එළැඹීමේ දී පළාත් පාලන ආයතන සඳහා ක්‍රමෝපායික සැලසුම් සකස් කිරීම | දකුණු අප්‍රිකාව | 2016.05.09 – 2016.05.14 | 5 | 297550 | 41248 | 235000 | 49700 | 623498 | විදේශ ගමන් වියදම් | වන්ද්‍රානි සමරකෝ මහත්මිය, පාලිත අබේවර්ධන මහතා |
| එම්.ඒ.බී. දයා සෙනරත් මහතා | ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය | අධ්‍යයන/පුහුණු විදේශ සංචාරයක් සඳහා | රුසියාව හා පින්ලන්තය | 2016.08.09 – 2016.08.18 | 9 | 225568 | 48640 | | 366250 | 640458 | විදේශ ගමන් වියදම් | පී. සෝමසිරි මහතා<br>කේ.එච්.ඩී.කේ. සමරකෝන් මහතා<br>එම්.ඒ.බී. දයා සෙන මහතා<br>ආර්.ඒ. දීප්ති විජේ මහතා |
| එන්. නිල්වල මහතා | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය | තිරසාර සංවර්ධනය උදෙසා වන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලයේ (nrg4SD) දකුණු කලාපීය පළාත් රාජ්‍යයන් සඳහා සම සභාපති/සම්බන්ධීකාරක වශයෙන් සහභාගිවීම | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | 8 | 470400 | 47040 | 152600 | 4624.91 | 674664.91 | විදේශ ගමන් වියදම් | |
| ටී.වී.ඩී. දමයන්ති එස්. කරුණාරත්න මහත්මිය | ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | තිරසාර සංවර්ධනය උදෙසා වන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලයේ (nrg4SD) දකුණු කලාපීය පළාත් රාජ්‍යයන් සඳහා සම සභාපති/සම්බන්ධීකාරක වශයෙන් සහභාගිවීම | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | 8 | 470400 | 47040 | 152600 | 4624.91 | 674664.91 | විදේශ ගමන් වියදම් | |

ආ. i ඔව්.

| නම | තනතුර | වාර ගණන |
|---|---|---|
| ඒ.ආර්. ඉසුර දේවප්‍රිය මැතිතුමා | ගරු ප්‍රධාන අමාත්‍ය | 02 |
| එම්. සුමිත්ලාල් මැන්දිස් මැතිතුමා | ගරු සෞඛ්‍ය අමාත්‍ය | 01 |
| ගාමිණී තිලකසිරි මැතිතුමා | ගරු කෘෂිකර්ම අමාත්‍ය | 01 |

iii.

| නම | විදේශගත වූ රටවල් | කාල සීමාව | දින ගණන |
|---|---|---|---|
| ඒ.ආර්. ඉසුර දේවප්‍රිය මැතිතුමා | චීනය | 2016.03.01 – 2016.03.06 | 05 |
| | දකුණු අප්‍රිකාව | 2016.05.09 – 2016.05.19 | 10 |
| එම්. සුමිත්ලාල් මැන්දිස් මැතිතුමා | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | 09 |
| ගාමිණී තිලකසිරි මැතිතුමා | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | 09 |

iv. ඉහත iii පිළිතුරෙහි දක්වා ඇත.

v. මෙම ගරු අමාත්‍යවරුන් පුහුණු වැඩ සටහන් සඳහා සහභාගී වීම මගින් ලබා ගන්නා දැනුම හා කුසලතා පළාත් සභාව මගින් වඩාත් ඵලදායී ලෙස මහජනතාව වෙත ලබා දීම සඳහා උපකාරී වී ඇත.

vi. ඇමුණුම 01 හි දක්වා ඇත.

vii. ගරු ප්‍රධාන අමාත්‍යතුමන් වෙත හා ගරු අමාත්‍යවරුන් වෙත වෙන් වී ඇති වැය ශීර්ෂවලින්.

viii. ඇමුණුම 01 හි දක්වා ඇත.

**ආ. Vi හා viii ට අදාළ ඇමුණුම 01**

**ගරු ප්‍රධාන අමාත්‍යතුමන් ඇතුළු වර්තමාන අමාත්‍ය මණ්ඩලය පළාත් සභා අරමුදල් මගින් වියදම් දරා විදේශ ගතවීම**

| නම | තනතුර | වැඩ සටහන | රට | කාලසීමාව | වියදම | වැය ශීර්ෂය | සහභාගි වූ වෙනත් අය | | | බස්නාහිර පළාත් සභාව ලද ප්‍රතිලාභ |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | නම | වියදම | තෝරාගත් ආකාරය | |
| ඒ.ආර්. ඉසුර දේවප්‍රිය මැතිතුමා | ගරු ප්‍රධාන අමාත්‍ය | සමූපකාර ව්‍යාපාර හා බැංකු කටයුතු පිළිබඳ විදේශ අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන | චීනය | 2016.03.01 – 2016.03.06 | රු.546,774.75 | ගරු ප්‍රධාන අමාත්‍යතුමන් වෙත වෙන් වී ඇති වැය ශීර්ෂය | නිරාජ් ප්‍රියශාන්ත මලවිආරච්චි මහතා - ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ මහජන සම්බන්ධතා නිලධාරී | නැත | ගරු ප්‍රධාන අමාත්‍යතුමන්ගේ සමූපකාර විෂයය සම්බන්ධයෙන් කටයුතු කරන නිලධාරියා වශයෙන් | බස්නාහිර පළාතේ සමූපකාර ව්‍යාපාර හා බැංකු කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ලැබුණ අත්දැකීම්, විශේෂයෙන් කුඩා ව්‍යාපාර ඇරඹීම සඳහා සමූපකාර සංගම්වල ඇති ශක්‍යතාවය සහ සුළු මූල්‍ය බැංකු කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් ලද අත්දැකීම්. |
| ඒ.ආර්. ඉසුර දේවප්‍රිය මැතිතුමා | ගරු ප්‍රධාන අමාත්‍ය | තිරසාර සංවර්ධන ඉලක්ක කරා එළැඹීමේදී පළාත් පාලන ආයතන සඳහා ක්‍රමෝපායික සැලසුම් සකස් කිරීමේ වැඩ සටහන | දකුණු අප්‍රිකාව | 2016.05.09 - 2016.05.19 | රු.573,905.80 | ගරු ප්‍රධාන අමාත්‍යතුමන් වෙත වෙන් වී ඇති වැය ශීර්ෂය | චන්ද්‍රානි සමරකෝන් මිය<br>පාලිත අබේවර්ධන මයා - නීති නිලධාරී | රු.541,706.00<br>රු.497,516.00 | සහභාගි වන්නන් ගරු ප්‍රධාන අමාත්‍යතුමන් විසින් තෝරා ගන්නා ලදී. | බලය බෙදුන ඒකක වල නාගරික සහ ප්‍රාදේශීය සැලසුම්කරණයේදී දකුණු අප්‍රිකානු අත්දැකීම් ලබා ගැනීම/දකුණු අප්‍රිකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ අත්දැකීම් ලබා ගැනීම |
| එම්. සුමිත්ලාල් මැන්දිස් මැතිතුමා | ගරු සෞඛ්‍ය අමාත්‍ය | තිරසාර සංවර්ධනය උදෙසා වන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලයේ (nrg4SD) වාර්ෂික මහා රැස්වීම | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | රු.823,793.10 | ගරු අමාත්‍යතුමන් වෙත වෙන් වී ඇති වැය ශීර්ෂය | එන්. නීල්වල මහතා - කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් | | | |
| ගාමිණී තිලකසිරි මැතිතුමා | ගරු කෘෂිකර්ම අමාත්‍ය | තිරසාර සංවර්ධනය උදෙසා වන පළාත් රාජ්‍යයන්ගේ එකමුතු ජාලයේ (nrg4SD) වාර්ෂික මහා රැස්වීම | ස්පාඤ්ඤය | 2016.06.26 – 2016.07.04 | රු.825,194.54 | ගරු ඇමතිතුමන් විසින් දීමනා ගැන සඳහන් කර නොමැත. | | | | |

## 02.

**කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/vi(1)/16/72)**

අ. i වර්ෂ 2009 සිට 2016 ජුනි දක්වා කාලය තුළ වසා දැමූ සහ පාඩු ලැබූ සමූපකාර ප්‍රාදේශීක/ග්‍රාමීය බැංකු/සුපිරි වෙළඳසැල් ආදිය වසා දැමීමට හේතු වූ කරුණු සොයා බැලීමට යම් ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද?

ii. ඒ කුමන ක්‍රියා මාර්ගයක්ද?

iii. අනාවරණය කරගත් හේතු මොනවාද?

iv. එම අනාවරණය කරගත් හේතු මත ගෙන ඇති පියවර කුමක්ද?

ආ. ඉහත ප්‍රශ්න අංක "අ"(i) හි සඳහන් එකී ආයතනයන් අතුරෙන් සමූපකාර ප්‍රඥප්තියට සහ රිතීන්ට අනුව විමර්ශනය සඳහා පරීක්ෂණ ආරම්භ කර ඇති ආයතන ගණන කීයද? ඒ මොනවාද?

ඇ. i මෙම වර්ෂයේ නිරීක්ෂණයන් අනුව වසා දැමීමට යෝජිත, ප්‍රාදේශීක/බැංකු/සුපිරි වෙළඳසැල් තිබේද? ඒ මොනවාද?

ii. එම හඳුනාගත් ආයතන යථා තත්ත්වයට පත් කිරීමට නොහැකි නම් එසේ වීමට හේතු මොනවාද?

iii. ඒ සඳහා වගකිව යුතු අය සම්බන්ධයෙන් ගෙන ඇති සහ ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මොනවාද?

iv. එම හඳුනාගත් පුද්ගලයන්, නම් සහ තනතුරු වශයෙන් කවුරුන්ද?

ඈ. i ඉහත වගකිවයුතු නිලධාරීන්/සේවකයන් සම්බන්ධයෙන් රටේ පොදු නීතිය අනුව කටයුතු කර තිබේද? ඒ කවුරුන් සම්බන්ධයෙන්ද?

ii. එසේ ක්‍රියාකර නොමැති නම් එයට හේතු මොනවාද?

**ගරු ලලිත් වනිගරත්න - අමාත්‍යතුමා**
Hon. Lalith Wanigaratna - Minister

අ. i ඔව්.

ii.

- මාසිකව පවත්වනු ලබන සාමාන්‍යාධිකාරී හා බැංකු සේවා සමුළු සඳහා F 28 සමාලෝචනය සඳහා සමිති සතු සියලු වෙළඳසැල් පිළිබඳ මාසික ප්‍රගති වාර්තා ගෙන්වා ගැනීම.
- මෙම සමූපකාර සමිතිවල තොරතුරු සමූපකාර සංවර්ධන නිලධාරීන් වෙතින් ලබා ගැනීම.
- මෙම සමූපකාර සමිතිවල ස්ථානීය පරීක්ෂණය සිදු කරමින් තොරතුරු ලබා ගැනීම.

iii.

- සමෘද්ධි වෙළඳාම අහිමි වීම.
- සමිතිවල මූල්‍ය දුෂ්කරතා පැවතීමත් භාණ්ඩ සැපයීම දුර්වල වීම.
- නුපුහුණු සේවක මණ්ඩල සමග කටයුතු කිරීමට සිදුවීම.
- ඇතැම් සමිතිවල අක්‍රමිකතා සිදුවීම.
- වෙළඳපොළ තරගකාරීත්වයට මුහුණ දීමට නොහැකි වීම.
- ප්‍රාදේශික පවත්වාගෙන යාමට ප්‍රමාණවත් වෙළඳාමක් කර ගැනීමට නොහැකි වීම තුළින් ප්‍රාදේශික දිගින් දිගටම පාඩු ලැබීම.
- රාත්‍රී කාලයේ වෙළඳසැල් විවෘතව පවත්වාගෙන යාමට නොහැකි වීම.

iv.

- අයිරා පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලබා දීම.
- සාමාන්‍යාධිකාරී සමුළුවලදී ප්‍රගති සමාලෝචන සිදු කරමින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳ උපදෙස් ලබා දීම.
- සමිති කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීම.

- අක්‍රමිකතා සම්බන්ධයෙන් 47 වගන්තිය යටතේ පරීක්ෂණ පැවැත්වීම.
- සමිතිවලට ගොස් පවතින තත්ත්වය විශ්ලේෂණය කර අනුගමනය කළ යුතු විකල්ප උපාය මාර්ග පිළිබඳව දැනුවත් කිරීම.
- සමිති භාර නිලධාරීන් මගින් අඩුපාඩු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම.

ආ. විවිධ සේවා සමුපකාර සමිති 14 කි.

1. සී/ස මීගමුව වි.සේ.ස. සමිතිය
2. සී/ස බියගම වි.සේ.ස. සමිතිය
3. සී/ස බණ්ඩාරගම වි.සේ.ස. සමිතිය
4. සී/ස මතුගම වි.සේ.ස. සමිතිය
5. සී/ස හේවාගම් කෝරළයේ නැගෙනහිර වි.සේ.ස. සමිතිය
6. සී/ස හේවාගම් කෝරළයේ බටහිර වි.සේ.ස. සමිතිය
7. සී/ස අත්තනගල්ල වි.සේ.ස. සමිතිය
8. සී/ස දෙහිවල ගල්කිස්ස වි.සේ.ස. සමිතිය
9. සී/ස දළුගම වි.සේ.ස. සමිතිය
10. සී/ස පිළියන්දල වි.සේ.ස. සමිතිය
11. සී/ස මීරිගම වි.සේ.ස. සමිතිය
12. සී/ස වත්තල වි.සේ.ස. සමිතිය
13. සී/ස දොම්පෙ - පූගොඩ වි.සේ.ස. සමිතිය
14. සී/ස කොලොන්නාව වි.සේ.ස. සමිතිය

ඇ. තවදුරටත් පාඩු ලබන ඒකක පවතින අතර, එම ඒකක සම්බන්ධයෙන් තොරතුරු රැස් කරමින් හා තොරතුරු විශ්ලේෂණය කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට අපේක්ෂිතය.

ඈ. තවදුරටත් පාඩු ලබන ඒකක පවතින අතර, එම ඒකක සම්බන්ධයෙන් තොරතුරු රැස් කරමින් හා තොරතුරු විශ්ලේෂණය කරමින් පවතින අතර, ඒ අනුව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට අපේක්ෂිතය.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මගේ "අ" ප්‍රශ්නයේ දෙවන කොටසට සහ තුන්වැනි කොටසට දුන්නු උත්තරය අනුව එහි හතර වන කොටසේ තිබෙන්නේ, අනාවරණය කරගත් හේතු මත ගෙන ඇති පියවර කියන එක. ඔබතුමා සෑහීමකට පත් වෙනවාද "අ"ප්‍රශ්නයේ දෙක සහ තුන කොටස්වලින් අනාවරණය කර ගත්තු හේතුවලට. ඒවා මැඩ පවත්වන්න ගෙන ඇති පියවර විධියට ඔබතුමා සඳහන් කළ කාරණා මගින් මේ තිබෙන බරපතළ තත්ත්වය මඩින්න පුළුවන් කියලා ඔබතුමා විශ්වාස කරනවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, දැනට අපි ඒ පිළිබඳව සාකච්ඡා කරමින් යනවා, සභාපතිවරු සහ සාමාන්‍යාධිකාරීවරු ගෙන්නලා. මොකද, පසුගිය කාලයේ ඔය ප්‍රාදේශික සියල්ලක්ම වාගේ වැහිලා තිබුණා. ඒ වාගේම අපි දන්නවා, විශේෂයෙන්ම ප්‍රාදේශිකවලින් ලොකු ලාභයක් ලබා ගන්න බැහැ. ඒ නිසා වෙනත් ක්‍රියා මාර්ග, වෙනත් ව්‍යාපෘති ආරම්භ කරලා මම හිතන්නේ සමුපකාර සමිතිවල ආදායම වැඩි කරන්න, අපි දැන්ටමත් කටයුතු කරගෙන යනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, එතුමා මගේ ප්‍රශ්නයේ "ඈ" කොටසට උත්තරයක් දුන්නේ නැහැ. නමුත් මගේ අතුරු ප්‍රශ්නයක් විධියට උත්තරය කියන්න. "ඈ" කොටසේ සඳහන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මේ වනකොට අරගෙන තිබෙන ක්‍රියා මාර්ග මොනවාද කියලා.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

"ඈ" ප්‍රශ්නයෙන් කියන්නේ, මෙම වර්ෂයේ නිරීක්ෂණයන් අනුව වසා දැමීමට යෝජිත, ප්‍රාදේශීක/බැංකු/සුපිරි වෙළඳසැල් තිබේද? ඒ මොනවාද? කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

"ඈ" කොටසේ කියන්නේ, ඉහත වගකිවයුතු නිලධාරීන්/සේවකයන් සම්බන්ධයෙන් රටේ පොදු නීතිය අනුව කටයුතු කර තිබේද? ඒ කවුරුන් සම්බන්ධයෙන්ද? කියන එක සහ ඒ සම්බන්ධයෙන් ගෙන නොමැති නම් හේතු කියන එක. රටේ පොදු නීතිය අනුව මම කියන්නේ. මහජන දේපළ වංචා කිරීම කියන චෝදනාව යටතේ කීදෙනෙක් සම්බන්ධයෙන් ක්‍රියා කරලා තිබෙනවාද කියලා. සමුපකාරය කියන්නේ පොදු දේපළ පනතට යටත් වන දේපළක්.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, දැනට නීතිමය කටයුතුවලට යොමු කරලා තිබෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය කියෙව්වා නම් හරි. උත්තරය ප්‍රමාණවත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට අවස්ථාවක් දෙමු. ඊළඟ පාර එතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අවසන් අතුරු ප්‍රශ්නය. 2009 ඉඳලා මේ වනකල් මම ඔබතුමාගෙන් අවස්ථා කිහිපයකදී අහලා තිබෙනවා. අද ඒ අවසාන ප්‍රශ්නයට පිළිතුරු හම්බ වුණා. ඔබතුමා පිළිගන්නවාද 2009 ඉඳලා ක්‍රමිකව මේ සමුපකාර ක්ෂේත්‍රය බිංදුවටම වැටිලා තිබෙනවා. දැන් ඔබතුමාගේ කාල සීමාවේ මේක නඟා සිටුවන්නට යම් කමිටුවක් පත් කරලා, මේ ප්‍රශ්නයක් නිසා නීති සංශෝධනය කරලා, මේ ක්‍රමය ඉදිරියට වෙනස් කළ යුතුයි කියලා ඔබ විශ්වාස කරනවා නම්, අරගෙන තිබෙන ක්‍රියා මොනවාද?

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

ගරු සභාපතිතුමනි, අපේ මන්ත්‍රීතුමාගේ මේ ප්‍රශ්නය පිළිබඳව අපි අවධානය යොමු කළා. විශේෂයෙන්ම ඉදිරියේදී කමිටුවක් පිහිටුවලා, නිතීඥ මහත්මයෙක් නිසා එතුමාවත් ඒ කමිටුවට දාලා ඉදිරි වැඩ කටයුතු සාර්ථකව කර ගන්න බලාපොරොත්තු වෙනවා. පසුගිය කාලයේ නොයෙකුත් අක්‍රමිකතා සිද්ධ වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි එතුමාට අවස්ථාව දෙමු. න්‍යාය පත්‍රයේ ප්‍රශ්න අංක 03 යටතේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

04 වන ප්‍රශ්නය. ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට යොමු කිරීමට මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා සභාවේ නැහැ.

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා) [ අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් ]
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.) [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, දැනුම් දීලා නැහැ. නමුත් සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් 05 වන ප්‍රශ්නය. ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ඔය ඉන්නේ මහ ඇමැතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොහේද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔය ඉන්නේ මහ ඇමැතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්න අහලා තියෙන්නේ අධ්‍යාපන ඇමැතිතුමාගෙන්.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, එතුමා විහිළුවක් කරන්න ඇත්තේ. එම ප්‍රශ්නය සඳහාත් සති දෙක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ගරු ඇමැතිවරුන්ට නියෝග පනවන්න යන්නේ නැහැ. නමුත් ගරු ඇමැතිතුමන්ලා දැන ගන්න ඕනෑ මේ සභාව මාසයට දවස් දෙකයි තියෙන්නේ. සියලු වැඩ කටයුතු කල් දාලා ඇමැතිවරු සභාවට එන්න ඕනෑ. මේ සභාවේ හරි වැරැදි වැඩක් වෙන්නේ. මන්ත්‍රීවරු ප්‍රශ්න අහනවා. අධ්‍යාපනය ගැන ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

න්‍යාය පත්‍රයේ ප්‍රශ්න අංක 06 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු අධ්‍යාපන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා [අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Gamini Thilakasiri - Minister [On Behalf of Minister of Education]

ගරු සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පසුගිය සභාවේදී මම සභාව කල් තබන අවස්ථාවේදී යොමු කළ ප්‍රශ්නයකට අද විස්තරාත්මක පිළිතුරක් ලබා දෙන්නම් කියලා ගරු ප්‍රවාහන ඇමැතිතුමා පොරොන්දු වුණා. මට ඒකකට අද පිළිතුරක් දෙනවාද කියලා දැන ගන්න පුළුවන්ද? සභාව කල් තබන අවස්ථාවේ යොමු කළ ප්‍රශ්නයට මේ සභාවේදී පිළිතුරක් දෙනවා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා සූදානම්ද ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම හිතන්නේ එතුමාට මතක නැහැ වාගේ.

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා
Hon. Lalith Wanigaratna - Minister

සූදානම් නැහැ. ලබන සභා වාරයේදී කොහොම හරි පිළිතුරු දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බොහොම ස්තුතියි.

# නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, *"ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මාස දෙකක කාලයක් සඳහා නිවාඩු අනුමත කර දෙන ලෙස ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

ගරු සභාපතිතුමනි, *"විජිත් ප්‍රියන්ත සිල්වා ගරු මන්ත්‍රීතුමාට මාස දෙකක කාලයක් සඳහා නිවාඩු අනුමත කර දෙන මෙන් ඉල්ලා සිටිනවා."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ සභාවේ කටයුතු කරගෙන යන්න බැරි තරමේ මන්ත්‍රීවරයෙක් ගැන රීති ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය හැන්සාඩ් වාර්තාවේ 2409 තීරුව සහ 2411 තීරුවේ. ඒ වාගේම එම හැන්සාඩ් වාර්තාවේම 2340 තීරුවේ. මම පසුගිය අවස්ථාවකදී රීති ප්‍රශ්නයක් නැඟුවා. බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් අප විසින් යොමු කරන ලද මාර්ග සංවර්ධන මුදල් සම්බන්ධයෙන් අයථා ක්‍රියා මාර්ගයක්, නීති විරෝධී ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවා කියලා. හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. ඒ අවස්ථාවේදී ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් මගේ වරප්‍රසාද ප්‍රශ්නයට උත්තර දුන්නා. මම දිසාපතිතුමා මගින් ඒකට අවශ්‍ය කටයුතු කරනවා කියලා. මම ඊයේ දවසේ නැවත වතාවක් බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්ට කථා කළා. මගේ ව්‍යාපෘති අනුමත වෙලා ඇවිල්ලා දැන් මාස 04 කට වැඩියි. අද වනකල් මේ බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම්තුමිය මේ ව්‍යාපෘති කරන්න දෙන්නේ නැහැ. මම ඊයේ කථා කළාට පස්සෙත් මේ නීතියේ නැති, වැල් වටාරම් විකාර ගොඩක් කියලා ලක්ෂ 05 ඇස්තමේන්තුවට 5% ක ශ්‍රම දායකත්වයක් එකතු කරලා කොන්ත්‍රාත් කරන සමිතියට එන්නය කියලා කියනවා. ඒ ශ්‍රම දායකත්වයේ කොටස කරන්නය කියලා. දැන් කිසිම සමිතියක් කැමැති නැහැ. ලක්ෂ 05 ව්‍යාපෘතියට 525,000 ක වැඩ කරන්න කියලා කියනවා. මම කථා කරලා ඇහුවාට පස්සේ කියනවා, සමිතියෙන් ලියුමක් දෙන්නය කියලා. 5% කරන්න බැහැයි කියලා. මම කිව්වාම සමිතිය එහෙම ලියුම් දෙන්න කැමැති නැහැ කියලා. මේවා මේ කොන්ත්‍රාත්කාරයෝ කරන්නේ. සමිති නොවෙයි කරන්නේ කියලා කියනවා. මම කිව්වා, ඒ වැඩේ ඔබතුමාට අදාළ නැහැ. රටේ මහ තැනින් අරගෙන ඇවිල්ලා තිබෙන තීන්දු ක්‍රියාත්මක කරන්න විතරයි තියෙන්නේ කියලා. ඒ නිසා ගරු සභාපතිතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා, ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට 36 (1) යටතේ ප්‍රශ්නය යොමු කරන්නේ. බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම්තුමිය එතුමාගේ ව්‍යාපෘති කරන්නේ නැහැලු. දැන් මාස හතරක් තිස්සේ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මගේ විතරක් නොවෙයි. මම හිතන්නේ දැන් රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමාගේ ව්‍යාපෘතිවල දැන් ක්‍රියාත්මක බලධාරියා වෙනස් කරන්න යැව්වා. ප්‍රධාන ලේකම් ලියුමක් එවලා තිබෙනවා, කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සම්බන්ධයෙන් ගත්තු තීරණයක් ගැන. මේ විධියට වැඩ කරන්න බැහැ. එක්කෝ ඒ ප්‍රාදේශීය ලේකම්තුමියව දැනුවත් කරන්න භාර ගත්තු විධියට භාර අරගෙන, මේ වැඩේ කරන්න. නැත්නම් අපේ සල්ලි අපරාදේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පැහැදිලියි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට පළාත් පාලන ආයතනවලට සල්ලි දාන්න පුළුවන්. පළාත් පාලන ආයතනවලට දැම්මා නම් ඒකේ වගකීම අපට ගන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් අපේ Control එකේ නොවෙයි ඉන්නේ. එයා මධ්‍යම රජයේ ඉන්නේ. නමුත් රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමා කිව්වාම, මම ඒ ගැන මැදිහත් වුණා. එතකොට එතුමිය කිව්වා, ඒක අයින් කරලා කරන්නම් කියලා. මට පොරොන්දු වුණා. නමුත් මම මේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ට කියන්නේ, අපේ පළාත් සභාවේ සල්ලි දාලා නගර සභාවට යැව්වොත් ඒකේ වගකීම අපට කෙලින්ම ගන්න පුළුවන්. ඒ නිසා මම හිතන්නේ නැහැ තවදුරටත් මේ පළාත් සභාවේ මන්ත්‍රීවරු නගර සභාවලට නොදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට දාන එකේ තේරුමක් තිබෙනවා කියලා. එතුමා කියන කථාව ඇත්ත. නමුත් මම මැදිහත් වුණා. එතුමිය පොරොන්දු වුණා කරනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඊළඟ සැරේ ඕක කරයි. නමුත් ප්‍රාදේශීය ලේකම්ට බලයක් නැහැ, එයාගේ හිතේ තියෙන ලෝකේ තනන්න

ව්‍යාපෘතිවලට ඕනෑ ඕනෑ විධියට ඇස්තමේන්තුවලට එකතු කරන්න. එයා හිතාගෙන ඉන්න ලෝකය තනන්න ගෘහය ඇතුළේ විතරයි පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් පැහැදිලියි. ඔබතුමාට දැන් එතුමා පොරොන්දුවක් දුන්නා නේ? සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සභාව කල් තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්නයට ගරු ප්‍රවාහන ඇමැතිතුමා උත්තරයක් දීලා තිබෙනවා. ඔබතුමා ඒක දකින්නේ නැතුව ඇති.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නැහැ, නැහැ. ගරු සභාපතිතුමනි, මම එතැනදී ඊට අදාළව ප්‍රශ්නයක් ඇහුවා. එතකොට අපේ ඇමැතිතුමා කිව්වා, ඒ ගැන මට දැන් උත්තරයක් දෙන්න බැහැ. ඒ පිළිබඳව සොයා බලා උත්තරයක් දෙනවා කියලා. මම ඒක ගැනයි මතු කළේ. එදා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ හිටියේ. මගේ ප්‍රශ්නය වුණේ මා ළඟ පළාත් සභා හයක ලොග් සටහන් තිබෙනවා. ඒ පළාත් සභා හය තමයි වයඹ පළාත, මධ්‍යම පළාත, උතුරු මැද පළාත, ඌව පළාත, දකුණු පළාත සහ නැගෙනහිර පළාත. මේ සෑම තැනකම ලොග් සටහන් පත්‍ර නිකුත් කරන්නේ සහ අය කිරීම් කරන්නේ පළාත් සභාවේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියයි. ප්‍රශ්නය තිබෙන්නේ මේ කොළඹ විතරක්, බස්නාහිර පළාතේ විතරක් ඇයි මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ප්‍රශ්නය හැන්සාඩ් ගත වෙලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊට පස්සේ ඇමැතිතුමා කියනවා ගරු සභාපතිතුමනි, ඔබතුමා බලන්න. මේකට විධිමත් පිළිතුරක් ලබන සභා වාරයේදී ලබා දෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙහෙමයි ගරු මන්ත්‍රීතුමා ඔබතුමා අතුරු ප්‍රශ්නයක් අහලා තිබෙන්නේ. ඒකට උත්තරය ලැහැස්ති නැහැ. එතුමා ඒකයි කිව්වේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සමාවෙන්න. සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්නයට අහපු අතුරු ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගෙ ප්‍රකාශ. මම කලිනුත් සඳහන් කළා. අතුරු ප්‍රශ්න සඳහා ගරු ඇමැතිවරුන් පිළිතුරු ලැහැස්ති කරගෙන ඉන්නවා නම්, ඒවාටත් මේ අවස්ථාවේදී උත්තර දෙන්න පුළුවන්. සභාව කල් තබන අවස්ථාවේ මන්ත්‍රීවරයෙක් ප්‍රශ්නයක් යොමු කළා නම්, මේ අවස්ථාවේ ඒකටත් උත්තර දෙන්න පුළුවන්.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කොළඹ දිස්ත්‍රික්කයේ පාසල්වල ඇති ගැටළු පිළිබඳව අදහස් දැක්වීමට එම්.එස්.එම්. ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් ලබා දෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම මට මේ අවස්ථාව ලබා දීම ගැන, මම ස්තුතිවන්ත වෙනවා. අපේ දූ දරුවන්ගේ ලොකු ප්‍රශ්නයක් මතු වෙලා තියෙන්නේ. කොළඹ අවට තිබෙන පාසල්වල. විශේෂයෙන් ක්ලිෆ්ටන් බාලිකා විදුහල. අවුරුදු 150 කට වැඩිය පරණ විදුහලක්. බාලිකා විදුහල්වලින් කොළඹ ඉල්ලීම් තිබෙන විදුහලක්. ළමයින් එක්දහස් දෙසිය ගණනක් අධ්‍යාපනය ලබන විදුහලේ 2014 73% ක් හොඳම ප්‍රතිඵල ගත්තු විදුහලක්. 2015 දී 70% ට වැඩිය හොඳම ප්‍රතිඵල ගත්තු පාසලක, 86 තට්ටු තුනක දාපු පන්ති කාමර ටික අද කඩාගෙන වැටිලා තිබෙනවා. 96 හදපු බිල්ඩිම ළඟම තිබෙන බිල්ඩිමක්. දැන් ඒකත් පුපුරලා. ඒකෙත් ළමයින්ට අධ්‍යාපන කටයුතු කරන්න බැරි තත්ත්වයට වැටිලා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, මට අද හරි කනගාටුයි මෙතැන අධ්‍යාපන ඇමැතිතුමා නැති එක ගැන. මේක ඉස්කෝලේ ළඟම තිබෙන ගොඩනැගිල්ලක්. ඔබතුමා දන්නවා. මේ සභාවේ ඉන්න හැම කෙනෙක්ම දන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. අධ්‍යාපන අමාත්‍යාංශයේ කවුරු හරි නිලධාරි මහත්මයෙක් ඇවිල්ලා ඉන්නවාද? ඉන්නවා නේද? ලේකම්තුමා එතැන ඉන්නවා. මම හිතන්නේ එතුමා වාර්තා කරයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේක කොළඹ අවට තිබෙන ලොකුම ප්‍රශ්නයක්. අද අපි දන්නවා, කොළඹ ඉඩම්වල වටිනාකම. ගෙවල් 200 ක් විතර වට කරලා තිබෙන තැනක්. මේක ක්ලිෆ්ටන් විද්‍යාලයට ගන්න කියලා අපි බලාපොරොත්තුවෙන් තිබුණු තැනක්. දේශපාලන වාසි අරගෙන හිටපු නගාරාධිපතිතුමාගේ පුතා, ඒ ඉඩම අරගෙන තට්ටු 15 ක විශාල නිවාස සංකීර්ණයක් හදනවා. ඒක හදන්න කලින් කල්පනා කරන්න ඕනෑ අහලා පහල මිනිස්සුන්ගේ ජීවිත ගැන. එක පැත්තක ලොකු පන්සලක් තිබෙනවා. මේ පැත්තේ ක්ලිෆ්ටන් බාලිකා විදුහල. අද විදුහලේ තත්ත්වය උසස් පෙළ ඉගෙන ගන්න ළමයින්ට පන්ති කාමරයේ වාඩි වෙලා ඉගෙන ගන්න බැහැ. ළමයි ඕක්කෝම පාරේ ඉන්නේ. 96 හදපු බිල්ඩිම අද කඩාගෙන වැටෙන තත්ත්වයට ගිහිල්ලා තියෙන්නේ. බස්නාහිර පළාත් සභාව වෙනුවෙන් මෙතැන ඉන්න අධ්‍යාපන ඇමැතිතුමාට වගකීමක් තිබෙනවා, මේ ගැන හොයලා බලන්න. ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමැතිතුමාටත් මේ ගැන වගකීමක් තිබෙනවා. ඒ කියන්නේ පළාත් පාලන ඇමැතිතුමා වශයෙන් මහ ඇමැතිතුමා - ඒ අය Plan එකක් නගර සභාවෙන් පාස් කරන කොට කවුද මේකට අනුමැතිය දුන්නේ? ගෙවල් 290 ක් දාන්න සුදුසු තැනක් නොවෙයි මේක. මේක සුදුසු තැනක් නොවෙයි. දැනට ඇවිල්ලා Pile කරලා තියෙන්නේ 20% යි. තව 80% ක් එතැන Pile කරන්න තිබෙනවා. එතැන 80% ක් Pile කරන කොට එතැන ගෙවල් ටිකක් නොවෙයි. ඉස්කෝලය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටෙනවා. මම විතරක් නොවෙයි. මගේ මිත්‍ර සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් ගිහිල්ලා එතැන නිරීක්ෂණය කළා. මම ගිහිල්ලා බැලුවාම මගේ ඇස් දෙකට කඳුළුත් ආවා. කොළඹ තිබෙන විදුහල්. ගොඩනැගිලි ටික හදන්න බැරි තත්ත්වයට අපි වැටිලා තිබෙනවා. තිබෙන හොඳම ගොඩනැගිලි දෙක. අද වෙලා තිබෙන තත්ත්වය ගිහිල්ලා බලන්න ඕනෑ. මම එදා අධ්‍යාපන ඇමැතිතුමාට මේ ගැන කිව්වා. ගරු අධ්‍යාපන ඇමැතිතුමනි, මේක පොඩ්ඩක් ඔළුවට ගන්න. මේ වාගේ වුණා නම්, මේක ෆාතිමා බාලිකා විදුහලට වුණේ මාස 06 කට කලින්. අපි ෆාතිමා බාලිකා විදුහලට ගොඩනැගිල්ලක් හදලා දුන්නා. ෆවුසි ඇමැතිතුමාගේ ක්‍රියා මාර්ගයෙන්. සැම් ජෙම් හාජ්ජියාර් මගින්. තට්ටු හතරක ලස්සන ගොඩනැගිල්ලක්. ඒ ළඟ තිබෙන ඉඩමත් අපි ගන්න කියලා ලැහැස්ති වුණා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගෙන් ලිඛිතවත් ඉල්ලුවා. ඒ ඉඩම අපට අරන් දෙන්න කියලා. ඒක දැනගත්තු ගමන් අපේ දේශපාලඥයෝ මොනවාද කරන්නේ? අර ඉඩමට ගිහිල්ලා ඒ අයට කියනවා මේ ඉඩම ඉස්කෝලයට යනවා. මේක අපි ගන්නම්. කවුරු හරි එක්කෙනෙක් මුක්කුවට දාලා, ඒක ඉස්කෝලයට ගන්න දෙන්නේ නැහැ. පෞද්ගලික උවමනාවට ඒ බිල්ඩින් එක ගන්නවා. අරගෙන එතැන ගෙවල් 120 ක්. තට්ටු 12 ක තට්ටු නිවාසයක් හදනවා. මේ සභාවේ මම මේ ගැන කෑගැහුවා. මේක අපි බලන්න ඕනෑ. මේක අපි අතහැරලා දාලා ඉන්න බැහැ. මේ අපේ ළමයින්ගේ දේවල්. අපේ ළමයි පාසල්වල ඉගෙන ගන්නේ. කොළඹ තිබෙන හොඳම පාසල් තුන. ළමයි ටික ඉස්කෝලේ දාන්න අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලන්න කොපමණ දුක් වින්දාද? අද තිබෙන තත්ත්වය, ක්ල්ෆ්ටන් ඉස්කෝලයට ළමයෙක් දැම්මාට අර ඉන්න ළමයි ටික එළියට තල්ලු කරන්න කල්පනා කරනවා. මහින්ද විද්‍යාලයට දාගන්න ප්ලෑන් කරන්නේ. එතැන ඉස්කෝලේ නැති කරන්න බලනවා. මේක හරි අපරාධයක්. හෙන ගහන අපරාධයක් මේ කරන්නේ?

ගරු සභාපතිතුමනි, මේ ගැන ඇහුම්කන් දෙන්න. මම කෑගහලා කිව්වාට මේක විහිළුවට ගන්න එපා. මම මේ සභාවේ කථා කරන්න පටන් ගත්තාම මම ඇත්ත කථා කරන්නේ. මං ඇවිල්ලා කාටවත් සල්ලි දීලා ගන්න බැරි මනුස්සයෙක්. මේක අපි තේරුම් ගන්න ඕනෑ. අපි මාසයකට දවස් දෙකක් මෙතැනට ඇවිල්ලා වාඩි වෙලා බජව් දාලා ගියාට වැඩක් නැහැ. මේ ගැන අපි හොයන්න ඕනෑ. මොකක්ද වෙන්නේ? එදා මම අධ්‍යාපන ඇමැතිතුමාට කියන කොට එතුමා කිව්වා, මේක උසාවියේ තිබෙන එකක් කියලා. කවුද මේ උසාවියේ නඩු දැම්මේ? අහල පහළ ඉන්න මිනිස්සු ගිහිල්ලා නඩු දැම්මේ. අපි සභාවක් වශයෙන් මොනවාද කළේ? අපට ඡන්දය දීලා ඡන්දදායකයෝ අපව මේ සභාවට පත් කළේ මොකටද? මේකේ බලාගෙන ඉන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, ඒ වාගේම දාරුසලාම් විද්‍යාලය. දාරුසලාම් විද්‍යාලය ළඟම පාසල, හොඳම පාසල මේකට කථා කරන්න මට තව විනාඩියක් දෙන්න. ළඟම පාසල, හොඳම පාසල. අපටත් සන්තෝෂයි. මැද කොළඹ තිබෙන පාසල් කොච්චරක්ද. ජනවාරි මාසේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇවිල්ලා මුල්ගල තිබ්බා, Memon Association කියලා සංවිධානයක් බිල්ඩිම හදන්න කෝටි 25 ක් දෙන්නම් කියලා. තිබෙන පරණ ගොඩනැගිලි ටික අයින් කරලා දාලා ජනාධිපතිතුමා මුල්ගල තියපු එක සුමාන දෙකකට කලින් මුල්ගල අයින් කරලා දාලා අද ඉන්න පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ඇවිල්ලා ළඟම පාසල හොඳම පාසල -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔන්න යහපාලනය. අහගන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, මේක විහිළුවක්. මම අහන්නේ කොළඹ පළාතේ අධ්‍යක්ෂතුමා මේ ගැන දන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වැරැදියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මීට කලින් ජනාධිපතිතුමා ගිහිල්ලා මුල්ගල තිබ්බා. (බාධා කිරීම්) මේවා අපි කථා කරන නිසා තමයි අපව ව්‍යුහ කමිටුවටවත් දාන්න කැමැති වුණේ නැත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

විශේෂයෙන් මම කියන්නේ මේක විහිළුවට ගණන් ගන්නේ නැතුව ක්ලිෆ්ටන් විද්‍යාලයට, ෆාතිමා විද්‍යාලයට වුණු දේ මින් ඉදිරියට එක ඉස්කෝලයකටවත් වෙන්න ඉඩ තියන්න එපා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. එතුමා බරපතළ ප්‍රකාශයක්, බොහොම වේදනාවෙන් කළේ. අතිගරු ජනාධිපතිතුමා මුල්ගල තියපු ගොඩනැගිල්ලක මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා ඒ මුල්ගල ඉවත් කළා කියලා. මම දන්නේ නැහැ ඒක ජාතික පාසලක්ද, පළාත් පාසලක්ද කියලා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු සභාපතිතුමනි, ජනාධිපතිතුමා ජනවාරි මාසේ දාරුසලාම් විද්‍යාලයට ගිහිල්ලා මුල්ගල තිබ්බා. ඒකට මමත් ගියා. අධ්‍යාපන ඇමැතිතුමාට ආරාධනා කරලා තිබුණා. එතුමා ඇවිල්ලා හිටියේ නැහැ. අකිල විරාජ් කාරියවසම් ගරු අධ්‍යාපන ඇමැතිතුමාත් ආවා.

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අපට එන්න බැහැ. ඔබතුමන්ලාගේ ගැටුම්.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මගේ ගැටුම් නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම කැමැතියි එන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අධ්‍යාපන ඇමැතිතුමා ඔබතුමන්ලා කාරණය තේරුම් ගන්න ඕනැ. ඔබතුමා කියන්න (බාධා කිරීම්) බස්නාහිර

[ගරු එම්.එස්.එම්. ෆයිරෝස් ]

පළාත් සභාවට අයිති පාසල් ටික. ඔබතුමා වැරැදි කථා කරන්න එපා. මේකට මොකක්ද කරන්න ඕනෑ කියලා පළාත් සභාව දැන ගන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

36 (1) වගන්තිය යටතේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී මට -

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මාස අටක් යන්න ඉස්සෙල්ලා -

[සභාවේ ඝෝෂා]

දාරුසලාම් ඉස්කෝලේ - අධ්‍යාපන ඇමැතිතුමා මේකට සුදුසුම නැහැ කියලා මම මේ සභාවේ කියන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

36 (1) යටතේ. ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාරයේත් මතක් කළා. ගරු සභාපතිතුමාගෙන් පොදු ඉල්ලීමක්. මේ සභාවේ ඉන්න ගරු ඇමැතිතුමන්ලාට මේ වාගේ අදහස් ප්‍රකාශ කරන කොට අපි බොහොම සංවේදීව කන් යොමා ඉන්නවා. කවදත් එහෙමයි. හැබැයි අපට උත්තරයක් දෙන්න බැහැ. ඒකපාර්ශික චෝදනා වැලක් ඉදිරිපත් කරන කොට මේ සභාවේ මන්ත්‍රීතුමන්ලාට සැක සංකා ඇති වෙනවා මේ ඇමැතිවරු මේවා හොයන්නේ නැහැ. බලන්නේ නැහැ. මොනවත් කරන්නේ නැහැයි කියලා. හැබැයි මම මේකට අද උත්තර සොයලා ලබන සභා වාරයේ උත්තර බදිනවා. ඉතා නිවැරැදිව අපි මේකට කැප වෙලා වැඩ කළා. ඒ නිසා ඔබතුමාගෙන් ඉල්ලනවා මේ රීතිවල සංශෝධනයක් කරන්න. අපටත් පැහැදිලි කිරීමක් කරන්න ඉඩ දෙන්න. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි අවස්ථාව දුන්නා. ඔබතුමන්ලා නැහැ නේ? දැනුත් මම කිව්වා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

රීති සංශෝධනයකින් මිසක් අපට උත්තර දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි තීරණයක් අරගෙන තිබෙනවා, ඊළඟ රීති සංශෝධනයේදී පෞද්ගලික පැහැදිලි කිරීම් විෂයයට පස්සේ ඔබතුමන්ලාගේ ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ අවස්ථාව න්‍යාය පත්‍රයට ඇතුල් කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

එහෙම දෙන්න. ඔබතුමාට බොහොම ස්තුතියි. අපි එතකොට උත්තර දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ප්‍රශ්නයක් යොමු වුණු නිසා මම මේ කියන්නේ. මීට පෙරත් අධ්‍යාපන ප්‍රශ්න කිහිපයක් යොමු වුණා. ඒ නිසා ඔබතුමාත් ඒ වෙලාවට පොඩ්ඩක් එන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපි උත්තර බලාපොරොත්තු වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජා-ඇළ ප්‍රදේශයට කොළඹ දිස්ත්‍රික්කයේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ අවධානම පිළිබඳව ශිරන්ත අමරසේකර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 4 ක කාලයක් තිබෙනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, අපි පසුගිය දිනවල පුවත්පත්වල දැක්කා, කොළඹ කුණු කන්ද ගෙනැල්ලා ජා-ඇළ උදේකැලේට බැහැර කරන්න යනවා කියලා. ඒකට ජා-ඇළ ආසනයේ පරිසරවේදීන් විශාල විරෝධයක් පෑවා. ඒ අවස්ථාවට පළාත් සභා මන්ත්‍රීවරු වශයෙන් අපටත් සම්බන්ධ වෙන්න හම්බ වුණා. ගරු සභාපතිතුමනි, ඇත්තටම මම හිතන්නේ පළාත් සභාවට අයිති විෂයයක්.

මේ පළාත් පාලන ආයතනවල කුණු කියන එක. දැන් මීතොටමුල්ලේ තිබෙන කුණු කන්ද ජා-ඇළ උදේකැලේට ගේන්න උත්සාහ කරනවා කිව්වොත් - ඇත්තටම වෙලා තිබෙන්නේ, එන මාසේ 13 වැනිදා වනකල් තමයි කල් දීලා තිබෙන්නේ, මීතොටමුල්ලට කුණු බැහැර කරන්න. එතැනදී කොළඹ නගර සභාවෙන් උසාවියට වාර්තා කරලා තිබෙනවා කියලා අපි දැක්කා, ජා-ඇළ උදේකැලේට මේ කුණු ටික ගෙනැල්ලා බැහැර කරන්න අවසර අරගෙන. මෙම දැක්කා කොළඹ නගර සභාවේ කොමසාරිස්තුමා පෙරේදා Sunday Times පත්තරේට කියලා තිබෙනවා, අනුමැතිය ලැබුණා කියලා. මේ පිළිබඳව අපි හරියාකාර තොරතුරක් දන්නේ නැහැ. මොකක්ද වෙන්නේ කියලා. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව අද දිනයේ පළාත් සභාවට ප්‍රකාශයක් කරන්න කියලා. මේ කුණු ටික ජා-ඇළට ගේනවාද නැද්ද කියන එක පිළිබඳව.

ඊළඟට මම මතක් කරන්නේ මම හිතන්නේ මේක විශේෂ අවස්ථාවක් අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාට. මොකද, අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අගමැතිතුමාත් එක තැනක ඉන්නවා. වක්‍රව ගත්තොත් අද පළාත් පාලන ආයතන සියල්ලම පාලනය කරන්නේ අපේ මහ ඇමැතිතුමා. ලේකම්වරු මාර්ගයෙන් මහ ඇමැතිතුමාට තමයි සියලුම පළාත් පාලන ආයතනවල බලය අද තිබෙන්නේ. ඒ නිසා මම හිතන්නේ මේක සුවිශේෂී අවස්ථාවක්, මේ ප්‍රශ්නය විසඳන්න. මම සොයා ගත්තු කරුණු අනුව ශ්‍රේලයින් සමාගම ඉඩම් අක්කර 100 ක් විතර ඒ ප්‍රදේශයෙන් මිලදී ගෙන තිබෙනවා. ඒ ඉඩමට කුණු ටික දානවාට මාසයකට ගෙවන්න එකඟ වෙලා තිබෙනවා ලක්ෂ 300 ක මුදලක්. මාසයකට ලක්ෂ 300 ක මුදලක් ඉඩමට ගෙවනවා. ඒ අනුව මේ අය තවත් අය එක්කලා ඇවිල්ලා මේ ඉඩම් ටික බලලා ගිහිල්ලා තිබෙනවා. ජා-ඇළ ප්‍රදේශයට මේ කුණු ටික දැම්මොත් සම්පූර්ණයෙන් ඒ ප්‍රදේශයම ඉවර වෙලා යනවා. මීතොටමුල්ල වාගේ. ඒ නිසා අපි කියන්නේ නැහැ අහවල් තැනට දාන්න කියලා. ඒක අපට කියන්න බැහැ. අපට ආරංචි විධියට නගර සභාව හොර රහසේ පොඩි ටෙන්ඩර් නෝටිස් එකක් දාලා තිබෙනවා. ටෙන්ඩර් පත් දෙකක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එකක් ජා-ඇළින් දාලා තිබෙනවා. අනෙක් එක වත්තල පමුණුගමින් දාලා තිබෙනවා. බෝපිටිය ප්‍රදේශයෙන්. හොර රහසේ මේ කටයුතු සිද්ධ වෙලා තිබෙනවා. ව්‍යාපාරිකයෝ දෙන්නෙක් උත්සාහ කරනවා තමුන්ගේ තිබෙන පහත්බිම් ටික මුදලුත් අරගෙන රජයේ වියදමින් ගොඩ කර ගන්න. නමුත් මේ ප්‍රශ්නයට විසඳුමක් අවශ්‍යයි. ඒ නිසා මම හිතන්නේ මේක හොඳව අවස්ථාව අපට පළාත් සභාව හැටියට මැදිහත් වෙලා, මහ ඇමැතිතුමාට සුදුසු ප්‍රදේශයක් තෝරාගෙන කාටවත් අවහිරයක් නොවන විධියට මේ කුණු ප්‍රශ්නය විසඳන්න කටයුතු කිරීමට. එක අතකින් අපි පළාත් සභාව ආයෝජනයක් හැටියට හිතුවත් - මම සොයා ගත්තු කරුණු අනුව මම දැක්කේ මාසයකට රුපියල් ලක්ෂ 300 ක් මේ කුණුවලට ගෙවනවා. ඇත්තටම ගරු සභාපතිතුමනි, පුද්ගලිකව ගත්තොතින් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා දන්නවා. මගේ නිවස ඉස්සරහාපිට මටත් කුඹුරු යායක් තිබෙනවා. පසුගිය කාලයේ අබාන්ස් එකෙන් ආවා. කියුබ් දෙකේ ලෝඩ් හතරකුයි, කම්පැක්ටර්ස් දෙකකුයි මගේ එකට බාන්න දෙනවාද කියලා. දවසකට රුපියල් 60,000 ක් දෙනවා කිව්වා. මේක තමයි අද කුණු බාන ඉඩමක තිබෙන තත්ත්වය. කුණු බානවා නම්. ඒ නිසා මම දකින්නේ මේක පළාත් සභාවට හොඳ ආයෝජනයක් කියලා. පළාත් සභාව හැටියට අපි කොහේ හරි හොඳ ඉඩමක් අරගෙන ක්‍රමානුකූලව මේ පළාතේම කුණු ටික බැහැර කරන්න හොඳ තැනක් හදාගත්තොත් මේ මාස කිහිපය ඇතුළත කඩිනමින් මේ ප්‍රශ්නයට විසඳුමක් එනවා. මේ වනකල් හැමෝම කළේ, මම දැක්කා දිවයින පත්තරේ කියලා තිබෙනවා, අතිසාරයට අඹුඩ ගහන කථාවත් එක්ක කථාවක්. ඒ දේ තමයි මේ වනකල් හැමෝම කරලා තියෙන්නේ. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේක අවස්ථාවක් කරගෙන, බස්නාහිර පළාතේ මේ ප්‍රශ්නයට විසඳුමක් දෙමු කියලා.

ඒ වාගේම ගරු මහ ඇමැතිතුමා පසුගිය කාලයේ අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එක්ක ඇවිල්ලා උත්සාහ කළා. ජා-ඇළ, ඒකල නිවාසිපුරයට යාබදව තිබෙන අක්කර 30 ක ඉඩමේ මේ කැළි කසළ ව්‍යාපෘතියක් කරන්න. ඇත්තටම ගරු සභාපතිතුමනි, මේ ඉඩම අපි ලබා ගත්තේ පුද්ගලික අංශයෙන්. මම ප්‍රාදේශීය සභාවේ සභාපති වෙලා ඉන්න වෙලාවේ. වික්‍රම වීරසූරිය නමැති ඒ පුද්ගලික අංශයේ ව්‍යාපාරිකයාගෙන්. ඇත්තටම බලහත්කාරයෙන් වාගේ තමයි ඔය ඉඩම ප්‍රාදේශීය සභාවට ලියා ගත්තේ. ඔය අක්කර 30 ගත්තේ - ජා-ඇළ ආසනයේ ජනතාවගේ නිවාස ප්‍රශ්නය මුළුමනින්ම විසඳන්න පුළුවන්

[ගරු ශිරන්ත අමරසේකර ]

ඔය අක්කර 30 හරහා. ඒකට කුණු දාන්න හදන්න එපා. නිවාසි පුරේ ගෙවල් 1900 ක් තිබෙනවා. මිලේනියම් එකේ ගෙවල් දෙදහස් ගණනක තිබෙනවා. කෘෂ්ස්වත්තේ ගෙවල් 900 ක් තිබෙනවා. ඊට අමතරව තව පොඩි පොඩි නේවාසික ව්‍යාපෘති ගණනාවක් මේ ප්‍රදේශයේ තිබෙනවා. ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටින්නේ, මේක අවස්ථාවක් කරගෙන විශේෂ ව්‍යාපෘතියක් පළාත් සභාවෙන් ක්‍රියාත්මක කරලා මේකට ස්ථිරසාර විසඳුමක් දෙන්න කියලා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා උත්තරයක් දෙන්න - නමුත් ඔබතුමාට මම -

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

පළමුවෙන්ම කියන්න ඕනෑ මීතොටමුල්ලේ දැනට ගොඩ බාන කුණු ගෙනියන්න අපේ පළාත් සභාවේ කිසිම සම්බන්ධයක් නැහැ. ඒ කාරණාවේ තිබෙන බරපතළකම අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අගමැතිතුමාටත්, මුළු කැබිනට් මණ්ඩලයටම මම පැහැදිලි කරලා තිබෙනවා. එතකොට මේ ගැන මම උත්තර දෙන්න සූදානමක් නැහැ. පැහැදිලිව කියන්න ඕනෑ ඔය කොහේටවත් කුණු අරගෙන යන්න උවමනාවක් නැහැ. අපි පැහැදිලිව යෝජනාවක් ඉදිරිපත් කළා. මීතොටමුල්ලේ තිබෙන ඉඩම අපට දෙන්න කියලා, නාගරික සංවර්ධන අධිකාරියෙන්. එතකොට මේකට අපට ව්‍යාපෘතියක් තිබෙනවා. අපට ඇහුම්කන් නොදී තමයි මේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා මේකට අපේ පැත්තෙන් කිසිම සම්බන්ධයක් නැහැ. මේක වගකිව යුත්තොත් එක්ක තමයි සාකච්ඡා කරන්න වෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා එතුමා ප්‍රශ්නය යොමු කළේ පළාත් පාලන ආයතන සියල්ලේම බලය ඔබතුමාට මේ අවස්ථාවේ තිබෙන නිසා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ. මට තිබුණාට අපට උඩින් ක්‍රියාත්මක වන බලවේග තිබෙනවා නේ? ඒක නිසා මට මෙතැන කරන්න දෙයක් - ඒ ව්‍යාපෘතියට අපේ කිසි සම්බන්ධයක් නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, ඔබතුමාට උසාවියට දෙන්න හොඳම උත්තරයක් තිබෙනවා. ඔක්තෝබර් මාසේ 13 වැනිදා උසාවියේ නඩුව තියෙනවා. එදාට අපේ යෝජනාවක් උසාවියට ඉදිරිපත් කළා නම්, උසාවියට සිද්ධ වෙනවා ඒකට ඇහුම්කන් දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපේ යෝජනා කැබිනට් මණ්ඩලයටම ඉදිරිපත් කරලා තිබෙනවා.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

කැබිනට් මණ්ඩලයට වැඩිය ගරු ප්‍රධාන ඇමැතිතුමනි, යෝජනාවක් කරන්නේ. අපේ යෝජනාව උසාවියට ඉදිරිපත් කරන්න. කොළඹ ශ්‍රේෂ්ඨාධිකරණයට අපේ යෝජනාවක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. මීතොටමුල්ලේ කේස් එක යන දවසට. පළාත් සභාවක් හැටියට මම ඉල්ලා සිටිනවා, ඒක උසාවියට අපෙන් යෝජනාවක් විධියට ඉදිරිපත් කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ මධ්‍යම රජයේ කැබිනට් එකට නේද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපිව දැනුවත් කරලා කවුරුත් අධිකරණයට යන්නේ නැහැ. අපට ඒක අදාළ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම සම්ප්‍රදායක් නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි මේ මුළු රටටම ඉදිරිපත් කරලා තිබෙනවා. අපට යෝජනාවක් තිබෙන බව ගරු සභාතිතුමනි, මුළු රටම දන්නවා. මීතොටමුල්ලට යෝජනාවක් තිබෙන බව අපේ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා දන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ අසෝක සපුමල් ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. මුළු සභාවම දන්නවා. මුළු රටම දන්නවා. කැබිනට් මණ්ඩලයටත් කියලා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, එහෙම කුණු ප්‍රවාහනය කරන්න බැහැ. ලෝකයේ කොහේවත් එහෙම දීර්ඝ දුරකට කුණු ප්‍රවාහනය කරන්නේ නැහැ. එහෙම කරන්න බැහැ. එහෙම බැරි බව දැන දැන බස්නාහිර පළාත විකල්ප යෝජනාවක් මීතොටමුල්ලේ ඉදිරිපත් කරලා තියෙද්දී තමයි ඒක නොසලකා තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේ. ඒක අපේ ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, මම ආදරයෙන් ඉල්ලා සිටිනවා -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නැහැ මට ආදරේ - ඔබතුමාගෙයි, මගෙයි ප්‍රශ්නයක් නොවෙයි නේ?

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, අද දවසේ සභාවට යෝජනාවක් විධියට ගේනවා -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමන්ලා ඒක ඔබතුමන්ලාගේ පක්ෂයෙන්ම විසඳගන්න.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපේ යෝජනාවක් විධියට ගේනවා. නීති උපදෙස් අරගෙන උසාවියට ඒක ඉදිරිපත් කරන්න කියලා. අපේ යෝජනාවක්. අර නඩුවටම අපේ හොඳ යෝජනාවක් තිබෙනවා නම්, ඒ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා. යෝජනාවක් විධියට ගේනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපට අදාළ නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ඒක ඉදිරිපත් කරනවා. අද එකඟතාවයක් අරගෙන දාන්න.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි නාගරික සංවර්ධන අධිකාරියට ලියුම් තුනකට වඩා ලියලා තිබෙනවා. මේකට අවශ්‍ය භූමි ප්‍රමාණය අපට දෙන්න කියලා. අපි කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒවා නොසලකා අපට ඉහළින් තීන්දු ගන්නවා නම් ගරු සභාපතිතුමනි, අපට බැහැ මැදිහත් වෙන්න. හරියට මේ තිබෙන සම්මුතිවාදී ආණ්ඩුව තුළ අපට ගැටෙන්න බැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

ගරු සභාපතිතුමනි, අපට වෙනම නීතිඥයෙකු මාර්ගයෙන් ඉදිරිපත් කරන්න, සභාවක් හැටියට ඒ යෝජනාව දෙන්න පුළුවන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙතුමා කියන්න ඕනෑ නැහැ මට. මම දන්නවා ඒක කරන්න. නමුත් සම්මුතිවාදී ආණ්ඩුවක් තුළ පළාතේ මහ ඇමැතිවරයා හැටියට නඩුවකට - ඒක මෙතුමන්ලාට පුළුවන් අගමැතිතුමාත් එක්ක කථා කරලා - දැන් මෙතුමන්ලාගේ පාර්ශවයේ අගමැතිතුමා ඉන්නවා නේ? අගමැතිතුමාට මේ කාරණය කියලා එතුමන්ලාට විසඳුමක් ගන්න පුළුවන්. උසාවි යන්න ඕනෑ නැහැ.

**ගරු ශිරන්ත අමරසේකර**
Hon. Shirantha Amarasekara

අපට ඒ යෝජනාව දෙනවා නම් අපි වෙනම නීතිඥයෙක් මාර්ගයෙන් ඉදිරිපත් කරන්නනම්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එපමණ යන්න ඕනෑ නැහැ. අගමැතිතුමාට කථා කරන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. අගමැතිතුමාට කිව්වා නම් එතුමා ක්‍රියාත්මක වෙයි. පළාත් සභාවේ තීන්දු තීරණ ක්‍රියාත්මක නොවීම සම්වන්ධව අදහස් දැක්වීමට නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, පළාත් සභාව හැටියටත් ඒ වාගේම පාර්ලිමේන්තුව, ප්‍රාදේශීය සභා ගත්තත් ජනතාව ඡන්දය දීලා මහජන නියෝජිතයන් පත් කරන්නේ ඒ ජනතාවගේ අත්‍යවශ්‍ය කාරණා ඉටු කර ගැනීමයි. ඒ වාගේම ඔවුන් වෙනුවෙන් මහජන නියෝජිතයන් හැටියට යමක් කරයි කියන විශ්වාසයෙන් තමයි ජනතාව මන්ත්‍රීවරු එහෙම නැත්නම් මහජන නියෝජිතයන් අදාළ ආයතනවලට පත් කර ගන්නේ. අපි පළාත් සභාවට තේරී පත් වෙලා එන්නේ මහජන නියෝජිතයන් හැටියට ජනතාවගේ ප්‍රශ්නවලට, ගැටළුවලට යම් හෝ උත්තරයක් ලබා දෙන්න. ඒ විශ්වාසය රැක්කොත් විතරයි ඒ මන්ත්‍රීවරුන්ට, මහජන නියෝජිතයන්ට ජනතාව අතර ගෞරවයක් තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, මේ සභාවට අපි පසුගිය කාලයේ නවක මන්ත්‍රීවරු හැටියට නිතරම ප්‍රශ්න ඉදිරිපත් කරනවා. ඒ වාගේම යෝජනා ඉදිරිපත් කරනවා. දිගින් දිගටම අපි මේ සභාවේ ජනතාව වෙනුවෙන් කථා කළා. අපි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, පසුගිය කාලයේ මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට මොරොන්තුඩුවේ පොළ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඉදිරිපත් කළා. මොරොන්තුඩුවේ පොළ සම්බන්ධ ප්‍රශ්නයේදී මම එතුමාගෙන් අහනවා, මේ සම්බන්ධව වාර්තාවක් ඉදිරියේදී සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්ද කියලා. මහ ඇමැතිතුමා පොරොන්දු වෙනවා, දෙපාරක් උත්තර දෙනවා, මට පුළුවන් මම ඉදිරිපත් කරන්නම් කියලා. හැබැයි ගරු සභාපතිතුමනි, අද වනකල් ඒ වාර්තාවත් නැහැ. පසුව මම ආපහු එතුමාගෙන් අහනවා, පොළේ බදු ගෙවීම් සම්බන්ධව. ඒ බදු නිදහස් කරන්න පුළුවන් නම් ඔබතුමා මැදිහත් වෙලා ඒක කරලා දෙන්න කියලා. නැවත එතුමාගේ උත්තරේ තිබෙන්නේ මේ සභාවට ඉදිරිපත් කරනවා. මම ඒ ගැන සොයා බලලා, ඔබතුමාත් එක්ක කථා කරලා මේ සම්බන්ධව ක්‍රියා කරන්නම් කියලා. ඒ වාගේම අපේ අධ්‍යාපන ඇමැතිතුමාට විශේෂයෙන්ම ගොඩක් ප්‍රශ්න ඉදිරිපත් වෙනවා. එතුමාගෙන් මම ප්‍රශ්නයක් අහනවා. කළුතර අධ්‍යාපන කොට්ඨාශය තුළ සම්පූර්ණයෙන් ගණිතය විෂයය අසමත් පාසල් සංඛ්‍යාව කොපමණද කියලා. එතුමා උත්තර දෙනවා, කිසිම පාසලක ගණිතය විෂයය සම්පූර්ණයෙන්ම අසමත් පාසල් නැහැයි කියලා.

ගරු සභාපතිතුමනි, මම නැවත නැවතත් එතුමාට තහවුරු කරද්දී එතුමා එතුමාගේ පැත්තෙන් ඉදිරිපත් කරනවා, මට නිලධාරීන් දීලා තිබෙන උත්තර සම්බන්ධයෙන් ගැටළුවක් තිබෙනවා. මම ඒ සම්බන්ධව ක්‍රියා කරන්නම් කියලා. නමුත් ගරු සභාපතිතුමනි, මම සොයා ගත්තා කළුතර කලාප කොට්ඨාශය තුළ ඉස්කෝල 05 ක්. මාවල කණිෂ්ට විද්‍යාලය. මලේගොඩ කණිෂ්ට විද්‍යාලය. කොස්වත්තහේන කණිෂ්ට විද්‍යාලය. කළුවාමෝදර කණිෂ්ට විද්‍යාලය. ශාන්ත බියෙස් කණිෂ්ට විද්‍යාලය කියන ඉස්කෝල පහේම සම්පූර්ණයෙන්ම ගණිත විෂයය අසමත්. එතුමා දෙන උත්තරේ තිබෙන්නේ, එකම පාසලක්වත් එහෙම නැහැයි කියලා. හැබැයි, එතුමාගේ පැත්තෙන් නැවත සභාවට උත්තරයක් දෙනවා. නිලධාරීන් පිළිබඳව සොයා බලා කටයුතු කරන්නම් කියලා. නමුත් අපට දැනෙන්නේ නැහැ ඒ ක්‍රියාවලිය. අපි අහන ප්‍රශ්නවලට ඒ ක්‍රියාවලිය වෙන්නේ නැහැ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මහජන පැමිණිලි අපි මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරනවා. ඒකේදී ගරු සභාපතිතුමනි, මීට අවුරුද්දකට පමණ ඉදිරියේදී 2014.11.25 දා මහජන පෙත්සම් කාරක සභාවේ දී කළුතර ප්‍රාදේශීය සභාව පිළිබඳව තීන්දුවක් ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ සෝෂාව වැඩියි. කරුණාකරලා පෞද්ගලික කථා බහ නතර කරන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් වන මේ ප්‍රශ්නයේදී මහජන පෙත්සම් කාරක සභාවේ තීන්දු වෙනවා. ප්‍රාදේශීය සභාවට එම ක්‍රියාව සම්බවන්ධව නාම පුවරුවක් තිබෙනවා, ගලවලා ඉවත් කරන්න කියලා. අදටත් වසරක් වෙනවා ගරු සභාපතිතුමනි. ඒ සම්බන්ධව ක්‍රියා කරලා නැහැ. ඒ වාගේම පසුගිය කාලයේ කාණු පද්ධතියක් පිළිබඳව මහජන පෙත්සම් කාරක සභාවේ තීන්දුවක් දෙනවා.

ප්‍රාදේශීය සභාව මැදිහත් වෙලා ඒ ඉඩම පවරාගෙන, ඒ කාණු පද්ධතිය ප්‍රාදේශීය සභාවට පවරාගෙන ඉදිරියට කටයුතු කරගෙන යන්න කියලා. ගරු සභාපතිතුමනි, ඒ මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් වෙලා ගත්තු තීන්දු තීරණ පිළිබඳව ප්‍රාදේශීය සභාව දිගින් දිගටම මහ හරිමින් ඉන්නවා. ඒ නිසා අපි මේ සභාවට කියන්නේ, අපි ඉදිරිපත් කරන ප්‍රශ්නවලට නිසි උත්තර නැත්නම් -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, ආයිත් සාකච්ඡා. බලන්න කෝ? පුදුම සාකච්ඡා තොගයක් නේ තියෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම දැන් දෙපාරක් සිහිපත් කළා. සාකච්ඡා නවත්වන්න කියලා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මූලිකත්වයෙන් තිබෙන මහජන පෙත්සම් කාරක සභාවේ ගන්න තීන්දු තීරණ ප්‍රාදේශීය සභාව ක්‍රියාත්මක කළේ නැත්නම් අපට ගැටළුවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, දැන් වසරක් වෙනවා. මේ ප්‍රශ්න දෙකේදීම ප්‍රාදේශීය සභාව දිගින් දිගටම කර අරිමින් ඉන්නවා. ඒ නිසා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාටත් මම මේ ලිපි දෙක ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, අපි පසුගිය කාලයේ පෙර පාසල් උත්සවලට නිතරම සම්බන්ධ වෙනවා. පෙර පාසල් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ කාලය අවසන්. වැඩිපුරත් කාලය දුන්නා.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මම පෙර පාසල් ගුරුවරු සම්බන්ධව පුහුණු වැඩ මුළුවක් ඉදිරිපත් කරන්න කියලා කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 16 ටම මුදල් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන් මගේ අවධානය යොමු වුණා, පෙර පාසල් උත්සවලට සහභාගී වුණාම මහජන නියෝජිතයන් ඉදිද්දී පොල් තෙල් පහන දැල්වීමට, නැත්නම් පිළිගැනීමේ කථාවට පොලිස් ස්ථානාධිපතිට, ග්‍රාම නිලධාරී මහතාට තමයි මුලින්ම ආරාධනා කරන්නේ. ඔවුන්ගේ දැනුම සම්බන්ධව ගැටළුවක් තිබෙන නිසාම මම ඒ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කළා, වැඩ මුළුවක් පවත්වන්න මුදල් වෙන් කළා. හැබැයි මේ වනතුරු ඒ මුදල අනුමත කරලා නැහැ. මෙවැනි ගැටළු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මෙවැනි තත්ත්වයන් තිබියදී මහජන නියෝජිතයන් හැටියට අපට ගමට ගිහිල්ලා මුහුණ දීමේ ගැටළුවක් තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ සම්බන්ධව ඉදිරියේදී සොයා බලා කටයුතු කරන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්තටම එතුමා ඉතා වැදගත් කාරණාවක් කිව්වේ. මහජන නියෝජිතයන්ට උත්සවලට ගියාම නිසි තැන හම්බ වෙන්නේ නැහැ. උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාත් ඔය ප්‍රශ්නය යොමු කළා. උත්සවලට ගියාම එතුමා පැත්තක ඉන්නවාලු. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාලු ප්‍රධාන ආරාධිත අමුත්තා වෙන්නේ. මේවා වෙනස් කරන්න. අපි හැමදාම කියනවා. ගරු මන්ත්‍රීතුමාට ඒ තැන දෙන්න ඕනෑ. දැන් ඔබතුමාට ඒ ප්‍රශ්නය ආවා. උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට අත්තනගල්ලේ ඒ ප්‍රශ්නය ආවා. ගරු ඇමැතිතුමන්ලා උපදෙස් දෙන්න එහෙම කරන්න එපැයි කියලා. ඔබතුමාට බොරු තොරතුරු දීලා. ගණිතය විෂය අසමත් අය නැහැ කිව්වා. දැන් මන්ත්‍රීතුමා පාසල් 05 ක් කිව්වා. මේවා සොයා බලන්න ඔබතුමා. මේ වාගේ වැරැදි තොරතුරු දෙන නිලධාරීන්ට විරුද්ධව ඔබතුමා තීන්දු ගන්න. මෙහෙම යන්න ගියාම මේවා අයාලේ යනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සම්බන්ධව උත්තර දෙන්න නොවෙයි. මට ඕනෑකම තිබෙනවා. අපි දීර්ඝ කාලයක් නන්දන පත්මකුමාර ගරු මන්ත්‍රීතුමාගේ මතයේ හිටපු අය. එතුමාගේ අදහස අගය කරන්නයි මට ඕනෑකම තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

(බාධා කිරීමක්) ගරු සභාපතිතුමා තීන්දුවක් ගත්තා පෞද්ගලික පැහැදිලි කිරීම්වලින් පසුව ඇමැතිවරුන්ගේ - ඒ වාගේම මේ යම් යෝජනාවල් ගෙනාවාම ඒ යෝජනාවලින් පස්සේ සිදු වන කාර්ය භාරයේ පසු විපරම කුමක්ද කියන එකටත් අවස්ථාවක් දෙන්න. අපි කැමැතියි ඒකට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමන්ලා ක්‍රියාත්මක වෙනවා නම් ඔය වාගේ ප්‍රශ්න එන්නේ නැහැ. වැරැදි තොරතුරු දෙන නිලධාරීන්ට විරුද්ධව ඔබතුමා තීන්දුවක් ගන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපේ අමාත්‍යාංශය ඒ අඩුව හදාගන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැමදාම අපි රැස්වීම්වල කියනවා. මේ අවස්ථාවේ සභාව උදෑසන තේ විවේකය සඳහා - (බාධා කිරීමක්)

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මම මේ ගරු මන්ත්‍රීවරුන්ට කියන්න කැමැතියි. ලිඛිත සභා වැඩක් නැහැ. මම ප්‍රායෝගික මිනිහා. මොනවා හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, මට Over the Phone කථා කළා නම්, Phone එකෙන්ම මම Settle කරන මනුස්සයා. මේ සභාවල ඇවිල්ලා කයිය ගහලා මගෙන් ප්‍රශ්න විසඳගන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම කියන්න එපා. ගරු ප්‍රධාන ඇමැතිතුමා වැරැදි ප්‍රකාශ කරන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා සභාවේ ඉදිරිපත් කරන -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

පොඩ්ඩක් ඉන්න, ඔබතුමාට කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එහෙම කියන එක වැරැදියි.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමා පොඩ්ඩක් ඉන්න. එපමණ දුරට යන්න ඕනෑ නැහැ. මේ සභාවේ මන්ත්‍රීවරු දන්නවා මට Phone එකෙන් මොනවා හරි කිව්වාම Phone එකෙන්ම ඒ මන්ත්‍රීතුමියට මම උත්තරය දෙනවා. මාත් එක්ක සරල විධියට බේර ගන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි මේ තියෙන්නේ. අධ්‍යාපන ප්‍රශ්නයක් ගැන කථා කළේ.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

නැහැ, නැහැ. මම කිව්වේ එතුමා මගෙත් ප්‍රශ්නයත් තිබුණා. ඒක මේ සභාවට ගේන්න ඕනෑ නැහැ. මට දුරකථනයෙන් කථා කරලා විසඳගන්න තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරුන්ට අයිතියක් තිබෙනවා සභාවට ගේන්න.

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

එහෙම නම් ගරු සභාපතිතුමනි, මහ ඇමැතිතුමාගෙන් ප්‍රශ්න අහන්නේ නැතුව අපට Phone එකෙන් උත්තර ගන්න පුළුවන් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සභාව තියෙන්නේ ඒකට. ඒකටයි මේ සභාව රැස් වෙන්නේ. එහෙම නම් සභාවක් ඕනෑ නැහැ නේ? එහෙම නම් අපි ප්‍රශ්න අරගෙන මෙතැනට එන්නේ නැහැ. මේ අවස්ථාවේදී පෙරවරු තේ විවේකය සඳහා සභාව විනාඩි 15 කට කල් තබනවා. මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු මන්ත්‍රීවරුන් ඉක්මණින් සභාවට එන්න. ගියවර සභාවේදීත් තේ පානයෙන් පස්සේ මන්ත්‍රීවරු එහේ මෙහේ ගිහිල්ලා. තුන් පාරක් ගණපූරණය නැති වුණා. ඒ නිසා කරුණාකරලා නියමිත වෙලාවට සභා ගර්භයට එන්න. ගණපූරණය පවත්වාගෙන යන්න. විනාඩි 15 කට කල් තියන්නේ. ඉක්මණින් එන්න.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.26 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.26 a.m. and then resumed.*

***[පෞද්ගලික පැහැදිලි කිරීම්]***
*[Personal Explanation]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාත් මන්ත්‍රී ජා-ඇළ පාසල්වලට කඩා පනී. පරිපාලන කටයුතුවලට දැඩි බාධා යන ශීර්ෂය යටතේ 2016.09.19 වන දින දිවයින සහ අද පුවත්පත්වල පළ වූ ප්‍රවෘත්ති පිළිබඳව අදහස් දැක්වීමට මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම ගැන. ඒ වාගේම අධ්‍යාපන ඇමැතිතුමා මේ අවස්ථාවේ මෙතැන නැතිවීම ගැන කනගාටු වෙනවා. මොකද, ඊයේ දිවයින පත්තරේත්, අද කියන පුවත්පත් දෙකේම Headline එකේ දාලා තිබෙන්නේ බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ජා-ඇළ පාසල්වලට කඩා පනී. ඒ වාගේම පරිපාලන කටයුතුවලට දැඩි බාධා කියලා. ගරු සභාපතිතුමනි, මීට දවස් 10 කට පෙර බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමිය ලිපියක් එවලා තිබෙනවා,

*"2016 සැප්තැම්බර් මාසයේ 30 වන දිනට පසු අනුමත වන සියලුම ඉදි කිරීම් ව්‍යාපෘති හා ඔක්තෝබර් මස 31 වන දිනෙන් පසු අනුමත වන මිලදී ගැනීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට භාර නොගන්නා බවට දිස්ත්‍රික් කමිටුව තීන්දුවක් ගත්තා"* කියලා.

ඒ නිසා විශේෂයෙන්ම පළාත් සභා මන්ත්‍රීවරු, ගරු අමාත්‍යවරු සියලු දෙනාටම මම හිතන්නේ මේ වනකොට මේ ලිපිය ලැබිලා ඇති. ඒ නිසා අපි පළාත් සභා මන්ත්‍රීවරු හැටියට හැම වසරේම මුදල් වෙන් කරනවා. අධ්‍යාපන අමාත්‍යාංශය තුළ. අපි පළාත් සභාව තුළ 2016 ට සැලසුම් හදන්න 2015 තමයි යෝජනා ගන්නේ. ගිය අවුරුද්දේ 2015.09.16 වැනිදා තමයි සැලසුම් අංශයෙන් කලාපවලට යෝජනා කරලා, යෝජනා එවන්න කියලා ලිපි ඇරියේ. ඒ වාගේම මීගමුව කලාපයේ සංවර්ධන යෝජනාවලට සංවර්ධන කමිටු රැස්වීම තිබ්බේ 2015.09.30. ඒ වාගේම වත්තල ඉංජිනේරු කාර්යාලයට ඇස්තමේන්තු ලබා ගැනීමට ලිපි යොමු කළේ 2015.10.14. ඒ වාගේම ඇස්තමේන්තු හදලා සියලු යෝජනා හදලා අධ්‍යාපන සැලසුම් අංශයට එව්වේ 2015.11.03. අද බලන්න ගරු සභාපතිතුමනි, ජා-ඇළ කොට්ඨාශයට ලෝක බැංකු ආධාර යටතේ ව්‍යාපෘති 06 ක් ඇවිල්ලා තිබෙනවා. පළාත් නිශ්චිත ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 24 ක්. පළාත් සංවර්ධන ව්‍යාපෘති යටතේ ව්‍යාපෘති 01 ක්. සියලු ව්‍යාපෘති 31 යි. පාසල් 27 යි. ලක්ෂ 173 යි. 8000 ක් එවලා තිබෙනවා. එතකොට ව්‍යාපෘති බැලීමට මෙහෙම ලිපියක් එව්වාම - ගිය බ්‍රහස්පතින්දා ගිණුම් කාරක සභාවේ රැස්වීම අවලංගු කළ බව බදාදා සභා ලේකම් කාර්යාලයෙන් අපට දුරකථනයෙන් දැනුම් දුන්නා. හැමදාම අපි බ්‍රහස්පතින්දා දවස වෙන් කරගෙන ඉන්නේ ගිණුම් කාරක සභාවට. ඒ නිසා ගිණුම් කාරක සභා රැස්වීම අවලංගු වුණු නිසා, මේ ලිපිය ප්‍රධාන ලේකම්තුමියගෙන් ලැබුණු නිසා ජා-ඇළ කොට්ඨාශයේ ව්‍යාපෘතිවලට වෙන් කරපු මුදල්වල ව්‍යාපෘතිවල ප්‍රගතිය බැලීමට උදේ 7.30 සිට සවස 1.45 දක්වා පාසල් 20 කට ගියා. ගිහිල්ලා විදුහල්පතිවරුත් එක්ක සාකච්ඡා කරලා ලැබුණු ව්‍යාපෘතිය පටන් ගත්තාද? දින ඉවර වෙන්නේ කවදාද? භාගෙට කරලා තිබෙනවාද? ලැබිලා නැද්ද? කියන ප්‍රගතිය වාර්තා කරලා, ඒ වාර්තා හදලා මම ඡායාරූප පවා ගත්තා. සියලු විදුහල්පතිවරු එකතු වුණා. කොට්ඨාශ කාර්යාලයට, කලාප කාර්යාලයට, අධ්‍යාපන දෙපාර්තමේන්තුවට, අධ්‍යාපන ලේකම්තුමාට, අධ්‍යාපන ඇමැතිතුමාට ඒ විදුහල්පතිවරු විසි දෙනාගෙන් කිසිම

[ගරු මෙරිල් පෙරේරා ]

කෙනෙක් කිසිම චෝදනාවක් නඟලා නැහැ. අපි පළාත් සභාවේ මහජන නියෝජිතයන් හැටියට පාසලට ගියා කියලා - අපට පාසලට යන්න අයිතියක් තිබෙනවා. අපි යන්නේ පරිපාලන කටයුතුවලට නොවෙයි. මම ගිහිල්ලා කිසිම විදුහල්පතිවරයෙකුගේ කාමරයේ ඉඳගෙන පාසල කරන්නේ කොහොමද? ප්‍රතිඵල මොනවාද? කියන එක නොවෙයි මම විමසුවේ. මම ගිහිල්ලා ඇහුවේ මේ වෙන් කරපු මුදල්වලට යම්කිසි ව්‍යාපෘතියක් පටන් අරගෙන තිබෙනවා නම් ඒ පටන් ගත්තු දිනය, අවසන් කරපු දිනය මේ වනකොට මොකක්ද තිබෙන ප්‍රගතිය බැලීමට තමයි මම ඒක ක්‍රියාත්මක කළේ.

ගරු සභාපතිතුමනි, මේ පත්තරේ දාන්නේ. ජා-ඇළ කොට්ඨාශයේ ඉන්න ගුරුවරයෙක්. පාසලක උගන්වන ගුරුවරයෙක්. ඒ ගුරුවරයාගේ නම තමයි එම්.ආර්.කේ. පින්තු. රුක්මන් පින්තු කියලා. එක පත්තරේක තිබෙනවා කඳාන විශේෂ කියලා. අනෙක් පත්තරේ තිබෙනවා කඳාන රුක්මන් කියලා. දැන් එතුමා දාලා තිබෙනවා, මෙතැන කාරණා දෙක්ක සඳහන් කරලා. මීගමුව කලාපයේ නිලධාරීන්ගෙන් විමසුවා. විමසුවාම දුන්නු උත්තර කියලා. ඒ බොරුවක්. තව පැත්තකින් දාලා තිබෙනවා පෞද්ගලිකව දරන වියදම් නොවෙයි. මේවා මහජන මුදල් කියලා. ගරු සභාපතිතුමනි, මහජන මුදල් තමයි. අපි කවුරුත් මෙතැන ඉන්න කිසිම මන්ත්‍රීවරයෙක් අතින් වියදම් කරලා කාටවත් ව්‍යාපෘතිවලට සල්ලි වෙන් කරන්නේ නැහැ. මහජනයාගේ බදු මුදල් තමයි පාර්ලිමේන්තුව, පළාත් සභාව, ප්‍රාදේශීය සභාවට එන්නේ. ඒවා හරියාකාරව මුදල් අතට ලැබුණාම ඒවා යොමු කරන එක මහජන නියෝජිතයාගේ වගකීමක්. එතකොට මේ ගුරුවරයා - මීට ඉහත මම ව්‍යුහ කමිටුවේ කථා කරලා තිබෙනවා. මේ පළාත් සභාව තුළ කථා කරලා තිබෙනවා. 1998 තමයි ගුරුවරයාගේ පත්වීම ලැබෙන්නේ. 2012.02.06 වැනිදා වල්පොල ධර්මරත්න විද්‍යාලයේ ගුරුවරයෙක් හැටියට වැඩ භාර ගන්නවා. 2012.05.28 වන දින ශිෂ්‍යභට බලකායේ ලිපියකින් විදුහල්පතිට ලිපියක් ඇරලා සක්‍රීය සේවයට කැඳවීම කියලා එතුමා නිදහස් කරන්න කියලා ලිපියක් දෙනවා. හැබැයි නීත්‍යානුකූලව අපි දන්නවා, ශිෂ්‍යභට බලකායට නිදහස් වෙන්න නම් විධිමත්ව නිදහස් වන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය තමයි කලාපයෙන්, අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්, පළාත් අධ්‍යාපන ලේකම් සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ගිහිල්ලා අනුමත වෙන්න ඕනෑ. 2012.05.28 වන දින සිට මේ වනකොට 2015.12.01 දක්වා අවුරුදු 3 ½ ක් කිසිම අනුමැතියක් නැතුව ශිෂ්‍යභට බලකාය ක්‍රියාත්මක කරලා ගිහිල්ලා වැඩ කෙරුවා. වැඩ කළාද නැද්ද කියලා කිසිම වාර්තාවක් වෙලත් නැහැ. 2012.05.28 වැනිදා මේ ලිපිය ගෙනැත් දීලා 2013.11.28 දින කලාප අධ්‍යක්ෂතුමා පළාත් අධ්‍යාපන ලේකම්ට නිර්දේශයක් ලියනවා. පළාත් අධ්‍යාපන ලේකම්ට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා 2013.12.19 වැනිදා ලියනවා, මේකට අනුමැතිය දෙන්නය කියලා. පළාත් අධ්‍යාපන ලේකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට 2013.12.19 ලියනවා. අද වන තුරු උත්තරයක් නැහැ. ඒ වාගේම 2015.12.01 වැනිදා මේ ගුරුවරයා නැවත පාසලට ඇවිල්ලා අද වන තුරු ඉන්නවා. විෂයයක් උගන්වන්නේ නැහැ. පන්තියක් භාරව නැහැ. නිකම් අතිරික්ත ගුරුවරයෙක් වෙලා පාසලේ ඉන්නවා. එතකොට මහජන මුදල් කන්නේ අපිද? මහජන මුදල් නාස්ති කරන්නේ අපිද? මේ ගුරුවරයාද? කියලා පැහැදිලිව ඔප්පු කරලා කියන්න පුළුවන්. මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. අධ්‍යාපන ලේකම්තුමා ඉන්නවා. අධ්‍යාපන ඇමතිතුමා ඉන්නවා. මේ ගැන මේ ගුරුවරයා සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන්නය කියලා. මොකද, එතුමාට ලියන්න අයිතියක් නැහැ. ගුරුවරයෙක් හැටියට රජයේ තිබෙන පාසල්. මීට වසර ගණනාවක් තිස්සේ පාසල් ගණනාවකට විරුද්ධව ලිව්වා. ශාන්ත සෙබස්තියන් මහා විදුහල. ධර්මාශෝක විදුහල. බටගම සිද්ධාර්ථ විදුහල. මේ වාගේ විදුහල් ගණනාවකට එක් එක් බොරු ප්‍රචාර කළා කියලා මේ පත්තර වාර්තා කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් නීතියක් හැටියට ආයතනයේ ප්‍රධානියාගෙන් අවසරයක් නැතිව ලියන්න බැහැ. මේ සියලු දේවල් උල්ලංඝණය කරලා, මෙතුමා මේ ක්‍රියාකලාපය කර ගෙන යනවා. මේකට පරීක්ෂණයක් පවත්වන්න කියලා කියනවා.

ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, තව විනාඩියක් දෙන්න. තවත් විශේෂ කරුණක් තිබෙනවා කියන්න. බස්නාහිර පළාත් ක්‍රීඩා උළෙල. මම හිතන්නේ මේ සියලුම මන්ත්‍රීවරු දන්නවා ගම්පහ දිස්ත්‍රික්කයේ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනයේ තමයි පළාත් ක්‍රීඩා උළෙල පැවතුනේ. පසුගිය 11 වැනි ඉරිදා. සවස දෙකයි ගණනට අපේ දුරකථනයට SMS පණිවුඩයක් එනවා. බස්නාහිර පළාත් ක්‍රීඩා උළෙල පැවැත්වෙනවා කියලා. යටින් ගහලා එවනවා, අපට ආරාධනා පත්‍රය එවන්න බැරි වීම ගැන සමාවෙන්න කියලා.

ආයෙත් 2016.09.10 වැනිදා දවල් 11.45 ට අමාත්‍යාංශයේ වාහනයකින් ඇවිල්ලා ආරාධනා පත්‍රය ගෙදරට දීලා යනවා. තිබෙන්නේ ඉරිදා. මේ බස්නාහිර පළාත් ක්‍රීඩා උළෙල කියන්නේ, මේ අමාත්‍යාංශයේ මුදල් වෙන් කර ගෙන වසරකට පවත්වන ලොකුම ක්‍රීඩා උළෙල. එතකොට අමාත්‍යාංශයේ යුතුමක් තිබෙනවා. මීට ඉස්සෙල්ලා අපි හැමදාම ඉල්ලුවා, කමිටුවක් හදලා, කමිටුව මාර්ගයෙන් දින වෙන් කර ගෙන මේ ක්‍රීඩා උළෙල පවත්වන්නය කියලා. කිසිම මන්ත්‍රීවරයෙක් සහභාගී වුණේ නැහැ. සහභාගී වුණේ ක්‍රීඩා ඇමතිතුමා විතරයි. මේකේ තිබෙනවා, ආණ්ඩුකාරතුමා. ප්‍රධාන අමාත්‍යතුමා. සභාපතිතුමා. මම හිතන්නේ, ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා සහභාගී වෙලා තිබුණා. හවස ත්‍යාග ප්‍රධානෝත්සවයට කිසිම කෙනෙක් නැහැ. මම හිතන්නේ, උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා හිටියා. එතකොට කල්පනා කරලා බලන්න. අපි මෙතැන අයවැයට මුදල් වෙන් කරන කොට ක්‍රීඩා අමාත්‍යාංශයට මුදල් වෙන් කරනවා. ඒ මුදල් වෙන් කිරීම තුළ වාර්ෂිකව තිබෙන ක්‍රීඩා උළෙල බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ පැවැත්වෙන කොට, එහෙම සැලසුම් කරලා තිබෙන කොට මන්ත්‍රීවරුන්ට සහභාගී වෙන්න, ඊට ඉස්සරින්දා ගෙවල්වලට ගිහිල්ලා ආරාධනා පත්‍රය දුන්නාම, එන්න පුළුවන්ද? කාටද සහභාගී වෙන්න පුළුවන්? ගරු සභාපතිතුමනි, මේකේදී අවධානය යොමු කරන්න ඕනෑ වෙන මොකකටවත් නොවෙයි. මීට ඉහත අයවැය ගණනාවකදී කිව්වා. අවුරුදු තුනක සිට ක්‍රීඩා අධ්‍යක්ෂවරයෙක් පත් කරලා නැහැ. ඒ වාගේම දිස්ත්‍රික් නිලධාරීන් පස් දෙනෙක් ඉන්න ඕනෑ. එක්කෙනයි ඉන්නේ. හතර දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම ක්‍රීඩා නිලධාරීන් 38 දෙනෙකු ඉන්න ඕනෑ. පස් දෙනෙකුගේ පුරප්පාඩු තිබෙනවා. පුහුණුකරුවන් 15 දෙනෙකු සිටිය යුතුයි. තුන් දෙනයි ඉන්නේ. 12 ක් නැහැ. ක්‍රීඩා අමාත්‍යාංශයේ තනතුරු 22 කට නිලධාරීන් නැහැ. කොහොමද ක්‍රීඩා අමාත්‍යාංශය දුවන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නය තිබෙන්නේ ඒකයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ ප්‍රශ්නය අවුරුදු තුනක් තිස්සේ තියාගෙන ඒ ක්‍රීඩා නිලධාරීන් පත් කර ගන්නේ නැතිව අර නිලධාරීන් අමාත්‍යතුමාගෙන් දිනයක් අරගෙන කිසිම පළාත් සභා මන්ත්‍රීවරයෙකුව දැනුවත් නොකර මෙහෙම පළාත් ක්‍රීඩා උළෙල පවත්වන එකේ තේරුමක් තිබෙනවාද? දැන් ජාතික ක්‍රීඩා උළෙලට තවත් කොටසක් යනවා. මේ පළාත් ක්‍රීඩා උළෙලේදී ජයග්‍රහණය කරපු අය. ක්‍රීඩා අමාත්‍යාංශයට මිලියන 50 ක් වෙන් කරලා තිබෙනවා. අපි ඉන්නේ අත උස්සන්න විතරද? අපි මෙතැන ඉන්නේ ක්‍රීඩා අමාත්‍යාංශයට අත උස්සන්න විතරයි. අපව නිලධාරීන් සම්බන්ධ කර ගන්නේ නැත්නම්, දිස්ත්‍රික් ක්‍රීඩා උළෙලට, මේවාට සම්බන්ධ කර ගන්නේ නැත්නම් අපි මීට පස්සේ ක්‍රීඩා අමාත්‍යාංශයේ මුදල් පාස් කරන්න අයවැයේදී අත උස්සන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා, මේකට අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්න. විශේෂයෙන්ම අපි බොහොම සන්තෝෂ වුණා අධ්‍යාපනය හා ක්‍රීඩාව කියන දෙකම එක අමාත්‍යාංශයකට ලැබෙන කොට. අද ඒ දෙකම අයාලේ දුවනවා. ඒ නිසා මේ ගැන අමාත්‍යතුමාට යොමු කරන්නය කියලා ඉල්ලමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාත් සභාවේ කාර්යභාරය - උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. එතුමා ඉතාම වැදගත් ප්‍රකාශයක් කරන්නේ. බස්නාහිර පළාත් සභාව සහ කාර්යභාරය. දැන් කාර්යභාරයක් නැති නිසා තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, 2014.04.22 තමයි මේ නව සභා වාරය පටන් ගත්තේ. එතකොට 2014 වර්ෂයේ සභා වාර 18 ක් තිබිලා තියෙනවා. 2015 වර්ෂයේ සභා වාර 28 ක් තිබිලා තිබෙනවා. 2016 වර්ෂයේදී සභා වාර 16 ක් තිබිලා තියෙනවා. එතකොට මේ කාලය තුළ සියලුම

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

සභා වාර 61 ක් තිබිලා තිබෙනවා. හැබැයි, ගණපූරණය නැතිව පසුවට කල් තියලා තිබෙනවා සභා වාර 12 ක්. එතකොට කියන්නේ මේ බස්නාහිර පළාත් සභාව තමයි ප්‍රධානතම පළාත් සභාව. මේ උත්තරීතර පළාත් සභාව. එතකොට මට තිබෙන ගැටළුව තමයි. මේ බස්නාහිර පළාත් සභාවට නියෝජිතයෝ පත් කරලා එවන්න අපේ ප්‍රදේශයේ ජනතාව මහා උනන්දුවක් දක්වනවා. ඒ උනන්දුව දක්වලා සභාවට ආවාම සභාවේ යෝජනාවක් ගේන්න විධියක් නැහැ. සභාවේ මන්ත්‍රීතුමන්ලා නැහැ. අවස්ථා ගණනාවකදී සභාව කල් තිබ්බා, සභාවට මන්ත්‍රීතුමන්ලා ටික එකතු කර ගන්න බැරිව. එතකොට මේක ඛේදවාචක තත්ත්වයක්. මේකේ සභාපතිතුමාටත් වගකීමක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාටත් වගකීමක් තිබෙනවා. ප්‍රධානීන්ට වගකීමක් තිබෙනවා, මේ සභාව විධිමත්ව පවත්වාගෙන යන්න. අපි මේ සභාවට ආවේ, මම බස්නාහිර පළාත් සභාවට ආවේ.

ඇත්ත වශයෙන්ම කියනවා නම් මට යම්කිසි හීනමානයකුත් තිබුණා, මේ සභාවට එන්න. අපේ ආසනය දිනලා මේ තැනකට එනකොට මෙතැන තිබෙන උත්තරීතරභාවය, මෙතැන තිබෙන ප්‍රභූභාවය ගැන හිතන කොට යම්කිසි මැලිකමක් තිබුණා, මෙතැනට ඇවිල්ලා අපි කොහොමද හැසිරෙන්නේ කියලා. අපි කොහොමද මෙතැන ක්‍රියා කරන්නේ කියලා. මේ බස්නාහිර පළාත් සභාවට එන කොට අපට බලාපොරොත්තු ගණනාවක් තිබුණා. අපි මෙතැනට එනකොට අපි හිතුවා, මේ පළාත් සභාව මහා ගාම්භීර එකක් කියලා. දැන් තිබෙන ගාම්භීරත්වය ගැන මට නම් කිසිම හැඟීමක් නැහැ. අපේ සභාපතිතුමා නිවේදන ටික කිව්වාට පස්සේ මේ සභාවේ කවුරුවත් ඇත්තෙත් නැහැ. අලුත් යෝජනාවක් ගේන්න පුළුවන්කමකුත් නැහැ. මම මේ සභාවට එන්න කිලෝ මීටර් 50 ක් දුර ගෙවන්න ඕනෑ. කාලය පැය දෙකහමාරක් පමණ ගත වෙනවා. එහෙම මුදල් හදල් වියදම් කර ගෙන මේ බස්නාහිර පළාත් සභාවේ සෑම සභා වාරයකටම මම සහභාගී වෙලා තිබෙනවා. හැම කමිටුවකටම සහභාගී වෙලා තිබෙනවා. අපි එහෙම කැපවීමෙන් එන්නේ, අපට ගම්වල අහිංසක මිනිස්සු ඡන්දය දුන්නා. උඹලාව අපි මේ තනතුරට පත් කරනවා. ගිහිල්ලා අපි වෙනුවෙන් වැඩක් කරහල්ලා කියලා තමයි ඡන්දය දුන්නේ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? උදේට කෑම ටික කාපු ගමන් අපි ගෙදර යන්න ඕනෑ ආපහු අකුලගෙන. ගෙනාපු ලිපි ගොනු ටික භාර දෙන්න විධියක් නැහැ. අපට අදහසක් ප්‍රකාශ කරන්න විධියක් නැහැ. මොකක් හරි කථාවක් ගොනු කර ගෙන ආවා නම්, ඒකට මාස ගණනක් බලාගෙන ඉන්න ඕනෑ සභාවේ ගණපූරණය සම්පූර්ණ වන තෙක් කථා කරන්න. එතකොට බස්නාහිර පළාත් සභාව කියන්නේ මේකටද? සභාවේ ව්‍යුහය කියන්නේ මේකටද? මේකටද උත්තරීතර පළාත් සභාව කියන්නේ? මේකේ මීට වඩා ගෞරවයක් තිබෙන්නට ඕනෑ. අපි මෙතැනට ආවේ හොඳ චරිතයක් දකින්න. මේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරලා පාර්ලිමේන්තුව නියෝජනය කළ මහා ප්‍රතාපවත් චරිත අපි දැකලා තිබෙනවා. මිනිස්සුන්ගේ වාද විවාද අපි දැකලා තිබෙනවා. මහා කථිකාවන් අපි දැකලා තිබෙනවා. පැහැදිලි කිරීම් දැකලා තිබෙනවා. මේ එකක්වත් නැහැ. මට වෙලාවකට හිතෙනවා, මේක බාලාංශ පන්තියක් වාගේ. අයාලේ ගිය තැනක්. ඒ නිසා මේක විධිමත් කර ගන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, අපි නියෝජනය කරන්නේ, මහජනතාවගේ හඬ. අපට ඒ ගෞරවය ලැබෙන්න ඕනෑ, මහජනතාවගෙන්. බස්නාහිර පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීතුමා මේ ඇවිල්ලා ඉන්නේ. ඔබතුමන්ලාගේ බස්නාහිර පළාත් සභාවේද අහවල් තීන්දුව ගත්තේ. ඔබතුමන්ලා මෙහෙම නියෝගයක් අරගෙන තිබෙනවාද? මෙහෙම කිසිම කටයුත්තක් නැහැ. අද මේ ඉන්න මහජන නියෝජිතයෙකුවත් හරිහමන් යෝජනාවක් ගේන්නේ නැහැ. ඇයි? ගෙනැල්ලා වැඩක් නැහැ. යෝජනාව ගත්තාම, ගණ පූරණය නැහැ කථා කරන්න. ඒකට ඇහුම්කන් දෙන්න කෙනෙක් නැහැ. ඒකට බලධාරීන් නැහැ. ඔබතුමා නිකම් හිතන්න. අද මන්ත්‍රීවරු 104 දෙනෙක් ඉන්නවා. නිලධාරීන් සියලු දෙනා සහභාගී වෙන්නට ඕනෑ. ඒ වාගේම අපේ රියැදුරන් එනවා. කාර්ය මණ්ඩලය එනවා. සභා ලේකම් කාර්යාලයෙන් එනවා. ප්‍රධාන අමාත්‍ය ලේකම් කාර්යාලයෙන් එනවා. මාධ්‍යවේදීන් එනවා. මේ ඔක්කෝටම අර උදේ තේ වේල, කෑම වේල දෙන්නට ඕනෑ. මේවා මිල කළොත් කොපමණ මුදලක් යනවාද? අපට පාරක් හදා ගන්න, පාලමක් හදා ගන්න කථා කළාම මේ සභාවේ මුදල් නැහැ. නිකම් මහජන මුදල් කාබාසිනියා කරනවා කියන්නේ - අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ මේවා නේ මේ කාබාසිනියා කරනවා කියන්නේ. ඒ නිසා මේවාට අපට වගකීමක් තිබෙන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම බොහොම කනගාටුවෙන් කථා කරන්නේ. මේ පළාත් සභාවට එන්න අපට වුවමනාවක් තිබුණා. 13 වන ආණ්ඩුක්‍රම සංශෝධනය අනුව පළාත් සභා ක්‍රමය ගෙනැල්ලා බලතල බෙදලා දීලා තිබෙනවා. මම මේ බස්නාහිර පළාත් සභාවට ආවාට පස්සේ එකම එක ප්‍රඥප්තියයි සම්මත කළේ. අර ගොවිජන සේවා ප්‍රඥප්තියක් සම්මත කළා. ඒකත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ප්‍රඥප්ති සම්පාදනය කරලා තමන්ට තිබෙන බලය තමන්ට ආරෝපණය කර ගෙන, මේ බස්නාහිර පළාත් සභාව ගෞරවනීය තත්ත්වයට ගේන්න වෙන කොට එහෙම දෙයක් අපි දකින්නේ නැහැ. තරුණ මන්ත්‍රීවරු වශයෙන් අපේ බලාපොරොත්තු සියල්ල බිඳ වැටිලා. අපට තිබුණු විශ්වාසය බිඳ වැටිලා. ගාම්භීරත්වය බිඳ වැටිලා. අද ගමට ගිහිල්ලා බලු වන මන්ත්‍රීකමක් අපි මේ අරගෙන ඉන්නේ. ඒ නිසා කනගාටුයි. මම මේ කථා කරන්නේ කනගාටුවෙන්. මම මේ පළාත් සභාවේ රැස්වීම්වල කථා කරලා තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා මහ හඬින් කථා කළා. ඉරිදාට දහම් පාසල් පවත්වන්නට ඕනෑ, පෞද්ගලික පන්ති නැති කරන්න ඕනෑ. මේ පළාත් සභාවට මොකක්ද කරන්න පුළුවන්කම ලැබුණේ? මත්ද්‍රව්‍ය නැති කරන්න කථා කළා. කරන්න පුළුවන්කම ලැබුණාද? එල්ලුම්ගහ ගේන්න කථා කළා. කරන්න පුළුවන්කම ලැබුණාද? අපට කරන්න බැරි යෝජනා ගෙනැල්ලා, මතවාද ඇති කර ගෙන කථා කළා මිසක්, සභාවේ කාර්යභාරය අපි හඳුනාගෙන කථා කළේ නැහැ. සභාවේ කරන්න ඕනෑ දේ අපි කළේ නැහැ. අපේ ප්‍රදේශවල ජනතාවගේ අවශ්‍යතාවයන් පිළිබඳව අපි කථා කළේ නැහැ. එහෙම නැත්නම් තවත් කෙනෙක් යම් යම් දේවල් කථා කළා ඇරෙන්න. ඒ නිසා අපි වඩා වගකීමක් ඇති පළාත් සභාවක් බවට පත් කරන්නට ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම මෙතැන නියෝජනය කරන්නේ බස්නාහිර පළාත් සභාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ආසනය. අත්තනගල්ල ආසනය කිව්වාම ඔබතුමා දන්නවා. මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිර්මාතෘවරයා සිටිය ආසනය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිජබිමේ ඉඳන් මම මෙතැනට එන්නේ. මේ ලෝකයට අගමැතිවරු බිහි කරපු තැන. ලෝකයට ජනාධිපතිවරු බිහි කරපු තැන. අමාත්‍යවරයෙක් බිහි කරපු තැන. ඇමතිවරු බිහි කරලා පළාත් සභාවේ මන්ත්‍රීවරු හතර දෙනෙක් නියෝජනය කරන තැන. මගේ ඉතා පිටිසර ගම්මානය. අපේ හිටපු ප්‍රාදේශීය ලේකම්තුමා ඉන්නවා. ගම වටේට අත්තනගලු ඔය ගලනවා. පාලම් තුනක් තිබෙනවා. ඒවා කඩාගෙන වැටිලා. මම ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය දරන කාලයේ එක පාලමක් හදා ගත්තා. ඊළඟ පාලම බිම. ඔයට වැටිලා තිබුණු පාලම උස්සලා හදා ගත්තා. අද රෙදි ඇඳගෙන ගමේ ඉන්න විධියක් නැහැ. පාලම ඔයට කඩා ගෙන වැටිලා. කියන්න තිබෙන හැම බලධාරියාටම කිව්වා. කියන්න තිබෙන හැම කෙනා ළඟටම ගිහිල්ලා කිව්වා. ඉංජිනේරු කාර්යාලයට ගිහිල්ලා කිව්වා. සැලසුමක් හදා ගන්න පුළුවන්කමක් නැහැ. මගේ මන්ත්‍රීකම බල්ලාට දාන්නට ඕනෑ. තමන්ගේ ගමේ තිබෙන ඔයෙන් එගොඩ වෙන්න තියෙන පාලම හදා ගන්න බැරි නම් මම මේ බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්නේ මොකටද? ඊයේ මම කණ්ඩායම් රැස්වීමේදීත් නැගිටලා කිව්වා. මම මේ කැප කිරීමක් ඇතිව මේ බස්නාහිර පළාත් සභාවට එන මන්ත්‍රීවරයෙක්. මේක කිව්වාම මට කිව්වේ, ඔබතුමා කොළඹින් නිල නිවසක් ගන්න කියලයි. මේ ඇමතිවරුන්ට කථා කළාම ඒ අය කිව්වා, අපට සත පහක් නැහැ. අපේ ඇමතිකම නමට විතරයි තිබෙන්නේ කියලා. එහෙම පළාත් සභාවක් නියෝජනය කරන්නද අපි ආවේ? අපේ මිනිස්සුන්ට ගහන්න ඕනෑ මඩු වලිගෙන් අපව පත් කරලා එවනවාට. අපට වැඩක් කරන්න බැරි නම්, අපි මොකටද මේකට එන්නේ? මේ කෝටි ගණන් මුදල්වලට මොකද වෙන්නේ? එහෙම නම් ඇයි අපට ඒ කාර්යයන් කර ගන්න බැරි? කනගාටුවක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඒ නිසයි මම මේ කථා කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා. මම දන්නවා, ඔබතුමා වේදනාවෙන් කථා කරන්නේ. නමුත් මට කරන්න දෙයක් නැහැ. කාලය ඉවරයි.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාත් සභාවේ හඬ සිරස කියලා මිනිස්සු හිතනවා ඇති. මේ අපේ හඬක් පෙන්වන්න තැනක් නැහැ. කියන දෙයක් පත්තරේක යන්නේ නැහැ. සිරස මාධ්‍යයි කිඳෙල්පිටිය මන්ත්‍රීතුමායි කියලා හිතනවා ඇති බස්නාහිර පළාත් සභාව. ඊට වඩා වේදනාත්මක තත්ත්වයන් අපට තිබෙනවා. ඒ නිසා අපි වඩා වගකීමෙන් මේ බස්නාහිර පළාත් සභාවේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

යහපාලනයට එන්න. එතකොට හම්බ වෙයි ප්‍රතිපාදන ටිකක්. යහපාලනයට එන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

දේශපාලන මතයක් නොවෙයි, මම කථා කළේ. යහපාලනය කරන අයත් අපේ පළාත්වල ඉන්නවා. නමුත් කරපු දෙයක් නැහැ. අපි වැඩ කරපු මිනිස්සු. ඒ නිසා අපට උවමනාවක් තිබෙනවා. ඒකයි මම කියන්නේ. මේ බස්නාහිර පළාත් සභාවට ඇවිල්ලා, අපි අයාලේ ගිහිල්ලා අවාරෙට අඹ වැටෙන්නා වාගේ එන්නේ නැහැ. ඇවිල්ලා නියෝජනය කරලා අපේ අයිතිය ඉල්ලන්නේ. අපේ වුවමනාවක් මේ කථා කරන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා අපේ ප්‍රදේශයේ ජනතාව ගැන අනුකම්පා කරලා, අපේ ගමේ ඉන්න අහිංසක උපාසකම්මලා ගැන, දහම් පාසල් යන දරුවන් ගැන, පාසල් යන දරුවන් ගැන, අහිංසක මිනිසුන් ගැන හිතලා අපේ අර ගමේ පාලම හදලා දෙන්න මැදිහත්වීමක් වෙන්නය කියලා මම ගරු ඔබතුමාගේ මාර්ගයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා ඉතාම වැදගත් ප්‍රකාශයක් කළේ. පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගැටළු සම්බන්ධව ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම ඇත්තටම මේ පිළිබඳව සභා වාර ගණනාවකදීම කථා කළා. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මේ අපි කථා කරන දේවල් සත පහකට ගණන් ගන්නේ නැහැ. අපි අධ්‍යාපන අමාත්‍යාංශයට ලියුමක් යැව්වත්, ඒවාට උත්තර නැහැ. ගරු සභාපතිතුමනි, පැහැදිලිවම මේක මේ සියලුම මන්ත්‍රීවරුන්ට අදාළ දෙයක්. බස්නාහිර පළාත් සභාවේ අපි අධ්‍යාපන අමාත්‍යාංශයේ අඩුපාඩු එකින් එකට පෙන්වලා දුන්නා. පෙන්වලා දුන්නාට, අධ්‍යාපන අමාත්‍යාංශය තුළ මේවා ගැන කිසිම දෙයක් වෙන්නේ නැහැ. අමාත්‍යාංශයට ගියාට පස්සේ අපේ ලියුමක් භාර දුන්නාට පස්සේ සාමාන්‍ය ජනතාව නොවෙයි, මේ මන්ත්‍රීවරයෙකුගේ ලියුමකට පවා උත්තරයක් නැහැ. පළමුවන පාර දෙනවා. දෙවැනි පාර දෙනවා. ඊට පස්සේ ඒක නැති වුණා කියන කොට ඊළඟ පාරත් දෙනවා. ඉතින් මේ විධියට වෙන කොට ගරු සභාපතිතුමනි, අපේ පාසල් පද්ධතිය කවදාවත් නැති විධියට අද වැටෙනවා. අද උදාහරණයකට ගත්තාම - අපි ඇහුවා, මේවාට මොකක්ද කරන්නේ කියලා. අද පාසල්වල ගුරුවරු නැහැ. පාසල්වල විශාල වශයෙන් ගුරු පුරප්පාඩු තිබෙනවා. ගරු සභාපතිතුමා හරහා මම ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියන්න කැමැතියි. උදාහරණයක් හැටියට ගත්තාම හොරණ කලාපයේ විතරක්, මේ බස්නාහිර පළාතේම නොවෙයි. හොරණ කලාපයේ විතරක් සිංහල (බාධා කිරීමක්)

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභා දෙකක් තියන්න එපා. එකක් තියන්න. (බාධා කිරීමක්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා තර්ජනය කළේ, නිමල මරියා එකට ගිහිල්ලා නේ? තුඩැල්ලේ නිමල මරියා එකට ගිහිල්ලා සල්ලි දෙන්නේ නැහැයි කියලා තර්ජනය කළා. පෙරේදා. දවස් තුනකට ඉස්සෙල්ලා. මේ බිල්ඩිමට සල්ලි දෙන්නේ නැහැයි කියලා කිව්වානේ ගිහිල්ලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර පත්තරේත් තිබුණේ ඔය කථාව තමයි. කියන්න කෝ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පත්තරේ නිමල මරියා කියලා දාලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොහේදීද තර්ජනය කළේ කියලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ. කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු ඔබතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධීක්ෂණ මන්ත්‍රීතුමා මෙතුමා. මෙතුමාගෙන් ගුරුවරු -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නිමල මරියා එකට දුන්නාම - ගමේ ඉස්කොලේ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිමල මරියා එකට අපි දෙනවා. හය වෙන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දෙනවා. දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕගොල්ලෝ දුන්නාට වැඩිය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගරු සභාපතිතුමනි, මේක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ දවස්වල මෙතුමායි නිමල් ලාන්සා ගරු ඇමතිතුමායි හැප්පුනා. දැන් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා එක්ක. හරිම ප්‍රශ්නයක් මේක. ගිය පාර ජා-ඇළයි මීගමුවයි. මේ පාර ජා-ඇළයි, ජා-ඇළයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අයියයි මල්ලියි දෙන්නාම දුන්නාම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගියවර නිමල් ලාන්සා ඇමතිතුමායි ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමාගේයි ප්‍රශ්නය තිබුණා. දැන් මේ පාර මෙරිල් පෙරේරායි ඔබතුමායි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. මේ ඉස්කෝලවලට සල්ලි දෙන්නේ නැහැයි කියන ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අධීක්ෂණ මන්ත්‍රීතුමා නේ? මම දන්න විධියට මම හිතන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා බලා ගන්න එපැයි කම්ප්ලේන් කරපු එක්කෙනා ගැන. මෙතුමාගේ කාලයේ ඉඳන්ම අධීක්ෂණය කළානේ ඉස්කෝල ඔක්කොම ටික.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි ආණ්ඩු පක්ෂයේ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාත් ඕනෑ නම් සම්බන්ධ වෙන්න අපේ ඇමතිතුමාට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාගේ ගුරා නේ? කර ගන්න එපැයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා ගෙදර ගියා. ඒකයි අමාරුව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ ගැන කථා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අයියයි මල්ලියි ගෙදර ඇරියා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේගේ ගෝලයා නේ තමුන්නාන්සේ ගෙදර ඇරියේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හයේ ඉන්නේ. මොකද, පීලික්ස් ඇමතිතුමා තවම දෙන්නේ නැහැ. ඒකයි වැඩේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් මේක අවසන් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතැන ඉන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔව්. ඉතින් ඔයා පුළුවන්තරම් - තවම හරි ගියේ නැහැ නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජා - ඇළින් ගෙදර ඇරියා ලොකු දෙන්නා. දැන් මෙයා හයේ ඉන්නේ මෙයාවත් ගෙදර යවයි කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක අපි බලාගමු කෝ ඊළඟ ඡන්දේ ආවාම.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාවින්දට ඔපමණ හය වෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි හය නැහැ. අපි කාවින්දත් එක්ක එකතු වෙලා යමු කියලා අපිද කිව්වේ ජා-ඇළ. සිමෙන්ති කොට්ට බෙදන්න ගිහිල්ලා. අපි එකතු වෙලා යනවා කියලා මෙතුමානේ කිව්වේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔය මයික්‍රෆෝනය වහන්න. ඔබතුමා ලස්සනට සභාවට ඇඳගෙන එනවා. යුරෝපීය ඇඳුමක් ඇඳගෙන එනවා. ඇවිල්ලා හැසිරීමට අන්තිමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාවින්දව යොවුන් පෙරමුණේ නායකයා කළා විතරයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් අපි අහලා තිබෙනවා, යුරෝපීය ඇඳුම් අඳින අය බොහොම ගෞරවාන්විතව සිටිනවා කියලා. ටයි කෝට් දාන කට්ටිය. ඔබතුමා එහෙම නැහැ නේ? මට පේන්නේ ඔබතුමා මේ ඇඳුමටත් අගෞරවයක් කරන්නේ. ඔබතුමා සභාවට ගරු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එල්ලෙන්න වැලක් නැතිව ඉන්නේ. කාගේ හරි ඇගේ එල්ලෙන්න හදන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අගමැතිතුමා කාවින්දව යොවුන් පෙරමුණේ නායකයා කළා. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එතුමාගේ පොඩි ප්‍රශ්නක් තිබෙනවා. ඒ දවස්වල ලාන්සා ඇමතිතුමා එක්ක හැප්පුනා. දැන් ඔබතුමාත් එක්ක. අපි ගණන් ගන්නේ නැහැ ඒක. ඒක ප්‍රශ්නයක් නැහැ. ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔගොල්ලොන්ගේ ප්‍රශ්න ඕගොල්ලෝ බලා ගන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා, දැන් නවත්වන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කාවින්ද භීතිකාව තිබෙන්නේ. දැන් භයයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මහින්දගෙනුත් කැපිලා ඉන්නේ දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සාමාන්‍යයෙන් මම හිතනවා, යුරෝපීය ඇඳුම් අඳින අය බොහොම ගෞරවාන්විතව ඉන්නවා කියලා. මට පේන්නේ නැහැ ඔබතුමා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි කැපුනා. තාත්තා ගෙදර ගියා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දවල්ට මහින්ද ළඟ. රෑට මෛත්‍රී ගාව ඔයා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා ගෙදර නේ? වැඩක් නැහැ නේ? තාත්තා ගෙදර.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රෑට මෛත්‍රී ගාව ඉන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා ගෙදර නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රෑට මෛත්‍රීපාල සිරිසේන ළඟ මෙයා ඉන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ජා - ඇළ ප්‍රශ්න මේ සභාවට ගේන්න එපා. ඒවා වෙන ප්‍රශ්න. බස්නාහිර පළාත් සභාව මේක. දෙන්නාම නිශ්ශබ්ද වන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර ලාන්සාටත් වුණේ ඔය ටිකම තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ඉතින් ලාන්සා පාර්ලිමේන්තු ගියා. ඇමතිවරයෙක් වුණා. ප්‍රශ්නයක් නැහැ නේ ඉතින්. කරුණාකර දැන් නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම කියාගෙන ආවේ බස්නාහිර පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධව අපි කනගාටු

[ ගරු ලලිත් එල්ලාවල ]

වෙනවා. මේ අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධව මම සභා ගණනාවක කථා කරලා තිබෙනවා. සභා ගණනාවක කථා කළත්, මේවා නිවැරදි වන පාටක් අපට පේන්නම නැහැ. මොකද, අපේ ජනතාව අපට දෙන ප්‍රශ්න පිළිබඳව අපි අමාත්‍යාංශයට දුන්නාම - මම ගරු ඇමතිතුමාත් එක්ක පුද්ගලිකව කථා කරලා තිබෙනවා. අඩු ගණනේ මේවාට උත්තරයක් දෙන්න, අපට ජනතාවට මේවා කියන්න. මෙන්න මේකයි උත්තරේ කියලාවත් කියන්න. වැඩේ කරන්න බැරි නම්, කරන්න බැහැයි කියලා ලියුමක් එවන්න. අද සාමාන්‍ය ජනතාව නොවෙයි. මන්ත්‍රීවරයෙක් අධ්‍යාපන අමාත්‍යාංශයට, ඇමතිතුමාට, කාර්ය මණ්ඩලයට ලිපියක් දුන්නාට, උත්තරයක් එන්නේ නැහැ. අපේ ලියුම් දුන්නාම විටින් විට නැති වෙනවා. මෙය මහා කනගාටුදායක තත්ත්වයක්. ඒ විතරක් නොවෙයි. මම විශේෂයෙන්ම හොරණ කලාපයේ ඉන්න නිසා හොරණ කලාපයේ අධ්‍යාපනය සම්බන්ධව පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබෙනවා. මෙතුමා දන්නවා. මෙතුමා දැනුත් ඉන්නේ අපි කියන දේවල් අහගෙන නොවෙයි. ගරු ඇමතිතුමා දැනුත් ඉන්නේ අපි කියන දේවල් අහගෙන නොවෙයි. ගරු සභාපතිතුමනි, අමාත්‍යාංශයට ගියාමත් මේකයි තත්ත්වය. හරිද? දැන් මෙතැන අපි කථා කරන කොටත් සත පහකට අපි කියන දේවල් ගණන් ගන්නේ නැහැ. ගරු සභාපතිතුමනි, මම මේකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වෙනවා. මගේ විරෝධය පළ කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඕනෑ එකක් කරන්න පුළුවන්. ඕනෑ දෙයක් කියන්න පුළුවන්. මේක අහන්න ඕනෑ. මේ සභාවේ ඉන්න සියලුම මන්ත්‍රීවරු දන්නවා. මම වැඩ කරන්නේ කොහොමද කියලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද කලාප කාර්යාලයේ ගුරුවරු නැහැ. අද දරුවන්ට - අධ්‍යාපන ඇමතිතුමා

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

තම තමන්ගේ පුද්ගලික දේවල් මෙතැන කථා කරන්න එපා. අමාත්‍යාංශයේ චක්‍රලේඛ තිබෙනවා. එතුමා කියන්නේ, කොට්ඨාශ අධ්‍යක්ෂ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේවා කණ්ඩායම් රැස්වීමේදී බේරා ගන්න. කණ්ඩායම් රැස්වීමක් තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මෙයා මේ ලකුණු දා ගන්න. මේ ටීවී එකට පේන්න දාන්නේ. මේවා කැත වැඩ. අපි බොහොම අවංකව වැඩ කරලා තිබෙනවා.

[සභාවේ ඝෝෂා]

ඔයා මේ ලකුණු දාන්න කථා කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද විහිළුවක් වෙලා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මට 36(1) යටතේ කියන්න ඕනෑ. මේක හරි -

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි කියන දෙයක් සත පහකට ගණන් ගන්නේ නැහැ. ගරු සභාපතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, නියෝගයක්

කරන්න, අඩුම වශයෙන් අපි කියන දේ අහගෙන ඉන්නය කියලා. අහගෙන ඉන්නේවත් නැහැ. (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය මෙරිල් මන්ත්‍රීතුමාට කියන්න කෝ. කරලා දෙයිනේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට විනාඩියක් දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අපි කියන දේ අහගෙනවත් ඉන්නේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාට දෙනවා. හැබැයි, 36(1) යටතේ දෙන්න පුළුවන්, වරප්‍රසාද කඩ වීමක් වුණා නම්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔව්. 36(1) තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් වාඩි වෙන්න කෝ? ඔබතුමා මට කෙටියෙන් ඒ කාරණාව කියන්න කෝ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ වාගේ ප්‍රශ්න ගරු සභාපතිතුමනි, කණ්ඩායම් රැස්වීමේදී යොමු වෙනවා නම් තමයි වැඩියෙන්ම හොඳ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කණ්ඩායම් රැස්වීමට එන්න එපැයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ආවා. ඊයේ ඔබතුමා ආවාද? අපි ආවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඊයේ ආවේ නැති වුණාට මම කී ගමනක් ආවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම දෙසැරයයි කණ්ඩායම් රැස්වීමට ඇවිල්ලා නැත්තේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගැටුම්වලට යන්න එපා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කණ්ඩායම් රැස්වීමට ඇවිල්ලා නැතිව ප්‍රශ්න විසඳෙයිද?

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, ඒක ඇත්ත නේ? කණ්ඩායම් රැස්වීමට ඇවිල්ලා නැත්නම් මෙතැනවත් අඩුම ගණනේ අහගෙන ඉන්න එපැයි. මෙතුමා, ඒ වෙලාවෙත් කථා කරනවා නේ? (බාධා කිරීම්) මෙතුමා කථා කරද්දී ඔබතුමා කථා කර කර හිටියා.

[සභාවේ ඝෝෂා]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, උපදේශක කාරක සභා තිබෙනවා. ආරාධනා කරනවා. මේ එන සියලුම දෙනාට මම හොඳින් කන් දෙනවා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට අපි නිතරම කථා කරනවා. වගකීම පවරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක හරිම කනගාටුදායක තත්ත්වයක්. මේ පළාත් සභාවේ ඇමතිවරු හැල්ලු වෙනවා. මටත් දුකයි. මේ විධියට මේක වෙන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක අසාධාරණයි නේ? අධ්‍යාපනයේ ඉතිහාසයත් එක්ක මට කියා දෙන්න පුළුවන් මිනිහෙක්. මමත් මේකේ හිටියා නේ? (බාධා කිරීම්) ඔය කියන කථා පහුගිය කාලයේ - මම කාටවත් මඩ ගහන්නේ නැහැ. ඒකයි ප්‍රශ්නය තිබෙන්නේ. මඩ ගහන්නේ නැති එකයි ප්‍රශ්නය. මම අවංකව වැඩ කරන හින්දා. මේ ඕනෑම මන්ත්‍රීවරයෙක් නැගිටලා කියන්න මම ඇහුම්කන් දුන්නේ නැද්ද කියලා. මේ විපක්ෂයේ අය ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණේ අය ඉන්නවා. අධ්‍යාපනයේ ප්‍රශ්න තිබෙනවා. නැත්තේ නැහැ. නැගිටලා කියන්න. අවංකව. ප්‍රශ්න තිබෙන බව ඇත්ත. හැබැයි, හැමදාම උදේ ඉඳන් රෑ වෙනකල් මේකට කැප වෙලා වැඩ කරනවා. මේ කොට්ඨාශ අධ්‍යක්ෂවරයෙකුගේ පත්වීම සම්බන්ධව ගැටළුවක් තිබෙනවා. ඒක මට ගිය සතියේ ඉදිරිපත් කළාම මම කිව්වා. මේක ඇත්ත කථාව ගරු සභාපතිතුමනි. එක පැත්තකින් නිමල් චන්ද්‍රරත්න මහත්තයා කියනවා, මෙයාව දීර්ඝ කරන්න. ඔය අපේ නිලධාරීනුත් අහගෙන ඉන්නවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එහිදී අපි මන්ත්‍රීවරු තුන් දෙනෙක් අත්සන් කරලා ඔබතුමාට ලියුමක් දුන්නා. නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමාගේ ඉල්ලීමට විතරක් ඒක කළා. ඒක වැරදියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට කාලය දෙන්න බැහැ. පැහැදිලි කිරීම්වලට ඉඩ දෙන්න බැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මේ කියන්නේ අමූලික බොරු. මට නිමල් චන්ද්‍රරත්න ගරු මන්ත්‍රීතුමා - මම දැන් එහෙම ප්‍රශ්නයක් කථා කළෙත් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් කාලයත් ඉවරයි. තව විනාඩියක් දෙන්නම්. ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්න විනාඩි 04 ක් ගත්තාම ඒ විනාඩි හතරේදී ඇමතිවරයෙකුට අහගෙන ඉන්න බැරි නම් ඇමතිවරයාගේ දුර්වලකමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා අහගෙන ඉන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇමතිතුමා අහගෙන හිටපු නැති නිසා තමයි මේ වැරදි උත්තර දෙන්නේ. මම දැන් කොට්ඨාශ අධ්‍යක්ෂක ගැන කථා කළේවත් නැහැ නේ? මම මේ කියාගෙන ගියේ ඒක නොවෙයි නේ? ඒවා ගැන මම කථා කළේ නැහැ. ගරු සභාපතිතුමනි, මම කියාගෙන ආවේ දැන් හොරණ කලාපයේ විතරක් සිංහල, දෙමළ මාධ්‍යවලට ඉංග්‍රීසි 43 ක ගුරු පුරප්පාඩුවක් තිබෙනවා. ඒකත් එක්කම ගණිතය විෂයේ 30 කට වැඩිය ගුරු පුරප්පාඩු තිබෙනවා. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් අහගෙන ඉන්න. ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, හොරණ කලාපයේ විතරක් ඉංග්‍රීසි ගුරුවරු 43 ක පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම ගණිතය ගුරුවරුත් 30 කට වැඩිය පුරප්පාඩුයි. ඒ වාගේම විද්‍යා

ගුරුවරු 32 කට වඩා පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම ප්‍රාථමික ගුරුවරු 60 කට වඩා පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම මච්බස 19 කට වඩා පුරප්පාඩු තිබෙනවා. ඒ වාගේම සෞන්දර්ය, චිත්‍ර 18 කට වඩා පුරප්පාඩු තිබෙනවා. ප්‍රසූත නිවාඩු යන විශාල පිරිසක් ඉන්නවා. මේ පුරප්පාඩු මේවාත් එක්ක කොහොමද විදුහල්පතිවරු මේ පාසල් පවත්වාගෙන යන්නේ? අද ගම් මට්ටමේ පාසල් වැහෙන තත්ත්වයට ඇවිල්ලා.

මෙතුමා මතක් කළ හින්දා කියන්නේ. මෙතුමා කොට්ඨාශ අධ්‍යක්ෂ කෙනෙක් ගැන කියපු හින්දා කියන්නේ. ගරු සභාපතිතුමනි, කොට්ඨාශ අධ්‍යක්ෂ පෙන්ෂන් ගියා. පෙන්ෂන් ගියාම මෙතුමාගේම අධ්‍යාපන කාර්යාලයෙන් වාර්තා දෙනවා - බණ්ඩාරගම කොට්ඨාශයේ අධ්‍යාපනය වැටිලා තිබෙන වැටිල්ල දැකලා ආසනයේ ඉන්න මන්ත්‍රීවරු වැඩි පිරිසක් මේක කියන කොට - අපි කිව්වේ නිමල් චන්ද්‍රරත්න මන්ත්‍රීතුමාවත්, කවුරුවත් කියන කෙනෙක් දාන්න කියලා නොවෙයි. හොඳ සුදුසුකම් ලත් කෙනෙක්ව කොට්ඨාශ අධ්‍යක්ෂ කරන්නය කියලා. කොට්ඨාශ අධ්‍යක්ෂ කරන්න කිව්වාම මෙතුමා කරන්නේ මොකක්ද? අර 60 පැනපු එක්කෙනාව දීර්ඝ කරනවා. මේ අධ්‍යාපනය වට්ටපු කෙනාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, තවත් කාලය දෙන්න අමාරුයි.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසයි ගරු සභාපතිතුමනි අපි මෙපමණ කථා කරන්නේ. මම කියන්නේ අධ්‍යාපනය විනාශ කරන්න එපා. අධ්‍යාපනය විනාශ කරන්නේ නැතිව බැරි නම් මේක දාලා යන්න කියලයි අපි කියන්නේ ගරු සභාපතිතුමනි. (බාධා කිරීම්)

**ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔය නිශාන්තට දුන්න ගේම තමයි දෙන්න යන්නේ. ගිය සැරේ නිශාන්තට දුන්නා. මේ පාර සෝමවංශට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. මේවා අපේ ආණ්ඩු පක්ෂයේ ප්‍රශ්න. ඒ නිසා මේ ගැන තව කථා කරන්න යන්නේ නැහැ. මම ඉතාම ගෞරවයෙන් ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මේ ප්‍රශ්න සභාවට ගේන්න අවශ්‍ය නැහැ. ඇමතිවරු ඇහුම්කන් දෙන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයේ (බාධා කිරීම්) කනගාටුදායක තත්ත්වයක් මේක. මීළඟට ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, හොරණ මූලික රෝහල කියන්නේ, කළුතර දිස්ත්‍රික්කයේ (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමන්ලා දැනුත් ආදර්ශවත් වෙන්න කෝ? අර ගරු මන්ත්‍රීවරයෙක් කථා කරනවා. මෙතැන සාකච්ඡාවක්. මේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා තමයි ඔක්කොම කරන්නේ. ඔක්කොම කට්ටිය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්න ඔබතුමා හරියට අල්ලා ගත්තා කවුද කරන්නේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පේන හැටියට ඔබතුමා තමයි මේවාට මුල. (බාධා කිරීම්)

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ හැම දේම පිටිපස්සේ ඉන්නේ මෙරිල් මන්ත්‍රීතුමා. සියලු කුමන්ත්‍රණ පිටිපස්සේ ඉන්නේ මෙරිල් මන්ත්‍රීතුමා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාපතිතුමාගේ උපදෙස් පිට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කළුතර දිස්ත්‍රික්කයේ අය ඉන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, හොරණ මූලික රෝහල කියන්නේ මම හිතන්නේ, කළුතර දිස්ත්‍රික්කයේ තිබෙන මධ්‍යම රජයේ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. දැන් කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රශ්න තිබෙන්නේ. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රශ්න මොකුත් නැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

නාගොඩ රෝහල හැරුණාම පානදුර හා සමාන විශාල මූලික රෝහලක්, හොරණ රෝහල කියන්නේ. නමුත් ඒ තුළින් වන සේවය පිළිබඳව අපට ඇත්තටම සෑහීමකට පත් වෙන්න බැහැ. මොකද, පුදුමාකාර අඩුපාඩු ටිකක් එක්ක තමයි ඒ රෝහල පවතින්නේ. මම පෙරෙයිදා රෑ මෘත දේහයක් භාර ගන්න ගිහිල්ලා හිටියා. ඒ ඉන්න කොට බයිසිකල් දෙකක් හැප්පිලා හතර දෙනෙකුව අරගෙන ආවා. ඊට පස්සේ තව පොඩ්ඩක් වෙලා යන කොට තවත් බයිසිකල් තුනක් එකට හැප්පිලා හය දෙනෙකුව අරගෙන ආවා. බුලත්සිංහල ප්‍රදේශයෙන් අරගෙන ආවේ. අරගෙන ආවේ වාහන දෙකක. ඒ අය බොහොම කඩිනමින් රෝහලට ඒ රෝගීන් ටික අරගෙන එන කොට රෝහලේ ඉස්සරහා ඉඳලා ඇතුළට ගෙනියන්න මනුස්සයෙක් නැහැ. වගකියන කෙනෙක්. ඒ අය ට්‍රොලි සොයන්න එහෙට මෙහෙට යනවා. මම මෙය මතක් කළේ, අපි යම්කිසි සේවාවක් දෙනවා නම්, ඒක මුල ඉඳලාම ඒ තුළ පැහැදිලිතාවයක් අපට තිබෙන්න ඕනෑ. සමහර වෛද්‍යවරු ඉන්නවා. හැමෝම නොවෙයි. ලෙඩෙක් මැරුණොත් එහෙම ඔහුට සාමාන්‍යයෙන් එක ලෙඩෙක් විතරයි. එක මැරුණු කෙනෙක් විතරයි. නමුත් ඒ මැරුණු කෙනාගේ වගකීම, මැරුණු කෙනාගේ පාඩුව ඒ පවුලේ දරුවන්ට, ඒ පවුලේ අයට තමයි තිබෙන්නේ. එහෙම වෙන කොට තමන් ගේන ලෙඩා ගැන -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, මේවා උපදේශක කාරක සභාවේ කථා කරන්න ඕනෑ ඒවා. තේරුමක් නැහැ නේ? මේ වටිනා කාලය මේවාට මිඩංගු කරලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්න මේ තිබෙන්නේ. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රශ්න මේවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මම උපදේශක කාරක සභාවේ නැහැ. පොදු ප්‍රශ්නයක්. රෝහලක් ගැන කථා කරන්නේ. පොදු ප්‍රශ්නයක්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේ සභාවේ මීට වඩා වැඩ තිබෙනවා, අපට කථා කරන්න. උපදේශක කාරක සභාවේ මේවා කථා කරන්න. මේ ඇමතිතුමාත් ඉන්නවා. එකට කථා කරලා විසඳගන්න පුළුවන් ප්‍රශ්න ඔක්කොම මෙතැන කථා කළේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඇමතිතුමාටත් කරන්න බැරි දේවල් -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේක සභාවක්. වටිනා කාලය -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මෙතුමා නේ ගන්නේ මගේ කාලය.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මොකක්ද මේකේ තේරුම?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමා නේ අපේ කාලය ගන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි. මේ ප්‍රශ්නය ඉතින් උපදේශක කාරක සභාවට යන්න ඕනෑත් නැහැ. ඇමතිතුමාට කිව්වා නම්, ඇමතිතුමා වැඩේ කරලා දෙයි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

බැහැ. ඇමතිතුමාට කරන්න බැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

කණ්ඩායම් රැස්වීමේ කථා කරන්න ඕනෑ ඒවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, කනිෂ්ට සේවකයෝ නැහැ. මම මේ කියාගෙන ආවේ කනිෂ්ට සේවකයෝ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කනගාටුදායකයි මේ තත්ත්වය. සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නෙත් කළුතර දිස්ත්‍රික්කයේ. ලොකු එක්කෙනා. පොඩි එක්කෙනත් කළුතර දිස්ත්‍රික්කයේ. ඇමතිවරු දෙන්නයි සෞඛ්‍යයට. අඩුපාඩු තිබෙනවා. ගරු මන්ත්‍රීතුමා, සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නෙත් කළුතර දිස්ත්‍රික්කයේ. පළාත් සෞඛ්‍ය ඇමතිතුමා ඉන්නෙත් කළුතර දිස්ත්‍රික්කයේ. ඕවා ප්‍රශ්න ද? එහෙන් ප්‍රශ්න විසඳගන්න. මෙහේ ගේන්න එපා ඒවා. දෙන්නාම ඉන්නවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එහෙම විසඳගන්න -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

කළුතර මන්ත්‍රීවරයෙක්. ටෙලිෆෝන් එකෙන් කථා කරන්න පුළුවන්.

**ගරු යූ.එල්.එන්.පී. උඩවෙල**
Hon. U.L.N.P. Udawela

මේ කූට ව්‍යාපාරයක් යන්නේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එතුමා මේක භාර අරගෙන වැඩි කාලයක් නැහැ. එතුමා වැඩ කොටසක් කර ගෙන යනවා. මටත් තිබෙන්නේ ඔබතුමන්ලාගේ අයිතියම තමයි. අපිත් ඡන්දයෙන් ඇවිල්ලා තිබෙන්නේ. මිනිස්සු වෙනුවෙන් කථා කරන්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අද දවසේ මොකක්ද මේ කරන විකාරේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඔබතුමා මොකක්ද කථා කරන්න කියන්නේ? මිනිස්සු වෙනුවෙන් කථා කරන්නේ. පොදු දෙයක්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේවාට ඉඩ දෙන්න එපා. න්‍යාය පත්‍රය කැලේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒකට මම මොකද කරන්නේ?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ඔය කථා කරපු එකක්වත් සාධාරණ නැහැ නේ?

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

නැත්තේ මොකද?

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේවා ගෙදර විසඳගන්න පුළුවන් ප්‍රශ්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මම කියන්නේ මේ ලෙඩ්ඩු මැරෙන එක ගැන නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඔක්කොම කථා කරන්න ගියාම මේ වැඩේ කරන්න බැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

උපදේශක කාරක සභාවක් තිබෙනවා. ඇමතිවරයා ඉන්නෙත් ගමේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ න්‍යාය පත්‍රයේ තිබෙනවා පෞද්ගලික පැහැදිලි කිරීම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පෞද්ගලික පැහැදිලි කිරීම් නවත්වන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

කණ්ඩායම් රැස්වීම්වල කථා කරන ඒවා නේ මේ කථා කරන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නම් ෆයිරෝස් මන්ත්‍රීතුමාත් කථා කරන්න ඕනෑ කණ්ඩායම් රැස්වීමේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා කෙටියෙන් කියන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

මේ තමුන්ගේම ඇමතිවරුන්ට මඩ ගහනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

බස්නාහිර පළාතේ රෝහලක් ගැන මම කථා කළේ. ඔබතුමාට මේ -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න. 36(1) යටතේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මේක දිගටම කර ගෙන යන්න බැහැ. මේ ඇමතිවරුන්ට මඩ ගහන එකක් මේ කරන්නේ. උදේ ඉඳන් පටන් ගත්ත වෙලාවේ ඉඳන් ඇමතිවරුන්ව තෝරා ගෙන -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය 36(1) ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) තමයි. වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ වරප්‍රසාද කඩ වෙන්නේ. අපේ යහපාලන රජයට මඩ ගහන වැඩක් මේ කරන්න හදන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ෆයිරෝස් මන්ත්‍රීතුමා ගැහුවේ මඩ නොවෙයිද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේගොල්ලන්ට අද වැඩක් කර ගන්න බැරි වෙලා තිබෙන්නේ. මේගොල්ලන්ට පක්ෂයක් නැහැ. ඒකයි තිබෙන ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) ට ඒවා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අලුත් පක්ෂයක් හදා ගන්න බැරිව මේ යහපාලන රජයට මඩ ගහන එකයි බලාපොරොත්තුව. (බාධා කිරීම්) ඔබතුමා දැක්කා නේ මෙරිල් මන්ත්‍රීතුමායි මේක මෙහෙයවන්නේ. කරුණාකරලා මේක නවත්වන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ලේකම්තුමා, මේ සභාව ගෙනියන්න ඔබතුමා සභාපතිතුමාට උපදෙස් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේක හරියනවාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක කරන ගමන් මෙරිල් මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද ටික ඔක්කොම ගන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමා 3(1) කියලා අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කාණු ටික හදා ගන්නවා. බෝක්කු ටික හදා ගන්නවා. රස්සාවල් ටික ගන්නවා. මේ අනික් මන්ත්‍රීවරු ටික -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි ජෝර්ජ් ගන්නවා කිව්වේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගමේ ප්‍රශ්න මෙහෙට ගේන්න එපා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මට රැකියාවක් හම්බ වුණා. රියැදුරු රැකියාවක්. ඒක වෙබ් සයිට් එකෙත් ගිහිල්ලා. ඉන්ටර්විව් ගිහිල්ලා AG ඔෆිස් එකට ගිහිල්ලා රුපියල් 250 බැඳලා නීත්‍යානුකූලව කථා කරලා ගත්ත දෙයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. අනවශ්‍ය විවාදවලට යන්න දෙන්න බැහැ. කරුණාකර මන්ත්‍රීවරු නිශ්ශබ්ද වන්න. කරුණාකර ගරු මන්ත්‍රීවරු වාඩි වෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමා, මම මේ බොහොම ගරුත්වයෙන් කථා කරන්නේ. මීට වැඩිය ප්‍රශ්න තිබෙනවා, විපක්ෂයේ ඉන්න අපට. නමුත් අපි මේ වාගේ ඇදගෙන දහලන්නේ නැහැ නේ. අපි කථා කළොත් අපට වන අඟහිඟකම් අනන්ත තිබෙනවා.නමුත් අපි මහ ඇමැතිතුමාත් එක්කත් Blance කරගෙන ඒ ප්‍රශ්න විසඳගෙන පුළු පුළුවන් විධියට සාධාරණව යනවා. අපි ඒවා මේකට ඇදලා දාන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි ගරු මන්ත්‍රීතුමා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

දැන් සෞඛ්‍ය ගරු ඇමැතිතුමා පසුගිය දවස්වල රැකියාවල් දීලා තිබෙනවා, කළුතර අයට. අපි නිකන්වත් කථා කළාද මෙතැනට ඇවිල්ලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා අදාළ නැහැ නේ. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි කථා කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රස්සාවල් ඔක්කොටම දෙන්න බැහැ නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපි ඒවා කථා කරලා Blance කර ගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

40 ක් දීලා තිබෙනවා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේ මොකක්ද? එතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ අය මෙක ඇද ඇද අනවශ්‍ය ප්‍රශ්න ඇදලා මේ විකාර කරන්නේ. අපි මේ ප්‍රශ්න අදින්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රිතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපියි අදින්න ඕනෑ. නමුත් අපි මෙතැන අදින්නේ නැහැ. අපි හදවතේ තද කරගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, වැරැදි මතයක්. මේ ඇමැතිතුමා අපහසුතාවයට පත් කරන්න නොවෙයි. එතුමායි මමයි අද උදේ එකටයි ආවේ. මේගොල්ලෝ මේ වෙන පැත්තකට හරවන්න හදනවා. අපි උදේ ඉස්පිරිතාලෙටත් ගිහිල්ලා ආවේ. සුළු සේවකයන්ගේ ප්‍රශ්නයක් තිබෙනවා. මෙහෙන් බැරි නම් මධ්‍යම රජයෙන් හරි වෙන්න ඕනෑ. අවුරුදු පහක් තුළ ගොඩනැගිලි 10 ක් විතර හැදෙන කොට ඒවායේ වැඩ කරන්න සේවකයෝ නැහැ. කාඩර් එක නැහැ. කාඩර් එකේ ගන්න පුළුවන්කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඇමැතිවරුන්ට මඩ ගහන්නවත්, ඇමැතිවරු අපහසුතාවයට පත් කරන්නවත් නොවෙයි. පොදු දෙයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

මූලික රෝහල ගැන -

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න හදන්නේ. මෙතැන පොඩි වැරැදි

අවබෝධයක් යනවා. අපි, අපි අතරේ ප්‍රශ්න තිබෙනවා කියලා. එහෙම කිසි ප්‍රශ්නයක් නැහැ. අපි ආණ්ඩු පක්ෂයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නයක් නැහැ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

කිසිම ප්‍රශ්නයක් නැහැ. මමයි, අපේ ගරු මන්ත්‍රීතුමයි, යසපාල කෝරලගේ උප සභාපතිතුමයි අද උදේ ඉස්පිරිතාලෙට ගිහිල්ලා බලලා ආවේ. එක වාහනේ අපි ආවේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එක වාහනේ ආවේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් -** අමාත්‍යතුමා
Hon. Sumith Lal Mendis - Minister

අපි තවමත් යන්නේ එක වාහනේ. එහෙම ගැටලුවක් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හතුරාට වඩා ළඟ ඉන්න මිතුරාගෙන් පරිස්සම් වෙන්න ඕනෑ.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක පිළිගන්නවා. ඇමැතිතුමා අපේ නියෝජ්‍ය සභාපතිතුමා සමඟ එක වාහනේ යන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අයවැයේදී බලාගන්න පුළුවන් එකට වාහනේ යන හැටි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එකට වාහනේ ගිහිල්ලා, ප්‍රශ්නය විසඳගෙන සභාවේ කාලය නේ මේ කන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු ඇමැතිතුමා එකට කැවත් විශ්වාස කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ප්‍රශ්නය උදේ විසඳගෙන දැන් ඇවිල්ලා සභාවේ කාලය කනවා.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## වසර 40 ක් තිස්සේ පාරම්පරිකව භුක්ති විඳින ඉඩම් පර්චස් 4, 5 ලෙස කට්ටි කිරීමට අනුමැතිය ලබා දීම

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රයේ මාගේ නමින් ඇති යෝජනාව අද දින සංශෝධිතාකාරයෙන් සභාවේ විවාදය සඳහා ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාතේ පාරම්පරිකව ජීවත්වන ජනතාවගේ පාරම්පරික ඉඩම් පවුල් සාමාජිකයන් අතර පාරම්පරික උරුමය මත බෙදී යාමේදී එක් පුද්ගලයෙකුගේ ඉඩම් අයිතිය පර්චස් 4, 5 වැනි අගයන් දක්වා පහත වැටෙන අවස්ථා ඇත.*

*වර්තමානයේ පළාත් පාලන ආයතන බිම් කට්ටි සැලසුම් හා නිවාස සැලසුම් අනුමත කිරීමේදී ප්‍රාදේශීය සභා අවම ඉඩම් වපසරිය පර්චස් 10 ලෙසත් මහ නගර සභා හා නගර සභා පර්චස් 6 ලෙසත් සලකා කටයුතු කිරීම සිදු කරයි.*

*"මේ හේතුවෙන් ඉහත දක්වන ලද පාරම්පරික ඉඩම් හිමියන්ට පර්චස් 4, 5 ඉඩම් කට්ටි සඳහා සැලසුම් අනුමත කර ගැනීමට ඇති ගැටලුව සලකා එම ඉඩම්වල පාරම්පරිකව අවුරුදු 40 කට වැඩියෙන් භුක්ති විඳගන එන ඉඩම් හිමියන්ට පමණක් ඔවුන්ගේ පදිංචිය හා ඊට අවශ්‍ය කරන පහසුකම්*

*පිළිබඳව මානුෂිකව සලකා ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීම පිණිස ඔවුන්ගේ ඉඩම් සැලසුම් අනුමත කර ගැනීමට නොහැකි නමුත් තාවකාලික වරිපනම් අංකයක් යටතේ ඔවුන් ලියාපදිංචි කරගෙන එම නිවාසවලට ජලය හා විදුලිය ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතු යැයි මානුෂික හැඟීමෙන් යුතුව මම මේ සභාවට යෝජනා කරමි"*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කියන්නේ ඔබතුමා අන්තිම ඡේදය සංශෝධනය කරලා තියෙන්නේ.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

එසේ සංශෝධනය කරලා තමයි ඉදිරිපත් කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මම එම සංශෝධන යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක දිගින් දිගටම යන්න අවශ්‍ය වෙන්නේ නැහැ. පැහැදිලි කරන්නම්. දැන් ඔය නීති රීති රෙගුලාසි අපට ඉදිරිපත් කරන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. මෙතුමා ඉල්ලන පරිදි පර්චස් 04 කට අඩු කරන්න පුළුවන්කමක් නැහැ. දැනටමත් එවැනි පර්චස් 04 නොවෙයි, 02 ට වුණත් අදාළ පළාත් පාලන ආයතනයට පුළුවන්කමක් තිබෙනවා, නිවසක් ඉදි කිරීම සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබා දෙන්න. ඒ නිසා අසාධාරණයක් කිසිම ආකාරයකින් සිද්ධ වෙන්නේ නැහැ. සමහර පළාත් පාලන ආයතනවල නොදැනුවත්ව එහෙම සිද්ධ වෙනවා නම්, ඒකට අපට මැදිහත් වෙන්න පුළුවන්. දැනටමත් අපි දන්නා ආකාරයට පළාත් පාලන ආයතන නිවසක් ඉදි කිරීම සඳහා අවසර ලබා දෙනවා. සමහර බැංකුත් ඒ අනුමැතිය යටතේ ණය දීලා තිබෙනවා. ඒ අනුව වරිපනම් අංකය ගැනීමත්, ජලය ගැනීමටත්, විදුලිය ලබා ගැනීමටත් දැනට බාධාවක්ව පවතින්නේ නැහැ. තක්සේරු දැන්වීමක් කොහොමත් ඕවට ලැබෙනවා. දේපළක් හැටියට සලකා කටයුතු කරනවා. එහෙම ක්‍රියාත්මක වෙන්නේ නැති තැනක් ගැන අපට දැනුවත් කළොත් ඒකට මැදහත් වෙලා සහනයක් ලබා දෙන්න අපට පුළුවන්. හරි නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙන් සහ විපක්ෂයෙන් මට කථික ලැයිස්තු ලැබිලා තිබෙනවා. පළාත් පාලන විෂයය භාර ගරු ඇමැතිතුමා ඒ ගැන ප්‍රකාශයක් කළා. එතුමා ඒ ගැන වගකීම ගත්තා. ඒ ගැන ගැටලුවක් නැහැයි කියලා. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් තවදුරටත් විවාදය යන්න ඕනෑද? සභාවේ එකඟතාවය අවශ්‍ය නැහැ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, විවාදයක් නොගියත් මෙතුමාගේ යෝජනාව සභාගත වෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත වෙනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඇමැතිවරයාගේ ප්‍රකාශයත් නීතියක් බවට පත් කරන්නය කියලා ඉල්ලන්නේ. මමත් කියන්නේ මේක නීතියක් බවට පත් කරන්නය කියලා. දැන් අපේ ගරු මහ ඇමැතිතුමා ඉන්නකම් හොඳක් වෙන්න පුළුවන්. හොඳ පළාත් පාලන ආයතන තිබෙනකම් හොඳ වෙන්න පුළුවන්. ඒත් දූෂිත මිනිස්සුන්ට පුළුවන් වෙනත් වෙනත් අරමුණු ඉෂ්ට කරගන්න. එහෙම නොවෙන්න මේක නීතිගත කරන්නය කියලා ඉල්ලනවා. ගරු මහ ඇමැතිතුමා කිව්වා වාගේම නාගරික සංවර්ධන අධිකාරිය තමයි මේකේ බලධාරියා වෙන්නේ. ඒ නිසා මේක අපි එතැනට යොමු කරන්න ඕනෑ. මොකද, ඉතාමත් කාලෝචිත යෝජනාවක් ගරු මන්ත්‍රීතුමා ගෙනාවේ. ඊළඟට මම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, හරි. පැහැදිලියි. අපි මෙහෙම කරමු.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මම වැඩිය කථා කරන්නේ නැහැ. වල්පල් නැහැ. එක දෙයක් කියලා නිහඬ වෙනවා. හැබැයි, මේ පොඩි බිම් කොටස් කඩනවා නම් ගරු මන්ත්‍රීතුමා ඒවාට නල ජලය

තිබෙන්න ඕනෑ. නැත්නම් වූටි කැලිවලට කැඩුවොත් ඒ අයට නල ජලය නැති වෙනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

නල ජලය ගැන තමයි මම මේ කථා කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මම කරපු ප්‍රකාශයේ වලංගුභාවය තිබෙන්නේ, ඉඩම් කට්ටි කිරීමට නොව. මේ සභාවේ පැහැදිලිව සටහන් විය යුතුයි. පරම්පරා ගත ඉඩම් පවුලක් අතර බෙදන කොට, මේ ගැටලු එනවා. එවැනි අවස්ථාවක විනා ඉඩම් කට්ටි කැඩීමේදී මේක ක්‍රියාත්මක වෙන්න දෙන්නේ නැහැ. මේක සම්පූර්ණයෙන් නීති විරෝධීයි. ඉඩම් කට්ටි කැඩීමකදී මේක නීති විරෝධීයි. නමුත් පවුලේ සාමාජිකයන් අතර බෙදීමේදී සානුකම්පිතව සලකා බලා තීන්දුවක් දීමට අදාළ පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ට බලතල තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. එහෙනම් මෙහෙම කරමු.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ගරු ඇමැතිතුමා ඒ ප්‍රකාශය කළා. ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා. මෙතුමා ස්ථිර කළා. කාලයත් තිබෙන නිසා, අපට කාලය තිබෙනවා නේ? ගරු මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කරලා අපි මෙම යෝජනාව ස්ථිර කර ගනිමු. ගරු මන්ත්‍රීතුමන්ලා, එහෙම හොඳයි නේද? ගරු මහ ඇමැතිතුමා, ඔබතුමා විෂයය භාර ගරු ඇමැතිතුමා හැටියට දීපු තීන්දුව අපි පිළිගන්නවා. නමුත් මෙය අපි යෝජනාවක් වශයෙන් සභාවේදී සම්මත කරන්න ඕනෑ නිසා අපි එතුමාගේ යෝජනාවට විපක්ෂයෙන් එක්කෙනයි, ආණ්ඩු පක්ෂයෙන් එක්කෙනයි කථා කරලා සභාවේ එකඟතාවය ගනිමු. කාලය තිබෙනවා නේ? ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

දෙන්නා, දෙන්නා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. දෙන්නා, දෙන්නා. අපි එහෙම කරමු. මම මේ අවස්ථාවේදී ඉතාමත් ගෞරවයෙන් ආරාධනා කරනවා, ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරළගේ මැතිතුමාට මූලාසනයේ අසුන් ගන්නා ලෙසට.

*ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.*

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා, යෝජනාව සම්බන්ධයෙන් විනාඩි 05 ක් ඔබතුමා කථා කරලා භාර දෙන්න. ඔබතුමා මුලින්ම පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

මගේ යෝජනාව කළේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා අන්තිමට කථා කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා.

[අ.භා. 12.20]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මෙම න්‍යාය පත්‍රයේ තිබෙන යෝජනාවත්, ඊට පසුව ගෙනෙන ලද සංශෝධිත යෝජනාවත් සම්බන්ධයෙන් සාකච්ඡා කළාට

[ ගරු සුනිල් වටගල]

පස්සේ බිම් කට්ටි සැලසුමට අදාළව ඒ යෝජනාව ඉල්ලා අස් කරගෙන තිබෙනවා. ඊට පස්සේ තිබෙන්නේ ජලය සහ අනිකුත් පහසුකම් ලබා දීමට අදාළ යෝජනාවක් කියලයි ගරු මන්ත්‍රීතුමා කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහිදී මේ ආශ්‍රිත ගැටලු රාශියක් මේ වෙද්දී පළාත් පාලන ආයතනවල ආයතන මට්ටමෙන් මතු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ ජලය ලබා දීමේදී සැලසුමක් අනුමත කිරීමට අදාළ ගැටලුවක් සාකච්ඡා වෙනවා. විශේෂයෙන්ම තාක්ෂණ නිලධාරීන්, TO මහත්වරු, එහෙම නැත්නම් පළාත් පාලන ආයතනවල මහත්වරු ගිහිල්ලා මේවා සලකා බලලා තමයි ඒ නිවසට ජලය දෙනවාද නැද්ද කියන කාරණාවන් සැලකිල්ලට ගන්නේ. හැබැයි, අපට මේ මොහොතේ පේනවා. මේ ප්‍රශ්නයට අදාළව ප්‍රායෝගික ගැටලු රාශියක් මතු වෙලා තිබෙන බව. විශේෂයෙන් අපි දන්නවා, සාමාන්‍ය ජනයා සැලසුමක් අනුමත කරගන්න, එහෙම නැත්නම් අත්‍යවශ්‍ය පහසුකමක් ඉෂ්ට කරගන්න පළාත් පාලන ආයතනවලට ගියාට පස්සේ මේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමාම මට මීට කලින් කොළඹ නගර සභාව ආශ්‍රිතව අපූරු උදාහරණයක් කිව්වා. මහා කැත චිත්‍රයක් තිබෙනවා. මේක පිටිපස්සේ තිබෙන්නේ කිසියම් අල්ලසක්, පගාවක්, දීමනාවක් ගෙවලා තමයි සාමාන්‍ය ජනතාව මේ යුතුකම ඉෂ්ට කර ගන්නේ. එතකොට මෙය මේ සභාවේ මොන ආකාරයෙන් කථා කළත් සැලසුමක් අනුමත කරගන්න යන ගමේ මනුස්සයා, නගරයේ මනුස්සයා අදාළ ආයතනයට ගියාට පස්සේ තමයි ඒ රහේ දන්නේ. පළාත් සභා මන්ත්‍රීවරයෙක් වෙලත්, රුපියල් පනස් දාහක් දීලා තමයි වැල්ලවත්තේ ඉඩමට වතුර අරන් තිබෙන්නේ. එතකොට ඒ වාගේ අභාවාවක තත්ත්වයක් තිබෙන්නේ. මම කියන්නේ මෙතැන තිබෙන ගැටලුව නිලධාරීන්ගේම තිබෙන ප්‍රශ්නය නොවෙයි. ඉහළින් දෙන්න ඕනෑ ආදර්ශය, පළාත් පාලන අමාත්‍යවරයා දෙන්න ඕනෑ ආදර්ශය, පළාත් සභාවේ අමාත්‍යවරයා දෙන්න ඕනෑ ආදර්ශය, පළාත් මන්ත්‍රීවරයා දෙන්න ඕනෑ ආදර්ශය පල්ලෙහාට යන්නේ නැති ස්වභාවයක් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ විතරක් නොවෙයි. මේ මොහොත වෙද්දී තමුන්නාන්සේ දන්නවා, මේ තාක්ෂණ නිලධාරීන්ගේ ලොකු ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. අපේ සැලසුම් අනුමත වෙන්නේ නැහැ. අපේ සැලසුම් දැන් සති ගණනාවක් තිස්සේ ආපස්සට ගියා. හැබැයි, සැලසුම් ශිල්පීන්ගේ එහෙම ගැටලුවක් තිබෙද්දී ඒ ගැටලුත් තියාගෙන තමයි අපට මේ ප්‍රශ්නය සාකච්ඡා කරන්න වෙන්නේ. එතකොට ඔවුන්ට සාධාරණ ඉල්ලීමක් - සාධාරණද? අසාධාරණද? කියලා ඉල්ලීම සම්බන්ධයෙන් මධ්‍යම ආණ්ඩුව පැත්තෙන්, පළාත් ආණ්ඩුව පැත්තෙන් තිබෙන මැදිහත්වීම මොකක්ද? අපි දන්නවා, සාමාන්‍ය ජනයා තමන්ගේ අවම පහසුකම් ටික ඉෂ්ට කරගන්න ගියාම, ඉතාම දැඩි ලෙස මේ අවස්ථාවේ පෙළෙමින් තිබෙනවා. වීථි රේඛා සහතිකයක්, නොපවරා ගැනීමේ සහතිකයක් ගන්න නගර සභාවට ගියාට පස්සේ, ඒ සහතිකය ගන්න මාසයක් තිස්සේ පෝළිමේ ඉන්නවා. එතකොට අදාළ බැංකුවෙන් ණය නිකුත් කරන්නේ නොපවරා ගැනීමේ සහතිකය දුන්නාට පස්සේ. නමුත් අදාළ ගැටලුව ඒක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජලය සම්බන්ධ ප්‍රශ්නය නේ මේ කථා කරන්නේ. දැන් අමාත්‍යවරයා මෙතැන ලොකු පැහැදිලි කිරීමක් කළා. හැබැයි, ඒ පැහැදිලි කිරීම කළාට මම තමුන්නාන්සේට කියනවා නාරාහේන්පිට බේකරි වත්තට දැන් යන්න. බේකරි වත්තේ මිනිස්සුන්ට වතුර තිබෙනවාද බලන්න. බොරැල්ලේ වනාතමුල්ලේ ටී20 වත්තට දැන් යන්න. වතුර තිබෙනවාද කියලා බලන්න. මහ ලොකුවට කිව්වා නේ? භාර ගත්තා නේ? ජනමාධ්‍ය Team එකක් එක්ක ගරු ඇමැතිතුමාට යන්න කියන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පස්ස මීරික මීරිකා පොළිමේ ඉන්න හැටි බලන්න, උදේට යන්න කෝ. මොකද? පොදු වැසිකිළියට යන්න වතුර ටික නැතිව, මේ පෝළිම. තමන්ගේ ශරීර කෘත්‍යය ඉෂ්ට කරගන්න. මහා, ලොකු වාසි බස් මෙතැන දොඩනවා. බොරැල්ලේ ආසනයට ගිහිල්ලා වතු ආශ්‍රිතව තිබෙන පොදු ජල කාමරවල අද ඇති වී තිබෙන තත්ත්වය බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත්ම කනගාටුයි. ඒ විතරක් නොවෙයි. පසුගිය ආණ්ඩුවෙන් දීපු මේ මහල් නිවාස යෝජනා ක්‍රමවල ජල කරාම දැන් කීයක් කැඩිලාද? ලිෆ්ට් එක වැඩ කරනවාද? ඒ සියලු පොදු පහසුකම් මේ වන විට අකර්මණ්‍යය වෙමින් තිබෙනවා,

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමා කියන්නේ ජලය. ජලයට අදාළව අද මීහිදු සෙන්පුරට යන්න. අර පුර, මේ පුර කියලා තිබෙනවා. විදුලියත් තිබෙනවා. එතකොට මේ පුරවල්වලට ගිහිල්ලා අද යථාර්ථය බලාගන්න පුළුවන්. කැමරා කණ්ඩායමක් එක්ක යන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගියාට පස්සේ පෙනෙයි ඉතාම ඛේදනීය තත්ත්වයක් තිබෙන්නේ.

අද ජලයට අදාළව වතු ආශ්‍රිත ජනතාවගේ ජීවන ගැටලුව ඉතාමත්ම ඛේදනීයයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නය කියලා ඉල්ලනවා.

ඒ විතරක් නොවෙයි. මේ කට්ටි සැලසුමට අදාළව අද - කට්ටි සැලසුම් කිරීමත් අපි යම් මට්ටමකට සාකච්ඡා කරමු. අද මේ බිම් කට්ටිකරණයට අදාළව ඉතාමත්ම නරුම ආකාරයෙන් - අපි දන්නවා, බස්නාහිර පළාත් සභාවේ සමහර පොල් ඉඩම් තිබෙනවා. කිසිම ප්‍රමිතියකින් තොරව අද මේවාට අනුමැතියන් අරගෙන මධ්‍යම රජය අනුමැතිය දීලා, පළාත් ආණ්ඩුව අනුමැතිය දීලා ඉතාම නරක පන්නයේ කට්ටිකරණයක් යනවා. අන්න කලල්ගොඩ ප්‍රදේශයේ මේ වන විට සිද්ධ වෙමින් යනවා. කැස්බෑව ප්‍රදේශයේ ලොකුම පොල් වත්තට වැඩේ දෙන්න යන්නේ. එතකොට මේවා ගත්තාට පස්සේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත්ම කනගාටුයි. කාගේ කාගේත් උවමනාවට මේ ස්වභාවික සම්පත එක පැත්තකින් කෙළෙසමින් යනවා. විශේෂයෙන්ම මේ ජල ගැටලුවට අදාළව, අද විදුලිය ගැටලුව මම හිතන්නේ -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

යහපාලන ආණ්ඩුවට බැරිද ඒක පාලනය කරගන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒවා ගත්තාට පස්සේ අද ඉතා දැවැන්ත ප්‍රශ්නයක් බවට මේවා පත් වෙමින් තිබෙනවා. අපි විශේෂයෙන්ම කියනවා. අමාත්‍යවරයා මේකේ වගකීම ගත්තා නම් අපි කියනවා, කොළඹ නගර සභාවට අදාළව උතුරු කොළඹ ප්‍රදේශයේ විශේෂයෙන්ම බොරැල්ල ආසනයේ, නැගෙනහිර කොළඹත්, ඇතැම් ස්ථානවල වතු ආශ්‍රිතවත් විශාල ජල ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. අපි කියනවා, වහාම මැදිහත් වෙලා මේ සාමාන්‍ය ජනතාවගේ ජල ගැටලුව විසඳන්නය කියන ඉල්ලීම මේ අවස්ථාවේදී කරනවා. යෝජනාව ඉතාම හොඳ යෝජනාවක් විධියට මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තූතියි. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක අවස්ථාවක් ලබා දෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

***[නැඟී සිටියේය.]***
*[Stood.]*

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් ඉන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්ගේ නීති විරෝධී සහ දූෂණ ක්‍රියාකාරීත්වය කියලා ආණ්ඩුකාරතුමාට පෙත්සමක් ඉදිරිපත් කරලා තිබෙනවා. මේ ආණ්ඩුකාරතුමාට ඉදිරිපත් කිරීම තුළ ඒකේ අත්සන් තියලා තිබෙන්නේ, විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල ගරු මන්ත්‍රීතුමා, ඒ වාගේම විපක්ෂයේ ප්‍රධාන සංවිධායක යූ. ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමා සහ සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමා. මේකේ එක තැනක තිබෙනවා, 2016 අගෝස්තු මාසයේ 09 වැනි දින ගරු බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් FCID වෙත මෙම සිද්ධිය නඩුවක් ලෙස ගොනු කිරීම හේතුවෙන් භීතියට පත්ව ප්‍රධාන ලේකම්වරිය කියලා.

පළාත් සභා මන්ත්‍රීවරුන් කිව්වාම, මේ පළාත් සභාවේ 104 ක් ඉන්නවා. මේකට අත්සන් කරලා තිබෙන්නේ තුන් දෙනයි. මන්ත්‍රීවරුන් කියන්න පුළුවන්කමක් නැහැ, ආණ්ඩුකාරතුමාට. එහෙමනම් ලියන්න ඕනෑ, ලිපියේ අත්සන් කළ පරිදි මේ තුන්දෙනාගේ ඉල්ලීම පරිදි තමයි FCID යට ගිහිල්ලා තිබෙන්නේ කියලා. මන්ත්‍රීවරුන් ගණනාවක් අත්සන් කරලා තිබෙනවා නම්, ඒ මන්ත්‍රීවරු ගණනාවගේ ලේඛනය ඉදිරිපත් කරන්න ඕනෑ. මෙතැන ආණ්ඩුකාරතුමාව නොමඟ යැවීමක් කරලා තිබෙනවා. මන්ත්‍රීවරුන් කිව්වාම 104 දෙනාම තමයි සඳහන් වෙන්නේ වචනයේ හැටියට.

ඒ වාගේම ප්‍රධාන ලේකම්වරියගේ සේවය ආයතන සංග්‍රහයේ XL අටවැනි පරිච්ඡේදය ප්‍රකාරව අත්හිටුවා,

[ ගරු මෙරිල් පෙරේරා]

බස්නාහිර පළාතෙන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා කියලා. මේකට අපි දැනුවත්ව මේ සභාවේම කථා කරලා නියෝජ්‍ය ලේකම් සේනක කියන මහත්මයාට විරුද්ධව විපක්ෂයේ සහ කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් ලේඛනයක් අත්සන් කරලා ඉවත් කරන්නය කියලා ලිපියක් ඉදිරිපත් කෙරුවා. ඒක ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනුත් සඳහන් කරලා අත්සන් කරලා තිබෙනවා. ආණ්ඩුකාරතුමාට ලියපු ලිපිය මෙහෙම ලිව්වාට මෙහෙම ඉදිරිපත් කෙරුවාට අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මේ ලියුමටම අර සේනක නිලධාරියාට අත්සන් කරපු ලේඛනය අමුණලා ජනාධිපතිතුමාට භාර දීලා තිබෙනවා කියන එක අපට පැහැදිලිව ආරංචි වෙලා තිබෙනවා. ඒ නිසා මේ අටවැනි මාසයේ නව වැනිදා ආණ්ඩුකාරතුමාට ලිපි ඉදිරිපත් කරනවා. FCID යනවා. ඒ වාගේම නව වැනි මාසයේ දෙවැනිදා වෙන කොට ආණ්ඩුකාරතුමාට මේ ලිපිය භාර දෙනවා. නව වැනි මාසයේ පහළොස් වැනිදා වන කොට ප්‍රධාන ලේකම්තුමිය මේ තනතුරෙන් ඉවත් කරලා වෙනත් අමාත්‍යාංශයකට මාරු කර යවනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පහත් කරලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමිය පහත් කරලා. එතකොට මේක තනිකර නොමඟ යැවීමක්. මේ පළාත් සභාව තුළ යම්කිසි මන්ත්‍රීවරු කොටසක් අත්සන් කරලා ලේඛනයක් ඉදිරිපත් කළා නම් ඒ ලේඛන ඉදිරිපත් නොකර සියලු පළාත් සභා මන්ත්‍රීවරු ටික සඳහන් කරලා FCID ගියා කියලා සඳහන් කරලා තිබෙන එක අපේ වරප්‍රසාද කඩ කිරීමක්. මම හිතන්නේ ආණ්ඩු පක්ෂයේ කවුරුත් ඒක පිළිගන්නේ නැහැ. ඒක ලොකු වරදක්. මෙහෙම ආණ්ඩුකාරතුමාව නොමඟ යවලා, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට කොපිය අමුණලා මේ වාගේ බොරු ලේඛන ඉදිරිපත් කරලා මේ පළාත් සභාවේ සුමාන දෙකක් ඇතුළත, වසර 13 ක් සේවය කරපු ප්‍රධාන ලේකම්තුමියට කරපු වංචාව අපි හෙළා දකිනවා කියන එක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කියන්න ඕනෑ. මේක වරප්‍රසාද කඩ කිරීමක්. මේ කිසිම මන්ත්‍රීවරයෙක් අත්සන් කරලා නැහැ. ආණ්ඩු පක්ෂයේ. එහෙම තිබෙනවා නම් වැරැද්ද පිළිගන්න ඕනෑ. මොකද, මේක අද ආන්දෝලනයට පත් වෙලා තිබෙන්නේ. ප්‍රධාන ලේකම්තුමිය මාරු කිරීම තුළ - යම්කිසි ලේකම්වරයෙක්, ප්‍රධාන ලේකම්තුමිය, නිලධාරියෙක් මාරු කරනවා නම් ඒක අදාළ ප්‍රධාන ඇමැතිතුමාට හෝ අමාත්‍යාංශයේ ඉන්න අමාත්‍යවරයාට ඒකේ අයිතියක් තිබෙනවා, තමුන් කැමැති නැත්නම් අයින් කරන එක. නමුත් මේ වාගේ බොරුවට ලිපි හදලා, ලිපිවල බොරු ලියලා ඒවා අත්සන් කෙරුවා කියලා, බොරු අත්සන් ලේඛන පෙන්නලා, සඳහන් කරලා, FCID යට ගිහිල්ලා ඒක ආණ්ඩුකාරතුමාට දීලා, ජනාධිපතිතුමාට දීලා සුමාන දෙකක් තුළ මාරු කිරීම ගැන පිළිකුල් සහගතව මේ කරපු වැඩේ ගැන අපි හෙළා දකිනවා කියන එක අපි සියලු දෙනාම කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ ලිපිය සභාගත කරන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) වගන්තිය යටතේ. මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ඒ පෙත්සම පිළිබඳව කරුණු පැහැදිලි වුණා. ඒකේදී අර මන්ත්‍රීවරුන් කියලා සඳහන් කිරීම තුළ මටත් අයිතියක් තිබෙනවා, ඒ ගැන පොඩ්ඩක් මැදිහත් වෙන්න. ඒ පෙත්සමේ අන්තර්ගතය මොකක්ද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා මාර්ගයෙන් ඒ මන්ත්‍රීතුමාගෙන් හරි නැත්නම් අදාළ අයගෙන් ඒ පෙත්සමේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා සභාගත කරන්නය කියලා කිව්වා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පෙත්සමේ පිටපතක් අපට ඒක අධ්‍යයනය කරලා ඒකට මැදිහත් වෙන්න, මොකද මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදීව අපි කටයුතු කරනවා නම්, පළාත් සභාවේ කෙනෙකුට අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, ඒ ගැන මැදිහත් වෙන්න අපට ඒ පිළිබඳව අවබෝධයක් තිබෙන්න ඕනෑ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා මැදිහත් වෙලා, මම දන්නේ

නැහැ, ඒකේ පිටපතක් අනික් මන්ත්‍රීවරුන්ටත් අවශ්‍යද කියලා. ඒකේ පිටපතක් ලබා දෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා ගොඩක් වෙලා දෙන්න බැහැ. අදාළ යෝජනාව සම්බන්ධයෙන් කථා කරමින් සිටියේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔබතුමා ප්‍රකාශයක් කරන්න. මගේ වරප්‍රසාද ප්‍රශ්නයට ඒක ලබා දෙන්න ඔබතුමා කටයුතු කරනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට ගැටලුව මොකක්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ගැටලුව තිබෙන්නේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්ද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්න නම් ගොඩක් තිබෙනවා. මේ ලිපියේ මගේ නම කියැවුණු නිසා මම සඳහන් කරන්නේ. මේ ලිපිය මමත් කියෙව්වා. FCID එකට අපි ලිපියක් දුන්නා තමයි. FCID එකට දුන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු සියල්ල අත්සන් කරලා. ඒ කියන්නේ FCID එකට දුන්න ලියුමේ මන්ත්‍රීවරුන්, FCID එකට ලියුමක් දුන්නා කිව්වාම ආණ්ඩුකාරයාට දෙන ලියුමේ ඒ අත්සන් ලේඛනය ඇතුළත් කරන්න ඕනෑ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ, නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා ඉන්න. මන්ත්‍රීවරුන් ලිපියක් දුන්නා කිව්වාම ඒකෙන් ගම්‍ය වෙන්නේ නැහැ 104 ම දුන්නයි කියන එක. සියලු මන්ත්‍රීවරුන් කියලා -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

පළාත් සභා මන්ත්‍රීවරුන් කිව්වාම -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පළාත් සභා මන්ත්‍රීවරුන්. පළාත් සභා මන්ත්‍රීවරුන් කිව්වාම -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එහෙමනම් විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියලා දාන්න තිබුණා නේ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සියලුම මන්ත්‍රීවරුන් කියලා තිබුණා නම් වෙන කතන්දරයක්.

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අනික් එක -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් අහගන්න මේ වචනේ. 2016.08.09 වැනි දින ගරු බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් - එක්කෝ ආණ්ඩු පක්ෂයේ වෙන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

සියලුම මන්ත්‍රීවරු නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් ඉන්න. එහෙමනම් මේකේ ලියන්න ඕනෑ, විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඕකේ තිබෙන්නේ මන්ත්‍රීවරුන් FCID එකට දුන්නා කියලා. ඒකේ සඳහන් වන්නේ නැහැ නේ ඔක්කොම මන්ත්‍රීවරු දුන්නා කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ, නැහැ. ඔබතුමන්ලා ලියන්න ඕනෑ විපක්ෂයේ මන්ත්‍රීවරු කියලා. නැත්නම් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු කියලා ලියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අත්සන් ලිස්ට් එකක් තිබෙනවා නේ ඉතින්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මන්ත්‍රීවරුන් කිව්වාම 104 ක් මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

එහෙම එකක් නැහැ. අනික් එක අපි දන්නවා. ප්‍රධාන ලේකම්වරිය මාරු කිරීම ගැන අමාරුවක් සමහරුන්ට තිබෙනවා. ඒක ඇත්ත. මෙතුමාම පිළිගත්තා එතුමිය අවුරුදු 13 ක් සිටියා කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අනික් ඔක්කොම අවුරුදු පහෙන් මාරු කරන ලේකම්තුමිය අවුරුදු 13 න් මාරු කළාම මොකද වෙන්නේ. මේවා වෙන කතන්දර.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මේ පළාත් සභාවට අවුරුදු පහට වැඩි අය කී දෙනෙක් ඉන්නවාද? එතුමිය විතරද ඉන්නේ?

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔය තනතුරේ නොවෙයි අවුරුදු 13 ක් හිටියේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ පැහැදිලි කිරීම කරලා අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක නිසා මේවාට පරීක්ෂණ කරනවා නම්, කරන්න. අපි වගකීමෙන් FCID ගිහිල්ලා තිබෙන්නේ. අපි FCID එකේදී ඔප්පු කරනවා එයා වැරැදියි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රධාන ලේකම්තුමිය කියන තනතුර ගැන එතුමා කථා කෙරුවේ. එතුමිය තනතුරු ගණනාවක අවුරුදු 13 ක් තිස්සේ මේ සභාවේ සිටියා. එතකොට මෙතැන මේ අත්සන් කරලා තිබෙන්නේ විපක්ෂයේ තුන්දෙනෙක් නම් මෙතැන පළාත් සභා මන්ත්‍රීවරුන් කියලා ලියන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, විපක්ෂයේ කියලා ලියන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

FCID එකට ලියුව එකත් මන්ත්‍රීවරු ගණනාවක් හිටියා. විපක්ෂයේ මන්ත්‍රීවරු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂයේ කියලා ලිව්වා නම් ඔබතුමා හරි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරුන් කියලා නැහැ. එහෙම එකක් නැහැ. සියලුම මන්ත්‍රීවරුන් කියලා නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ අත්සන් කෙරුවේ සේනක සිල්වා කියන නිලධාරියාට විරුද්ධව.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සියලු මන්ත්‍රීවරුන් කියන්නේ, මන්ත්‍රීවරුන් කියන්නේ එකක්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේක දිගින් දිගට ගෙනියන්න දෙන්න බැහැ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

පහත අත්සන් කරන ලද මන්ත්‍රීවරුන් කියලා ලියන්න ඕනෑ එහෙමනම්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සේනක සිල්වා කියන නිලධාරියාට විරුද්ධව මන්ත්‍රීවරුන් අත්සන් කෙරුවේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මන්ත්‍රීතුමා මේ කියන්නේ FCID එකට දීපු ලියුමේ මන්ත්‍රීවරුන් අත්සන් කරලා තිබෙන එකයි ප්‍රශ්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි අත්සන් කරලා නැහැ නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි කිව්වේ නැහැ, සියලු මන්ත්‍රීවරුන් කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අපි කැමැත්තෙන් අත්සන් කළා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමාට විනාඩියක් දෙන්න. දීලා අවසන් කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සියලුම මන්ත්‍රීවරුන් කියලා තිබුණා නම් වැරැදියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා මම කිව්වේ සේනක සිල්වා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මන්ත්‍රීවරුන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් මේ ප්‍රශ්නය තිබෙන්නේ, ගරු විපක්ෂ නායකතුමා කථා කරන්න. සමාවෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා විනාඩියක් දෙන්න. මම කිව්වේ සේනක සිල්වා කියන නිලධාරියාට විරුද්ධව තමයි සියලු මන්ත්‍රීවරුන් අත්සන් කළේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක හරි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒක එකක්. මේක එකක්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක එකක්. මේක එකක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක තමයි කිව්වේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ ඒක නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හරි. හරි. පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න. ඒ ලියුම අත්සන් කළේ සේනක සිල්වාට විරුද්ධව නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔව්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ ලේඛනයේ කොපියක් මේකට සහ ජනාධිපතිතුමාට අමුණලා ඇරලා තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

කවුද කියන්නේ? ඒවා නම් අපි දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දන්නේ නැති නිසා තමයි කියන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒකට ගරු විපක්ෂ නායකතුමා උත්තර දෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා මේක හොඳට අහගෙන ඔබතුමා උත්තර දෙන්න. ඔබතුමන්ලා දන්නේ නැතිව ඇති. නමුත් ආණ්ඩුකාරතුමාට සහ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඒ ලේඛනය අමුණලා තමයි යවලා තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි වගකීමෙන් කියනවා, එහෙම ලේඛනයක් තිබුණේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මුහුණු වෙනස් වෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ලේකම්තුමිය මාරු කරපු එක නොවෙයි. මේ කරපු ක්‍රමවේදය වැරැදියි. ක්‍රමවේදය වැරැදියි කියන එක අපි කියන්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපට මුහුණු වෙනස් වුණාට ප්‍රශ්නයක් නැහැ. සභාව දුවන්නයි ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නිශ්ශබ්ද වන්න. ගරු විපක්ෂ නායකතුමාට විනාඩියක් කථා කරන්න දෙන්න. කථා කරලා අවසන් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රශ්නයත් අරගෙන අපි දීර්ඝ ගමනක් ගියේ නැහැ. හේතුව මේ තත්ත්වය පිළිබඳව අපි යම් යම් පුද්ගලයන්ට කථා කළා. කථා කරලා ඉවර වුණාම අවසානයේ ප්‍රතිඵලයක් වුණේ, අපි ආණ්ඩුකාරවරයාට ගිහිල්ලා ලියුමක් භාර දුන්නා. ආණ්ඩුකාරවයාගේ ලියුමේ අත්සන් 54 ක් තිබුණා. ඒ කියන්නේ two - third අපි අත්සන් ගත්තා. ඒ අත්සන් ටික අරගෙන තමයි ආණ්ඩුකාරවරයාට ගිහිල්ලා ඒ ලිපිය දුන්නේ. නමුත් අපට තේරුනා එතැනත් සමහර තැන්වල විවිධ වැරැදි මත තිබෙනවා. ඒක ටිකක් දුර අපි බලන් ඉන්න කොට අපි කල්පනා කළා, මම ම යෝජනාවක් කළා, සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාටයි, අපේ ජෝර්ජ් පෙරේරා මැතිතුමාටයි. අපි ජනාධිපතිතුමාටත් ඒ වාගේම මේක වගකිව යුතු අයටත් අරිමු කියලා. නැත්නම් මේක වෙන්නේ නැහැ. මේ තත්ත්වය තුළ එන්න එන්න ප්‍රශ්න ඇති වෙනවා. හේතුව නාලක මහත්මයාගේ අත්සන් කරන පොත අයින් කළා. ඊට පස්සේ ඇඟිලි ගහන මැෂින් එකේ අත්සන් කරන එකත් නතර කළා. එතකොට මන්ත්‍රීවරු හැටියට අපට කථා කරලා එයාගේ තත්ත්වය එයා පැහැදිලි කළා. අපට ටෙලිෆෝන් එකෙන් කථා කරලා තිබෙනවා. ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමාට.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සභාවේ කථා සීමා කළා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කථා සීමා කළා. ඉතින් මෙන්න මේ විවිධ තත්ත්වයන් මත අපි කල්පනා කළා, ජනාධිපතිතුමාට ලිපියක් යවන්න ඕනැ. ඒ අනුව තමයි ජනාධිපතිතුමාට ලිපිය භාර දුන්නේ. ඒ අනුව තමයි FCID එකට ගිහිල්ලත් භාර දුන්නේ. FCID එකේ මන්ත්‍රීවරු කියලා කිව්වේ, මමත්, ජෝර්ජ් පෙරේරා මන්ත්‍රීතුමාත්, සුසිල් කිඳෙල්පිටිය මන්ත්‍රීතුමාත්, නිමල් පීරිස් මන්ත්‍රීතුමාත් අත්සන් කරලා තිබුණා. මන්ත්‍රීවරයෙක් කියලා කියන්න බැරි නිසා තමයි අපි මන්ත්‍රීවරුන් කියලා කිව්වේ. ඊට අමතරව ජනාධිපතිතුමාට ලියුම අපි මෙහෙන් තැපැල් කළේ. ඊට එහා දෙයක් අපි දන්නේ නැහැ. එච්චරයි අපි කියන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා කියන්න, අත්සන් කෙරුවේ සේනක සිල්වා නිලධාරියාට විරුද්ධවද? නැත්නම් ජයන්ති විජේතුංගට විරුද්ධවද?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, ඉස්සෙල්ලාම අත්සන් කළේ සේනක නිලධාරියාට විරුද්ධව.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජයන්ති ලේකම්තුමියට ලියපු ලියුමේ කොහොමද ඒ කොපි සෙට් එක තිබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක අපි දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක ගිහිල්ලා තිබෙනවා. දැන් ඔබතුමා -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක ගියේ නැහැ. ඒක තැපැල් කළේ මමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා දන්නේ නැතිව ඇති. ඒක තමයි අපිත් කියන්නේ සේනක සිල්වා නිලධාරියාට අත්සන් කරපු 54 ක් තිබෙනවා. ඒක හරි. ඒ ලියුමම තමයි

[ ගරු මෙරිල් පෙරේරා ]

ජයන්ති ලේකම්තුමියටත් ලියුමක් ගහලා ඒ 54 දෙනාගේ ලේඛනය ආණ්ඩුකාරතුමාටයි, ජනාධිපතිතුමාටයි ඇරලා තිබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක ඔබතුමා Post කරපු එක ගැන නොවෙයි අපි කියන්නේ. මේක වැරැදි මතයක්. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ 54 දෙනෙක් අත්සන් කරපු සියලු ලිපි ලේඛන අමුණලා තමයි මේ ලිපිය ආණ්ඩුකාරතුමාටයි, ජනාධිපතිතුමාටයි ඇරලා තිබෙන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක අපි දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දන්නේ නැති නිසා තමයි මම මේක කිව්වේ. එතැන වරප්‍රසාද කඩ කිරීමක් නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක මට කියන්නත් බැහැ නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකත් ඔබතුමන්ලාගේම කුමන්ත්‍රණයක් තමයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතකොට වරප්‍රසාද කඩ කිරීමක් නේ. එක නිලධාරියෙක් අයින් කරන්න කියලා ලියුමක් අත්සන් කරගෙන -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එක නිලධාරියෙක් නොවෙයි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තවත් නිලධාරියෙකුට ඒ ලේඛනය අමුණනවා නම් ඒක වරප්‍රසාද කඩ කිරීමක්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, නැහැ. එක නිලධාරියෙක් නොවෙයි. මේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් අත්සන් කළා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කොහොමද දන්නේ අත්සන් ලේඛනය යැව්වයි කියලා. ඔබතුමාට කොහොමද ඒකේ පිටපතක් ලැබුණේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රධාන ඇමැතිතුමා කිව්වේ. ප්‍රධාන ඇමැතිතුමා කිව්වා ජනාධිපතිතුමාට ඇරපු ලිපියේ -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක යවපු ක්‍රමයක් තිබෙන්න එපැයි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ප්‍රධාන ඇමැතිතුමා මෙහෙම කියනවා කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රධාන ඇමැතිතුමාගෙන් අහපුවාම -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එක්කෙනෙක් කථා කරලා අවසන් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු ප්‍රධාන ඇමැතිතුමා කිව්වා, ජනාධිපතිතුමාට ඇරපු ලියුමේ ආණ්ඩු පක්ෂයේ ඔක්කෝම අත්සන් කරලා කියලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක එතුමා පෙන්වන්නේ නැහැ නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මෙහෙම පදනමක් නැතිව කථා කරන්න බැහැ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඒක කියපු කථාවක් පමණයි නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක ප්‍රධාන ඇමැතිතුමාට පෙන්වන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ආපු විධියක් වැඩක් නැහැ නේ. වැරැද්දක් කරලා තිබෙනවා නම් පිළිගන්න ඕනෑ. ආපු විධිය නොවෙයි හොයන්න ඕනෑ. වැරැද්ද කරපු එක්කෙනා සොයන්න ඕනෑ.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ප්‍රධාන ඇමැතිතුමා

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මහ ඇමැතිතුමා කිව්වාලු.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කවුරු කොහොම කිව්වත් වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒක සොයන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. දෙපැත්තටම ඇති. මේ සම්බන්ධව කථා කළා ඇති.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජනාධිපතිතුමා ඒ ලියුම අපට පෙන්නුවොත් අපි එනවා, වගකීමක් ඇතිව කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එක මන්ත්‍රීවරයෙක් කථා කරන්න. අනික් අය වාඩි වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජනාධිපතිතුමා -

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ඔබතුමාට කියපු කථාවක් පමණයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ලියුම ජනාධිපතිතුමා, අර අත්සන් 54 ක් එක්ක පෙන්නුවොත් අපි ඕනෑම දඬුවමකට යටත් වෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඕනෑ වෙලාවක කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපි කියන්නෙත් ඒක තමයි. 54 දෙනෙක් අත්සන් කරලා - එහෙම නැත්නම් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජනාධිපති මන්දිරේට රැට රිංගනවා කියලා කියන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම නැත්නම් දවස් 14 ක් ඇතුළත කොහොමද ලේකම්තුමියව මාරු කරන්නේ. ඒ ලිපියට තමයි මාරු කෙරුවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකනේ කිව්වේ ජනාධිපතිතුමා ළඟට රට රිංගනවා කියලා. ඔය එළිවෙන්නේ.

[සභාව් ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පොඩ්ඩක් ඉන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජනාධිපතිතුමා ගාවට රට රිංගනවා. ඒකනේ තේරුම.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙපැත්තේම අය වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය අහුවුණේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ජනාධිපතිතුමාට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා මන්ත්‍රීවරුන් ටික වාඩි කරවන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තවම පරීක්ෂණයක් පවත්වනවා. පරීක්ෂණය ඉවර වෙන එපැයි.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ඔය ප්‍රශ්නය ඇති. දැන් පැහැදිලියි.

[සභාව් ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔය එළිවුණේ. රට ආප්ප-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා දැන් ඇති. වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දවල් මිගෙල් ද ඩැනියෙල්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ ප්‍රශ්නය දෙපැත්තෙන්ම පැහැදිලි කළා. වැරැද්ද පිළිගත්තා. වැරැදීම කොතැනද කියලා සොයා ගත්තා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වැරැද්ද පිළිගත්තේ කවුද?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගේ නම කියැවුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂයේ සංවිධායකතුමා විනාඩියක් කථා කරලා අවසන් කරන්න. කෙටියෙන් කථා කරලා අවසන් කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගරු විපක්ෂ නායකතුමා කියපු දේ තමයි සත්‍ය දේ. මමත් අත්සන් කළා. කණ්ඩායමක් වශයෙන් තමයි තීන්දු කළේ හතර දෙනෙක් අත්සන් කරන්න කියලා. පළමුවෙන්ම වුණු සිද්ධිය කියන්නම් කෝ. ඉස්සෙල්ලාම සේනක අධ්‍යක්ෂතුමා සම්බන්ධව අපි 54 දෙනෙක් අත්සන් කළා. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම දෙනා. ඒක අපි භාර දුන්නා. මේ ලේඛන පටලවා ගන්න එපා. අපි FCID එකට ලියුමක් අත්සන් කළා. ඒකට කවුරුත් අත්සන් කළේ නැහැ. අපේ කණ්ඩායම විතරයි. අපි වගකීමෙන් කියන්නේ. ඊට පස්සේ මේ අපි හතර දෙනා අත්සන් කරපු එක වෙනම ඒ ආණ්ඩුකාරතුමාටයි, ජනාධිපතිතුමාටයි - හෙට උදේට අපව FCID එකෙන් කැඳවලා තිබෙනවා. අපි වගකීමෙන් කියන්නේ. මට උදේ 9.00 ට එන්න කියලා තිබෙන්නේ. අපටත් FCID එන්න කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් යූ. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා පැහැදිලි කරනවා, මේක පැහැදිලිව නිරවුල් කරගන්න. විපක්ෂය විතරයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතැන තිබෙන්නේ කුමන්ත්‍රණකාරී දෙයක්. මේ තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ආණ්ඩුකාරතුමාගෙන් මේ ලියුම මෙතුමාට ආවා නම් මේ කොළයට කොපියක් ආලා තැපැල් කළාද දන්නේ නැහැ. කැත වැඩ මේවා. මේවා කැත වැඩ. වගකීමෙන් අපි කියන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙරිල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට මේ කොළේ කොහොමද ආවේ. මේක කොහෙන්ද ආවේ? කෙහෙන්ද සභාගත වුණේ? ආණ්ඩුකාරතුමාගෙන් ආවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ආපු විධිය වැඩක් නැහැ නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අත්සන් ලේඛනයත් ඔබතුමා ළඟ තිබෙනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

කරලා තිබෙන වැඩේ වැරැදියි නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු සංවිධායකතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා රෑට ජනාධිපතිතුමා ගාවට රිංගනවා. ජනාධිපතිතුමාගේ කාමරයෙන් උස්සලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

FCID එකේ පරීක්ෂණය යනවා. FCID එකේ පරීක්ෂණය යන කොට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පැහැදිලිව කිව්වා -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඉස්සුවා නම් එතුමාගේ දක්ෂතාවය.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වාඩි වෙන්න. දැන් මේක පටලවා ගන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔය කාරණය නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. මේක පටලවා ගන්න එපා. දැන් ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ සංවිධායකතුමා පැහැදිලිව කිව්වා, ලේකම්තුමියගේ මාරු කිරීමේ අත්සන් ලේඛනයට අත්සන් කළේ විපක්ෂයේ මන්ත්‍රීවරු පමණයි කියලා. එතුමා සහතිකයක් දුන්නා නේ. දැන් මේ ප්‍රශ්නය දිගින් දිගට ගෙනි යන්න එපා. මේක අවසන් කරන්න.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා -

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

විපක්ෂ නායකතුමා කිව්වා, 54 දෙනෙක් අත්සන් කරපු එකක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක නිවැරැදි කළා.

**ගරු ප්‍රදීප් උඳුගොඩ**
Hon. Pradeep Undugoda

54 දෙනෙක් විපක්ෂයේ නැහැ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක අදාළ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ සංවිධායකතුමා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක සේනක ද සිල්වාට විරුද්ධව.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඒක හරි. දැන් පැහැදිලියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැන් මේ කාරණයේදී -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

නැහැ, ඕක නොවෙයි. මේ කාරණයේදී මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ ප්‍රශ්නය පැන නැඟුවේ තමන්ගේ අතේවත් නැති, තමන් ඇස්දෙකටවත් දැක්කේ නැති මහ ඇමතිතුමා කිව්වාය කියන ලේඛනයක් සම්බන්ධයෙන්. මේ සභා රීතිවල කොහෙවත් නැහැ, තමන්ගේ ඇස් දෙකට දැක්කේ නැති, තමන්ගේ අතේ නැති තව කෙනෙක් කිව්වයි කියන දේවල් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කරන්න මේ සභාවේ පුළුවන්කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ ලිපිය සභාගත කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ ලේඛනයේ 54 දෙනෙක් ඉන්න එක කෝ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නාම ලැයිස්තුව ගැන නොවෙයි නේ කථා කෙරුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තුන්දෙනෙක් අත්සන් කරපු ලිපිය -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

සභාගත කළයි කියන ලේඛනය -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මෙතුමා බොරු තර්ක මතු කරන්නේ. පරදින තර්ක.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එළියේ කථා කරලා ඇතුළේ අවුල් කරන්න එන එක එක්කෙනාගේ ඕනෑකම් ඔය.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කථා කෙරුවේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔය එළියේ කථා කරලා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ, නැහැ. ඔබතුමා වරද්ද ගන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

එළියට ලකුණු දාගන්න කරන වැඩ ඕවා. එහෙම නැතිව මන්ත්‍රීවරයෙකුට පුළුවන්කමක් නැහැ තමන් ඇස් දෙකට දැක්කේ නැති, තමන්ගේ අතේ නැති තමන්ගේ පෞද්ගලික කාරණයක් සම්බන්ධව කථා කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අතේ තිබෙනවා. මේ තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ජයන්ති විජේතුංගව මාරු කළයි කියලා පුදුම අමාරුවක් තිබෙන්නේ. මේ වෙන එකක් නොවෙයි, තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම පැහැදිලිව කිව්වේ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අවුරුදු 13 සාපය නිමා කරපු එක ඔය තිබෙන්නේ. වෙන මොකුත් නොවෙයි ඔය. අවුරුදු 13 සාපය නිමා කරපු එක තිබෙන්නේ. ඒකයි අමාරුව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔය අවුරුදු 13 සාපය අවසන් කරපු අමාරුව නිසා. ඔය බොරුව හැදුවේ ඒකට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

විනාඩියක් දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම පැහැදිලිව කිව්වා,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම එකක් තිබෙනවාද කියලා බලන්න මට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට කොපියක් දෙන්නම්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපේ වරප්‍රසාද කැඩෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කොපියක් දෙන්නම්. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නම් ලැයිස්තුව බලන්න. අපේ නමත් තිබෙනවාද කියලා.

[සභාව් ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම පැහැදිලිව පටන් ගත්තේ (බාධා කිරීම්) මේ ලිපියේ වරප්‍රසාද කඩ කිරීමක් තිබෙනවා කියලා විතරයි. මම පැහැදිලිව කිව්වා, බස්නාහිර පළාත් සභා මන්ත්‍රීවරුන් කියන එක විතරයි අපට වරප්‍රසාද කැඩිලා තිබෙන්නේ. මම කිව්වේ නැහැ අත්සන් ලේඛනයක් - මම කිව්වේ අත්සන් ලේඛනයක් දීලා තිබෙනවා කියලා ආරංචියක් තිබෙනවා කියලා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

නැහැ, නැහැ. එහෙම කිව්වේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කිව්වා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බොරු කියන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කිව්වා. අහලා බලන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ඒක ඉවර වුණා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මහ ඇමැතිතුමාවත් වික්කා.

[සභාවේ ඝෝෂා]

මහ ඇමැතිතුමා කිව්වා කියලත් කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ඒක නිවැරැදි වුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපට ආරංචියක් තිබෙනවා කියලා කිව්වේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මේක නිවැරැදි වුණා. වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කිව්වා. කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කිව්වේ නැහැ.

[සභාව් ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඕවා පිටිපස්සේ ඉන්නේ කවුද කියලා තේරෙනවා දැන්.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තේරෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීවරුන් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, මහ ඇමැතිතුමා කිව්වා කියලා කියනවා නේ. මහ ඇමැතිතුමාව මෙතැනට ගෙන්වන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමන්ලා දැන් මේක නිවැරැදි වුණා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දැන් කොහොම හරි එයා ගියා. එයා ආපහු එන්නේ නැහැ සුද්ද.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් වැඩේ නිවැරැදි වුණා. ඒක දැන් ඉවරයි. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කථා කරන්න. යෝජනාව සම්බන්ධව කථා කරන්න. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමාට පස්සේ තිබෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව පොඩ්ඩකින් දෙන්නම්. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

පළාත් සභාවේ සැලසුම් අධ්‍යක්ෂක අස් කරන්න කියලා අත්සන් කරපු ලියුමට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ඕක ඕනෑ තරම් කථා කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම කිසිම ලේඛනයට අත්සන් කරලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අත්සන් කරලා නැහැයි කියලා ජෝර්ජ් පෙරේරා සංවිධායකතුමා කිව්වා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අත්සන් නොකළාට කමක් නැහැ. මාරු කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතකොට ප්‍රධාන ලේකම්තුමියව මාරු කරන්න කියලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ අත්සන් කළෙත් නැහැයි කියලා කිව්වා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

දැන් ඕක කිව්වා. වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කිව්වා. කිව්වා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නිදාගෙනද සිටියේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ඔය කථාව කිව්වේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආයත සංග්‍රහයේ තිබෙන - වැඩක් නැහැ. ඒ නිසා සම්පූර්ණයෙන්ම මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කළේ නැහැයි කියලා කිව්වා. වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි සම්පූර්ණයෙන් විරෝධය පළ කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එතුමිය මේ පළාත් සභාවට විවිධ ක්ෂේත්‍රවල, විවිධ තනතුරුවල අවුරුදු 15 ක් සේවය කරලා තිබෙනවා. එතුමිය මේ පළාත් සභාව දියුණු කරන්න විශාල කැප වීමක් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. දැන් වාඩි වෙන්න. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඇයි? එතකොට හොරා කාපුවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

විනය පරීක්ෂණයක් කරලා තමයි මාරු කරන්න පුළුවන්. මේ යහපාලන ආණ්ඩුව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බෙදා ගත්තු ඒවා අහු වෙයි කියලා භයේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

උපාලි කොඩිකාර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. දැන් ඕක කථා කළා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට වරප්‍රසාද කඩවීමක් සිද්ධ වෙලා නැහැ. වාඩි වෙන්න. ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 12.50]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා අද ඉතාම කාලෝචිත යෝජනාවක් ගෙනැල්ලා තිබෙනවා කියලා තමයි මම මේ යෝජනාව පිළිබඳව හිතන්නේ. විශේෂයෙන්ම නගර සභා, මහ නගර සභා බල ප්‍රදේශවල ජීවත් වන අපට වඩා වැඩියෙන් ජනතාව මේ ප්‍රශ්නයට මුහුණ දීලා තිබෙන බව දැනෙනවා. අපට දිනපතා, සතිපතා, මාස්පතා මෙවැනි අකරතැබ්බවලට පත් වන සාමාන්‍ය ජනතාව ඇවිල්ලා කරුණු කියනවා. තමන් මේ වාගේ අසීරු තත්ත්වයට පත් වෙලා, තමන්ට ප්ලෑන් එකක්, ඉඩමේ සැලැස්මක් අනුමත කර ගන්න, නිවසේ සැලැස්මක් අනුමත කර ගන්න බැරි නිසා විශාල වශයෙන් අපහසුතාවයන්ට ලක් වෙලා තිබෙනවා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ සාකච්ඡාව ඉවර කරන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා කථා කරන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේගොල්ලන්ට කථා කරන්න දීලා ඉවර වෙලා, අවස්ථාව දෙන්න. නැත්නම් අපට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා. ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් ගෙනැල්ලා තිබෙන්නේ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ යෝජනාව සම්බන්ධව විවිධ මත ඇති. අපේ හිටපු සභාපතිවරු රාශියක් මේ සභාව නියෝජනය කරනවා. ඒ වාගේම මේ පිළිබඳව අත්දැකීම් තිබෙන අය ඉන්නවා. විවිධ මත ඇති. නමුත් මම පෞද්ගලිකව විශ්වාස කරනවා, මේ යෝජනාවේ හරයක් තිබෙනවා සහ අත්‍යවශ්‍යතාවයක් තිබෙනවාය කියලා. මොකද, නාගරික බල ප්‍රදේශවල ජනතාවට විශාල වශයෙන් ඉඩම් මිලදී ගැනීමේදීත් විශාල වියදමක් ලක්ෂ ගණනින් දරන්න සිද්ධ වෙනවා. ඒ සා අමාරුකම් මැද්දේ පුංචි බිම් කැබැල්ලක් ගන්න කෙනෙකුට තමන්ගේ නිවසේ සැලැස්ම, බිම් කොටසේ සැලැස්ම අනුමත කර ගන්න බැරි වුණාම මහා විශාල පීඩාවකට පත් වෙනවා. මොකද, නිවාස කියන්නේ මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකමක්. නිවාස ප්‍රශ්නයේදී අපට පළාත් සභාවක් හැටියට මැදිහත් වෙලා විසඳන්න පුළුවන්කමක් නැහැ. පළාත් සභා අරමුදල් වුණත් ඉතාම සුළු මුදලයි නිවාස අමාත්‍යාංශයට, නිවාස දෙපාර්තමේන්තුවට වාර්ෂික අයවැයෙන් අපි වෙන් කරන්නේ. ඒ නිසා තමන් විසින් තමන්ගේ ප්‍රශ්නයක් විසඳගන්න යෑමේදී රටේ තිබෙන නීති ඒවාවලට හරස් වෙලා ජනතාව අපහසුතාවයට පත් වෙනවා නම්, ඒ නීති යම් සංශෝධනයකට ලක් කිරීමට අපි මැදිහත් වීමේ වගකීමක් තිබෙනවා. මෙතැනදී කියන්න පුළුවන්. කථාබහට ලක් වෙන්න පුළුවන්. මේ නීති හදන්නේ අපි නොවෙයි. මේක මධ්‍යම රජය කියලා. හැබැයි, අපිත් රටේ තිබෙන ප්‍රධාන පළාත් සභාව. ඒ වාගේම අපිත් නීති සම්පාදනය කරනවා. මේ නීති සම්පාදනය කිරීමේ කාර්යයේදී මධ්‍යම රජයට යම්

[ගරු ජගත් කුමාර]

උපදෙසක් දෙන්න, ඉල්ලීමක් කරන්න, මධ්‍යම රජයට යම්කිසි බලපෑමක් කරන්න මේ පළාත් සභාවට විශේෂ හැකියාවක් තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ජනතාවගේ මූලික ප්‍රශ්නයක් වුණු මේ කාරණාව සම්බන්ධව, අනිවාර්යෙන්ම අපට මේ කාරණාව සම්බන්ධව මධ්‍යම රජයට ඉල්ලීමක් කරන්න ඕනෑ. මොකද, මේකේදී සාමාන්‍ය ජනතාව පීඩනයට පත් වෙන්නේ දෙයාකාරයට. එක් පැත්තකින් තමන්ට මේ නිවාස සැලැස්මක් අනුමත කර ගන්න බැහැ, පර්චස් හතර පහ බිම් කොටස් තිබෙනවා නම් එහෙම නැත්නම් ඊට වඩා අඩු නම්. හැබැයි, සමහර අයගේ බිම් කොටස් සහ නිවාස එහෙම අනුමත වෙනවා. එහෙම කොහොමද අනුමත වෙන්නේ? එහිදී පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ට අනුමැතියක් ලබා දීමේ හැකියාවක් ඔවුන්ට තිබෙනවා. යම්කිසි දෙයක් සොයලා බලලා කරන්න. හැබැයි, බොහෝ අය හොඳට කරලා ඇති. පළාත් පාලන ආයතනවල සභාපතිවරු. නැත්නම් ප්‍රධානීන්. හැබැයි, සමහර තැන්වල ප්‍රධානීන් තමන්ට හිතවත් නිසා, තමන්ට මුදල් ලබා දෙන නිසා, වාසි වරදාන සඳහා විතරක් අර දුප්පත් මනුස්සයාත් පීඩනයට පත් කරලා අනුමත කරනවා. තමන්ගේ අසල්වැසියාගේ පර්චස් හතර අනුමත වෙනවා. සභාපතිවරයාගේ අභිමතය පාවිච්චි කරන නිසා. හැකියාව තිබෙන නිසා.

හැබැයි, ඊට එහා පැත්තේ තිබෙන ඉඩම, නිවස අනුමත වෙන්නේ නැහැ. මොකද, එයා ඒ සභාපතිවරයාත් එක්ක හෝ ඒ ප්‍රධානියාත් එකක් හොඳ නැති නිසා. එහෙම නැත්නම් සල්ලි දුන්නේ නැති නිසා. ඒ නිසා නීතියේ සාධාරණයක් ඉෂ්ට සිද්ධ වෙන්නේ නැහැ. මේක අභිමතයක් දීලා තිබෙන නිසා. පළාත් පාලන ආයතනවලට බොහෝ වෙලාවට මේ අභිමතය තිබෙන නිසා, හොඳ දේ වෙනවා වාගේම ජනතාව පීඩාවට පත් වන අවස්ථාවන් තිබෙනවා. මේක සාමාන්‍යයෙන් විධායක ජනාධිපති ක්‍රමයට සමානයි කියලා සමහර අවස්ථාවලදී කිව්වේ, තනි තීන්දු ගන්න පුළුවන් නිසා. ඒ නිසා පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ ඒ තිබෙන බලය අයින් කරන්න කියලා නොවෙයි අපි යෝජනා කරන්නේ. හැබැයි, ඒක වුණත් කමිටුවකට දැම්මා නම් තවත් යම්කිසි ස්වාධීනත්වයක් ඒවි. ඒ කමිටුවෙන් තීන්දුවක් ගන්න කොට. ඒ වාගේම නීතියක් බවට මේක පත් කරන්න පුළුවන් නම්. මේ කියන පර්චස් හතර පහ තිබෙන බිම් ප්‍රමාණ සම්බන්ධව. විශේෂයෙන්ම දැන් අපි බත්තරමුල්ල ගත්තත් අපි මේ ඉන්න ප්‍රදේශය ඉතාම නගරබද ප්‍රදේශයක්. ඒ වාගේම කෝට්ටේ ගත්තත්, කඩුවෙල ගත්තත්, කොළඹ ගත්තත් මේ හැම තැනම. ඒ එක්කම අපේ බස්නාහිර පළාත් සභාවට අයිති වැඩි ප්‍රදේශයක් තිබෙන්නේ නගරබද ප්‍රදේශ සහ අර්ධ නාගරික ප්‍රදේශ. මේ ප්‍රදේශවල ජනතාවට මේක තදින් දැනෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතාම කාලෝචිත වැදගත් යෝජනාවක්. මේ යෝජනාවට අපි අනුමැතිය ලබා දීලා, මෙය මධ්‍යම රජයේ අවධානය යොමු කර ගෙන කටයුතු කළ යුතුයි. ජනතාවගේ පැත්තෙන් ඒක විශාල සහනයක් වෙනවාය කියන කාරණාවත් මතක් කරනවා.

ඒ වාගේම අර මම වරප්‍රසාද කාරණාවක් විධියට කිහිප සැරයක්ම කියන්න උත්සාහ කළා. මේකේදී මම මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා, මේකට මට හරස් වෙන්න එපාය කියලා. ජයන්ති විජේතුංග මහත්මිය අපට පුද්ගලිකව විශේෂ වරප්‍රසාද හෝ වාසි දීලා නැහැ. මේ කථා කරන මට. එහෙම එතුමිය රකින්න හෝ එතුමිය එළවන්න ඕනැකමක් අපට තිබුණේ නැත. ඒ වාගේම එතුමිය ඉවත් කිරීමේ හෝ තියා ගැනීමේ ලියවිල්ලකට අප අත්සන් කර නැත. ඒ නිසා කවුරුහරි කෙනෙක් එවැනි ලේඛනයක් සකස් කළා නම්, ඒක කූඨ ලේඛනයක් බවට පත් වෙනවා. ඒ කූඨ ලේඛනය සකස් කිරීම කියන්නේ, නීතිඥ මහත්වරු දන්නවා. ඒක බරපතළ වැරැද්දක්. දණ්ඩ නීති සංග්‍රහයේ විශාල දඬුවමක් දිය යුතු වරදක්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමා මගින් අපි කියනවා, ආණ්ඩුකාරතුමාට කථා කරලා, එක්කෝ එතුමාත් එක්ක සාකච්ඡාවක් අරගෙන මෙවන් ලේඛනයක් එහෙම දීලා - මෙතුමන්ලා කියන දේත් පිළිගන්න පුළුවන්. නමුත් අපිත් සහසුද්දයෙන් දැන ගන්න ඕනෑ, එහෙම දීලා ද නැද්ද කියලා. මම නම් ඇත්තටම මුලින් අත්සන් කළේ අර නාලකට අසාධාරණයක් වුණා. නැතිව සේනකව අයින් කරන්නත් නොවෙයි. නාලකට අසාධාරණයක් වුණා. එයාට සාධාරණයක් කරන්න කියලා. හැබැයි, ඒක සේනකව අයින් කරන්නත් පාවිච්චි කරලා තිබෙන බව තමයි මෙතැනදී මට හැඟුනේ. ඒ නිසා අපි කෙනෙකුව අයින් කරන්න කිසිම ලියවිල්ලක් අත්සන් කරලා නැති මන්ත්‍රීවරයෙක් විධියට සහ අපේ ආණ්ඩු පක්ෂයේ වැඩි දෙනෙක් මන්ත්‍රීවරු එහෙම කරලා නැති නිසා අපි ඉල්ලා සිටිනවා, මේ සම්බන්ධව මැදිහත් වෙලා පරීක්ෂණයක් කරන්න. මන්ත්‍රීවරුන්ගේ වාචික අදහස්වලින් විතරක් ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැයි කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. මට අවස්ථාව ලබා දීම ගැනත්, යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12.58]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හොඳ යෝජනාවක් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපේ ප්‍රදේශවල ඉන්න පාරම්පරික ඉඩම්, පරම්පරාවෙන් එන ඉඩකඩම් එක ගෙදරක පවුලේ තුන් හතර දෙනෙක් ඉන්නවා නම් පර්චස් දහයක්, පහළොවක් තිබෙන ඉඩමක් බෙදා ගන්න ගියාම විශාල ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නැත්නම් ඒ ඉඩම බෙදා ගන්න ගියාම මේ නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙන නීති රීතිත් එක්ක ගැටළු ඇති වෙනවා. පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට තිබෙනවා මේකේ බලයක්. පළාත් පාලන ආයතන විසුරවලා හැරලා නිසා දැන් කර ගන්න දෙයක් නැහැ. පළාත් පාලන ආයතනවල සභාපතිවරයාට තමාගේ ඒ විනිශ්චය දෙන්න පුළුවන් බලයක් තිබෙනවා. ඒ පර්චස් හතරක ප්ලෑන් එකක් ඉදිරිපත් කළොත් පාරම්පරිකව එන ඉඩමක් නම්, ඒකේ කැඩිලා ඉතිරි වෙලා තිබෙන්නේ එපමණ නම්, පවුලේ අයට බෙදිලා ඒ ප්ලෑන් එක අනුමත කර ගැනීමේ බලයක් තිබෙනවා.

නමුත් දැන් පළාත් පාලන ආයතන යහපාලන ආණ්ඩුවෙන් විසුරවා හැරලා අවුරුදු එකහාමාරක් පමණ තිස්සේ මැතිවරණයක් තියන්නේ නැතිව මේ කටයුත්ත කෙරෙන්නේ නැති නිසා තමයි නිලධාරීන්ට මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. එතකොට ප්ලෑනක් අනුමත කරන්න යන අපේ දුප්පත් මිනිස්සුන්ට මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඉතින් මේ විතරක් නොවෙයි. මේ සභාවේ මන්ත්‍රීවරු 104 ක් ඉන්නවා. මේ යෝජනාව ගෙනැල්ලා තිබෙනවා. දැන් මොකද, මහ පරිමාණයෙන් කඩන වෙන්දේසි ඉඩම් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයට ගෙනැල්ලා මහ ඇමතිතුමා ඒක කොමිටියකින් අනුමත කරනවා. මොකක්ද මේකේ යටි පැත්ත. ඒ සභාවට තිබෙන ප්‍රදේශයේ නිලධාරීන්ට බලයක් නැහැ. ඒක පළාත් පාලන අමාත්‍යාංශයට ගෙනැල්ලා, පළාත් පාලන අමාත්‍යාංශයේ මහ ඇමති කාර්යාලයට ගෙනැල්ලා මහ ඇමතිගේ ප්‍රධානත්වයෙන් තිබෙන මේවා එකක් දාලා මේ මහා පරිමාණ ඉඩම් ටික කඩනවා. එතකොට වෙන්දේසිකාරයා එක්ක ගනුදෙනුව යනවා ගානට. මෙතැන හිටපු සභාපතිවරු රාශියක් ඉන්නවා. අපි පළාත් පාලන ආයතනවල හිටපු මිනිස්සු. අපි දන්නවා මේක.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාවට අදාළව නොවෙයි ඔබතුමා කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු මහ ඇමතිතුමාට එහෙම අපහාස කරන්න බැහැ. කෙළින්ම මහ ඇමතිතුමාට චෝදනා කරන්නේ පගා ගැහුවා කියලා. එතුමා මොකක්ද මේ කියන්නේ?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඇහුම්කන් දීලා අහගෙන ඉන්න. පණ්ඩිත වෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම අහගෙන හිටියේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, යෝජනාවට අදාළ වන විධියට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාට ඕනෑ ඕනෑ විධියට කථා කරන්න දෙන්න බැහැ. මේකට අදාළව කථා කරන්න. ඔබතුමා කියන්නේ මහ ඇමතිතුමා පගා -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ජෝන් එක්ක එක්කහු වෙලා තමුන්නාන්සේත් කනවා ඇති ජරාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න කියන්න. කරුණාකරලා ඒක හැන්සාඩ් එකෙන් අයින් කරන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේ යෝජනාව අනුව පළාත් පාලන ආයතන විසුරුවා හැරීම තුළ මේක කරන්න බැරි වෙලා තිබෙනවා. එතකොට මේ නිලධාරීන්ට එහෙම බලයක් නැහැ. ඒ පනතේ තිබෙන්නේ, සභාපතිවරයාගේ තීරණය අනුව ඒකට තීරණයක් දෙන්න පුළුවන්. එයාගෙන් ලියුමක් අරගෙන, දිවුරුම් සහතිකයක් අරගෙන එහෙම දෙන්න පුළුවන්කමක් තිබෙනවා. ඉතින් දැන් මේ ක්‍රමය තුළ ගත්තොත් අපේ නාගරික කලාපවල ඉතාම කුඩා ඉඩම්වලට කැඩෙන්නේ. එතකොට මේවායේ සමහර විට පාරවල් තිබෙනවා. මේ පාරවල්වල අඩි දහයක් නැත්නම් ප්ලෑන් එක පාස් කරන්නේ නැහැ. මේ පනත අනුව. ඒත් පාරම්පරික ඉඩම් හිමියන්. එතකොට ඒකට ජලය, විදුලිය ආණ්ඩුවෙන් දීලා තිබෙනවා. නමුත් ප්ලෑන් එක පාස් කරන්නේ නැහැ. ඉතින් මේ ආකාරයට මේ පනතේ තිබෙන දූර්වලකම් නාගරික සංවර්ධන අධිකාරියේ - ඒ කාලෙත් අපි කිව්වා, මේක දාන්න එපා. අපි පළාත් පාලන ආයතනවල හිටපු වෙලාවේ අපි මේක කිව්වා. එතකොට දැන් මොකක්ද කරන්න තිබෙන්නේ.

අපේ ජගත් කුමාර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ පළාත් සභාවේ තිබෙනවා, ව්‍යවස්ථානුකූලව බලය. පනතක් හදලා, මේ පනත නාගරික සංවර්ධන අධිකාරියට යවන්න. මේ යෝජනාව. ඒගොල්ලෝ එක්ක කථා කරන්න අවස්ථාවක් ලබා දෙන්න. එතකොට තමයි මේක නිවැරදි කරන්න පුළුවන්. නැතිව අපි යෝජනාවක් ගෙනැල්ලා කථා කළාට මේක නිවැරදි කරන්න පුළුවන්කමක් නැහැ. මේක මධ්‍යම ආණ්ඩුවෙන් හදන සැලැස්මක්. එතකොට මධ්‍යම ආණ්ඩුවෙන් හදන සැලැස්මත් එක්ක මේ පනත් කෙටුම්පත් ටික අපි හදන්න ඔබතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් හදලා, අපේ හිටපු සභාපතිවරුන්ව අරගෙන මේකට උපදෙස් ටික අරගෙන ඒ යෝජනාවලිය සංශෝධනය කරන්න. එහෙම නැත්නම් මේ ක්‍රියාවලිය කථා කරලා අපේ කාලය කාලා වැඩක් වෙන්නේ නැහැ. ආණ්ඩුවේ මුදලින් ලයිට් බිල ගෙවලා, මෙතැන පඩිය ගෙවලා, අපට දෙන දීමනාව දීලා මේ යෝජනාව අර කුණු කූඩයට යවන යෝජනාවක් කරලා වැඩක් නැහැ. ඒ නිසා මේකට තීරණයක් ගන්න ඔබතුමන්ලා මැදිහත් වෙන්න ඕනෑ. සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපේ කමිටුවක් පත් කරන්න. නාගරික සංවර්ධන අධිකාරියට එන්න කියන්න. මේක මේ පළාතට විතරක් නොවෙයි. මේක මුළු ලංකාවටම බලපානවා. මේක මුළු ලංකාවටම බලපාන ප්‍රශ්නයක් නිසා මේ ගැන ක්‍රියා කරන්නය කියලා අපි ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

[අ.භා. 01.02]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම කාලෝචිත යෝජනාවක්. මම කනගාටු වෙනවා අපේ හිටපු ඇමතිතුමා විශේෂයෙන්ම මහ ඇමතිතුමාට චෝදනා කළා කමිටුවක් දාලා ඒක මගින් මේසේ යටින් සල්ලි ගන්නවාය කියලා තමයි එතුමා නොකියා කිව්වේ. ඉතින් අපි කනගාටු වෙනවා. මොකද, මෙතෙක් කල් මෙවැනි යෝජනාවක් ආවාම විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවට, නගර සභාවට ඒ හිටපු සභාපතිවරුන්ට ආවාම ඒගොල්ලෝ තනි තීන්දු ගත්තේ. දැන් මහ ඇමතිතුමා මේ කරලා තිබෙන්නේ - මෙතෙක් කල් අපි දන්නවා. අක්කර ගණන් ඉඩම්වලට කට්ටි කඩන්න දුන්නේ තමන්ගේ තනි තීරණයක් අනුව. අපි දන්නවා, අපේ පැතිවලත් තිබෙනවා විශාල ප්‍රමාණයක් ඉඩම් කට්ටි කඩලා. එක ඉඩමක්වත් ඔය සැලැස්මට අනුව සංවර්ධනය කළේ නැති ඉඩම් තිබෙන්නේ. තවම තාර දාලා පාරක් හදලා නැහැ. කාණු ටික දීලා නැහැ. ඒ සංවර්ධනය කරන කෙනා ලාභ ගත්තා මිසක් ඒක සංවර්ධනය කරන්නේ නැහැ. නමුත් ප්‍රාදේශීය සභාවල, නගර සභාවල ඒ හිටපු ලොකු අයට ඒ අවශ්‍ය මුදල් දීලා ගන්න ඇති. ඒකේ අත්දැකීමෙන් තමයි අපේ හිටපු ඇමතිතුමා දැන් කිව්වේ. එතුමාගේ නෝනාත් හිටියානේ සභාපතිවරියක් වෙලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අද යන්නේ කමිටුවක් මගින් කියලා එතුමා කිව්වා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ අත්දැකීම් තමයි එතුමා පැහැදිලි කළේ. අද වෙද්දී -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීතුමාට තේරුණේ නැහැ. අපි කිව්වේ - (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාට කථා කරන්න අවස්ථාවක් නැහැ. බාධා කරන්න එපා. මට විනාඩි 04 යි තිබෙන්නේ. බාධා කරන්න එපා. කරුණාකර මගේ විනාඩි හතර දෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

එහෙම නොවෙයි කිව්වේ. පනතේ තිබෙන බලය. මේ පනතේ බලය තමයි අපි කියලා දුන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. බාධා කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම දැන් සතුටු වෙනවා. අඩුම ගණනේ මේ මහ ඇමතිතුමා හරි ඒ ගැන කල්පනා කරලා කමිටුවක් දාලා, මේක තීරණය කරන්න එවැනි පියරවක් ගැනීම ගැන. මොකද, අද අපි දන්නවා. ප්‍රාදේශීය සභාවල, නගර සභාවල TO ලාට ඕනෑ ඕනෑ විදියට තමයි ප්ලෑන් අනුමත කරන්නේ. සමහර වෙලාවට TO ට ප්ලෑන් එක අදින්නත් දෙන්න ඕනෑ. නැත්නම් අනුමත කරන්නේ නැහැ. මෙවැනි තත්ත්වයක් තිබෙන්නේ. එවැනි තත්ත්වයක් උඩ අද මහ ඇමතිතුමා එවැනි පියවරක් අරගෙන තිබෙනවා නම්, ඒක ගැන අපි ප්‍රශංසා කරන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව ගැන. අපි දන්නවා. විශේෂයෙන්ම එතුමා ඉන්න ප්‍රදේශයේ අයට ඒක වැඩියෙන්ම බලපානවා. මුස්ලිම් ජනතාවට බලපාන විශාල ප්‍රශ්නයක් මේක. ඒ නිසා මේකට විසඳුමක් තිබෙන්න ඕනෑ. අපේ පැතිවලත් ඉන්නවා. මට ඊයේ පෙරෙයිදා පර්චස් 17 ක් තිබෙන කෙනෙක් කිව්වා, මේකෙන් පර්චස් හතක් හරි, අටක් හරි විකුණලා ඉතිරි බාගයේ මට ගෙයක් හදා ගන්න සල්ලි ටික සොයා ගන්න ඕනෑය කියලා. ප්‍රාදේශීය සභාවට ගියාම ඒක අනුමත කරන්න බැහැයි කිව්වාලු. ඉතින් මෙවැනි අසරණ වුණු මිනිස්සු ගොඩක් ඉන්නවා. අපි මේ කථා කරන්නේ කොන්ත්‍රාත්කරුවන් ගැනවත්, එහෙම නැත්නම් ඉඩම් කට්ටි කරන අය ගැනවත් නොවෙයි. මේ තමන්ට ගෙයක් හදා ගන්න, පර්චස් හතර, පහ, හය තිබෙන කෙනෙකුට ගෙයක් හදාගන්න අවශ්‍යතාවය තිබෙනවා නම් ඒකට අපි උදව් කරන්න ඕනෑ. ඒ නිසා ඒකට මේ අද තිබෙන නීති ටිකක් වෙනස් වෙන්න ඕනෑ. අද ඉඩම් නැති වේගෙන යන කාලයක් තිබෙන්නේ.

මේ ලංකාව කියන්නේ ඉතා කුඩා දූපතක්. මේ දූපතේ ජනගහනය එන්න එන්න වැඩි වෙනවා. දැන් මිලියන දෙකකට එහාට ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා අපි මේගොල්ලන්ට පොඩි උදව්වක් දෙන්න ඕනෑ. රජයක් වශයෙන්, පළාත් සභාවක් වශයෙන්, නගර සභා, ප්‍රාදේශීය සභා වශයෙන් ජීවත් වන ජනතාවට අපේ උදව්ව කරන්න තිබෙනවා නම් ඒ උදව්ව කරන්න ඕනෑ. මොකද, ගොඩක් දෙනෙකුට අද නිවසක් හදා ගන්න බැහැ. ලොකු ඉඩමක් ගන්න විධියක් නැහැ. සාමාන්‍ය ප්‍රදේශයක ගත්තත් අද ලක්ෂ හතරයි පහයි පර්චස් එකක්. ඉතින් පර්චස් හතරක් පහක් අරගෙන දුප්පත් මිනිහෙක් ගෙයක් හදා ගන්න හදනවා නම්, ඒකට ඉඩ දෙන්නේ නැත්නම් ඒක විශාල වරදක්. ඒ නිසා විශේෂයෙන්ම අපේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාවට මම හිතන්නේ නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක එකතු වෙලා, සාකච්ඡා කරලා අපේ මහ ඇමතිතුමා විශේෂයෙන්ම ප්‍රකාශයක් කළා, වෙන්දේසිකරුවන්ට ඇරෙන්න තමන්ගේ පවුලේ අය අතර බෙදිලා යන ඉඩමක් තිබෙනවා නම්, ඒකට අවසරය ලබා දෙන්න පළාත් පාලන ආයතනවල අද ඉන්න කොමසාරිස්වරුන්ට ඒ අවශ්‍ය බලතල තිබෙනවාය කියලා. එහෙම නැත්නම් එතුමා කිව්වා, එතුමාට ඒක දෙන්න. එතුමා කරලා දෙන්නම් කියලා. ඒ නිසා අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. සමහර වෙලාවට හිතාගෙන ඉන්නවා. අපි දන්නවා. අද අපේ ප්‍රාදේශීය සභාවල, නගර සභාවල බලය ඔක්කොම තියාගෙන හිටියේ පුද්ගලයෝ දෙන්නෙක් තුන් දෙනෙක් අතර. අද ඇත්තටම TO ලාට කියලා වැඩක් කර ගන්න බැහැ. TO ලාට ප්ලෑන් එකක් අනුමත කර ගන්න ගියාම මටම ඇවිල්ලා සමහර වෙලාවට කියලා තිබෙනවා. මේ TO ට ප්ලෑන් එක අදින්න දුන්නේ නැත්නම් ප්ලෑන් එක අනුමත කරන්නේ නැහැයි කියලා. එයාගෙන්ම ප්ලෑන් එකත් ඇඳ ගන්න ඕනෑ. නැත්නම් අනුමත කරන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තිබෙන්නේ. මේක අද ඊයේ නොවෙයි. අවුරුදු ගණනාවක ඉඳන් තිබෙන ප්‍රශ්නයක් මේක. මේක සමහර වෙලාවට හිටපු සභාපතිවරු, නගරාධිපතිවරු මම හිතන්නේ අයුතු ලෙස පාවිච්චි කරන්න

[ගරු ශ්‍රීනාත් පෙරේරා]

ඇති. මේවාවලින් මුදල් උපයා ගන්න. අපි දන්නවා. විශාල වශයෙන් මේවා සිදු වුණා. මම මහ ඇමතිතුමාට යෝජනා කරනවා. මේක නගර සභා, ප්‍රාදේශීය සභාවලත් තනි තීන්දු ගන්න දෙන්නේ නැතිව මේකටත් කමිටුවක් පත් කරන්නය කියලා. මොකද, එතකොට මේක තනිවම හොරා කන්න හම්බ වෙන්නේ නැහැ, කාටවත්. 10 දෙනෙකුගෙන් විතර කමිටුවක් පත් කරලා අපේ සමාජයේ ඉන්නවා ජ්‍යෙෂ්ට පුරවැසියෝ. හොඳ නිලතල, තනතුරු දරපු අය ඉන්නවා. ඒ අයව සම්බන්ධ කරලා කමිටුවක් දාලා මේ කමිටුව මඟින් මේ අනුමත කිරීම් ලබා දෙන්නය කියලා. එතකොට කාටවත් සල්ලි හොරකම් කරන්න හම්බ වෙන්නේ නැහැ. අර දුප්පත් මිනිහාගේ පොකට් එකට ගහන්න ඉඩකඩ ලැබෙන්නේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම අපේ ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව බහුතරයකට - අද වතුර ටික ගන්න බැරිව ඉන්නවා. අද විදුලිය ගන්න බැරිව ඉන්නවා. මේ කුඩා පර්චස් හතරක, පහක ඉන්න අයට ගෙයක් හදා ගන්න බැරිව ඉන්නවා. මොකද, සමහර වෙලාවට වෙන්න පුළුවන්. අපි දන්නවා. අනවසරයෙන් හරි පදිංචි වුණු පොඩි කෑල්ලක ගෙයක් හදාගෙන ඉන්නවා. ඉතින් ඒකත් මම හිතන්නේ ලොකු බරක්. රජයට තිබෙන බරක් අඩු වීමක් ඒකත්. මොකද, වෙල් කෑල්ලක් හරි සොයා ගෙන පොඩි ගෙයක් හදා ගන්න එක, ඒගොල්ලන්ගේ ස්ව ශක්තියෙන් ඒක කර ගන්නවා නම්, ඒකත් ලොකු දෙයක්. මොකද, ඒගොල්ලන්ට ඉන්න තැනක් රජයටත් දෙන්න බැරි නම්, මහජනතාවගේ බදු මුදල්වලට ප්‍රශ්නයක් නොවී ඒගොල්ලෝම හදා ගන්නවා නම් ඇයි අපට බැරි මේකට අනුමැතියක් ලබා දෙන්න. මේ දුප්පත් මිනිස්සු ගැන අපි කථා කරන්නේ. මේ ලොකු ලොකු මිනිස්සු ඉඩම් අල්ලා ගන්න අය - අපි දන්නවා, දේශපාලඥයොත් ඕනෑ තරම් ලොකු ලොකු ඉඩම් අල්ලා ගන්නවා. ඒ අය ගැන නොවෙයි අපි කථා කරන්නේ. අපි කථා කරන්නේ මේ පොඩි මිනිහා ගැන. මේ පොඩි මිනිහාට මේ අවස්ථාව ලබා දෙන්න අවශ්‍ය නීති රීති ටික සකසලා දෙන්නය කියලා ඔබතුමා මාර්ගයෙන් අපි ඉල්ලා සිටිනවා. ගරු මන්ත්‍රීතුමාට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, මේ යෝජනාව මේ සභාවට ගෙන ඒම ගැන.

[අ.භා.01.11]

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දවස පුරාම පළාත් සභාව තුළ තිබුණේ, නොසන්සුන් භාවයක්. සෝෂාකාරී බව, එකිනෙකාට ඇණුම් පද කියා ගැනීම්. ඒ වාගේ වෙලාවක ඉතාමත්ම වැදගත් යෝජනාවක්, ඉතාමත් කාලෝචිත යෝජනාවක්, අර්ථාන්විත යෝජනාවක් ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ගෙන ඒම පිළිබඳව මම මගේ ප්‍රණාමය එතුමාට පුද කරනවා. අර අපේ උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාගේ කරුණු පැහැදිලි කිරීමේදී මේ පළාත් සභාවේ තිබෙන වැටීම එතුමා කථා කළා. මම හිතන්නේ මේ වාගේ යෝජනා මේ පළාත් සභාවේ කථා කරනවා නම්, මේවා අහගෙන ඉන්න ජනතාව, ඒ වාගේම මාධ්‍යවේදීන් අනිවාර්යෙන්ම කියනවා, මේ පළාත් සභාව නැගිටින වැදගත් පළාත් සභාවක් කියලා. මම මේකට වචන කිහිපයක් කථා කරන්න මැදිහත් වුණේ, මමත් පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයෙක් හැටියට මේ කාරණාව පිළිබඳව මටත් විශාල අත්දැකීම් රාශියක් තිබෙනවා. මේ දුක් ගැනවිල්ල, මේ අඳෝනාව අවුරුදු ගණනක් තිස්සේ තිබුණා. නමුත් කිසිම පිළිසරණක් තිබුණේ නැහැ. කිසිම තැනක කියවුණේ නැහැ.

ඒ නිසා තමුන්නාන්සේ ඒ ප්‍රදේශයේ සැබෑ මහජන නියෝජිතයෙකු හැටියට මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම නැවතත් තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කථාව ඇත්ත. අපි හැමෝම දන්නවා. පර්චස් දහයක් විතර තිබෙන කොට ඒ ගෙදර පවුලේ තුන් හතර දෙනෙක් ඉන්නවා. මේක බෙදන්න විධියක් නැහැ. මොකද, අනුමත කරන්නේ නැහැ. ඊළඟට මේ ඉඩමේ කොටස් උවමනා වෙන්නේ තමන්ගේ දරුවාව පාසලට දාගන්න. තමන්ගේ අනන්‍යතාවය ප්‍රකාශ කරන්න. මේ වාගේ කාරණා සඳහා. ඒවා කරන්න බැරිව ජනතාවක් මොන තරම් දුක් වින්දාද කියන කාරණාව අපි හැමෝම දන්නවා. ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණාව ලෙහෙසි පහසු කාරණාවක් නොවෙයි. දැන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම අභියෝග කරන්නේ නැහැ. එතුමා ඒ වගකීම භාර අරගෙන කිව්වා, ඒකේ ප්‍රශ්නයක් නැහැ. මම විසඳනවාය කියලා. නමුත් මේකේ නෛතික ස්වභාවයක් කොහේ හරි තිබෙන්න ඕනෑ. එතකොට නෛතික ස්වභාවයක් ඇති කරන්න නම්, මගේ පෞද්ගලික මතය තුළ ඒකේ තිබෙනවා ගැඹුරක්. ඒ කියන්නේ මේ සභාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා, මේ කාර්යභාරය ක්‍රියාත්මක කරන්න වෙන්නේ, නාගරික සංවර්ධන අධිකාරියෙන්. මොකද, හැම පළාත් පාලන ආයතනයකම පළාත් පාලන ආයතනයට බලය පවරලා තිබෙනවා නාගරික සංවර්ධන අධිකාරියෙන්. තේරුණාද? මම දන්න හින්දා කියන්නේ.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩි ඌණපූරණයක් කරන්නම්. දැන් මේ පිළිබඳව නුවර එළිය නගර සභාවේ සහ කතරගම නගර සභාවේ Plean Pass කරන්නේ නාගරික සංවර්ධන අධිකාරිය වෙනමම ඒකකයක් පිහිටුවා ගෙනයි. ඒ අවසරය ඔවුන්ගෙන් ඉවත් කර ගෙන වෙනමම නාගරික සංවර්ධන අධිකාරිය කරන්න භාර ගත්තා. ඒ කියන්නේ නගර සභාවට දුන්නේ නැහැ. නගර සභාවට දීලා තිබෙන්නේ පිටස්තර බලයක් ඒක. ඒ නිසා නගරාධිපතිවරයාටවත්, උප නගරාධිපතිවරයාටවත් කොහෙත්ම නෛතික - කොහෙත්ම බලපෑමක් කරන්න බැහැ. මේක තනිකරම නාගරික සංවර්ධන අධිකාරියට අයිති කටයුත්තක් වෙලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඒකයි මම මේ කියන්න යන්නේ. මම ඒක දන්නවා. දැන් නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙන බහුවිධ විෂයයන් නිසා ඒගොල්ලෝ මේක විමධ්‍යගත කරලා තිබෙන්නේ. ඒක තමයි පළාත් පාලන ආයතනයට භාර දීලා තිබෙන්නේ. එතකොට මම කියන්නේ, මෙතැනදී ගන්න දේ නෛතික වෙන්න නම්, සැබවින්ම ජනතාවාදී ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න නම් අපි මෙතැන මේක කථා කරලා මේ යෝජනාව යවන්න ඕනෑ නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාට. එතුමා ඒක පිළිපැද්දොත් එතැනින් තමයි යළිත් වරක් පළාත් පාලන ආයතනවලට එන්නේ. එතැනින් නවතින්නේ නැහැ. මම දන්න මගේ දැනුම හැටියට. ප්‍රධාන අමාත්‍යවරයා පළාත් පාලන අමාත්‍යවරයා හැටියට එතුමා උපදෙස් දෙන්න ඕනෑ, නියෝගයක් දෙන්න ඕනෑ පළාත් පාලන කොමසාරිස්වරියට. හැම පළාත් පාලන ආයතනයකම අතුරු ව්‍යවස්ථාවකට මේක දාන්නය කියලා. By-law එකකට. අතුරු ව්‍යවස්ථාවකට දාපුවාම ඒ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වෙනවා, මේ පළාත් පාලන ආයතනයේ මේ මේ ප්‍රදේශවල කෙරෙන්න ඕනෑය කියලා. එතැනින් එහාට ගිහිල්ලා මම කාරණාවක් කියන්න ඕනෑ. මගේ අත්දැකීම් එක්ක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාරම්පරික ඉඩම්. මතක තියා ගන්න. නාගරිකයටයි මේක බලපාන්නේ. දැන් හොරණ පැත්තේ ප්‍රශ්නයක් නැහැ. හොරණ නගරයේ වාගේ තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. හැබැයි, මේ කොන්දේසිවල තිබෙන්න ඕනෑ, අනිවාර්යයෙන් මේ කුඩා කැබලිවලට කැඩෙන ඒ ඉඩමට අනිවාර්යයෙන් නල ජලය තිබෙන්න ඕනෑ. මොකද, නල ජලය නොතිබුණොත් පරිසර හානියක් වෙනවා. ඊයේ පෙරෙයිදා අපට අවස්ථාව ලැබුණා. ප්‍රධාන අමාත්‍යතුමාට, මට සහ මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමාට. අපට තිබුණා පරිසරය පිළිබඳව - අපේ පළාත් සභාවේ සියලු දෙනාට. රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ගියා. සියලු දෙනාටම ආරාධනා කරලා තිබුණා. පදනම් ආයතනයේ පරිසරය පිළිබඳව සාකච්ඡාවක් තිබුණා. එතැනදි පැහැදිලිවම මහාචාර්යවරු, විද්වතුන් කිව්වා බස්නාහිර පළාතේ කොහේවත්ම වතුර බොන්න හොඳ නැහැයි කියලා. බස්නාහිර පළාතේම. ඒ කියන්නේ භූගත ජලයේ තිබෙන ඉතාමත්ම විෂ සහිත තත්ත්වය තුළ. ඒ නිසා පැහැදිලිව කිව්වා, නල ජලයයි අද අපි භාවිතයට ගත යුත්තේ කියලා. ඒක හරි වැදගත් කාරණයක්. ඒ වාගේම හැදෙන ලෙඩ රෝග පිළිබඳව. ඒවා ඔක්කොම Display කරලා අපට පෙන්නුවා. එතකොට අපි කල්පනා කළා. බස්නාහිර පළාතේ හොඳ වතුර තිබෙනවාය කියන ප්‍රදේශවලත් තිබෙන්නේ භූගත විෂ සහිත ජලය. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොන්දේසියක් දාන්න ඕනෑ. මේ කැඩෙන කට්ටිවලට අනිවාර්යයෙන්ම නල ජලය තිබෙන්න ඕනෑය කියන කාරණාව.

ඒ වාගේම මම තවත් එක දෙයක් කියන්න ඕනෑ. ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ මෑතකදී ගන්නා ලද ක්‍රියාමාර්ගය පිළිබඳව මම මතක් කරන්න ඕනෑ. දැන් පළාත් පාලන ආයතන විසුරුවා හැරලා තිබෙන්නේ. දැන් පළාත් පාලන ආයතන විසුරුවා හැරියාට පස්සේ මේක නිලධාරීන් මතට වැටිලා තිබෙන්නේ. නිලධාරීන් දූෂණයට පෙළඹෙමින් තිබුණේ. බිම් කට්ටි කැඩීමේදී නිලධාරීන් දූෂණයට පෙළඹෙමින් තිබුණේ. ඒ අවස්ථාවේදී තමයි ගරු ප්‍රධාන අමාත්‍යතුමා විෂය භාර අමාත්‍යවරයා හැටියට එතුමාගේ අවධානයට අරගෙන, එතුමාගේ යටතට අරගෙන, පළාත් පාලන කොමසාරිස්තුමියගේ අනුදැනුම ඇතිව ඒවා අනුමත කිරීමේ අයිතිය - අයිතිය නොවෙයි, මම හිතන්නේ බලය ගත්තේ. ඒක හොඳ දෙයක්. මොකද, මමත් දන්නවා. ප්‍රධාන අමාත්‍යතුමාට මමත් යම් යම් කාරණා සැලකිල්ලට ගන්නය කියලා එතුමාට මම කරුණු ඉදිරිපත් කළාම, එතුමා ඉතාම මනාව, සැලසුම් සහගතව ඒවා නිර්දෝෂීව නිදොස් කරලා දුන්නා. ඒක වරදක් නොවෙයි. සමහර විට ප්‍රධාන අමාත්‍යතුමාට මඩ ගහන්න, තමන්ගේ පුරුදු ඒ විධියටම ඉෂ්ට සිද්ධ කර ගන්න බැරි අය ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අවලාද නගන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද ඒ?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නමුත්, මම මේ පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට පළාත් සභා වාර දෙකකදී ඇමතිවරයකු හැටියට කටයුතු කරපු මම, පළාත් පාලන ආයතනයක සභාපතිවරයෙක් හැටියට කටයුතු කළ මම වගකීමෙන් කියනවා, ඉසුර දේවප්‍රිය ගරු ප්‍රධාන අමාත්‍යතුමා කිසිම විධියක අයුතු දේවල් මේ අවස්ථාවේදී කරලා නැහැ. මොකද, මම එහෙම කියන්නේ. මේ සභාවේදී ඇතැම් අය ඒ කාලයේදී කරපු දේවල් අද නිර්දෝෂීයි කියලා තිබෙනවා. (බාධා කිරීම්) මෙතැන ලොකු කථා බහකට ලක් වුණා, අපේ ජයන්ති විජේතුංග මහත්මියගේ ස්ථාන මාරුව පිළිබඳව. ජයන්ති විජේතුංග මහත්මිය හරි අහිංසකයි. මම දන්නවා. නමුත් එතුමියට ඇවිල්ලා තිබෙන චෝදනාත් - මේ දවසේ 2016 සැප්තැම්බර් මාසයේ බත්තරමුල්ලේ රන්මඟ පාය පිටුපස ඇති නිසි ප්‍රවේශ මාර්ගයක් ද නොමැති -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොඩිකාර ඇමතිතුමා ගත්ත ඉඩම. ප්‍රවාහන අමාත්‍යාංශයට කොඩිකාර මන්ත්‍රීතුමා ගත් ඉඩම.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පර්චස් 15 ක ව්‍යාජ පිඹුරු සකස් කරමින් - කවුරුත් කරපු දේවල්වලට. එතුමියට තමයි අද මේවා වෙලා තිබෙන්නේ. එතුමිය අහිංසකයි. හරි නම් FCID එකට තමුන්නාන්සේලා දෙන්න ඕනෑ මේවාවලට අදාළ අයගෙත් වතගොත එක්ක. සමහර විට මම යෝජනා කරනවා, FCID යට මේ ඡේදය යටතේ වෙනම පරීක්ෂණයක් කරලා එතුමිය මේකට අදාළ ද නැද්ද කියන එක තීන්දු කරන්නය කියලා. එපමණයි කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ප්‍රකාශයක් කළා මීට ඉස්සෙල්ලා මේ සභාවට.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ නම කිව්වේ නැහැ. අනුන්ගේ ප්‍රශ්නවලට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම ඇමතිවරයාව සිටින කාලයේ, බර්නාඩ් වසන්ත ලේකම්තුමා ඉන්න කාලයේ (බාධා කිරීම්) පොඩ්ඩක් අහගෙන ඉන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. ගරු කොඩිකාර මන්ත්‍රීතුමා, ඔබතුමා කථා කරන්නේ මොකක් යටතේද? ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම සභාවේ ප්‍රකාශයක් කළා. එදා හිටපු අධ්‍යක්ෂ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ නම කිව්වේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මම නේ හිටපු ඇමති. කවුරුත් දන්නවා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ. නැහැ. කවුරුවත් දන්නේ නැහැ. ඔබතුමාගේ නම කිව්වේ නැහැ. ඔබතුමා ඇඟේ ගහ ගන්න එපා ඒක.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මේවා ඔප්පු කරන්න බැහැ. මේවා නීත්‍යානුකූලව කරපු වැඩ. මම බැංකු ලෝන් එකක් අරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය තීන්දුවක් අරගෙන සංවර්ධනය කරන්න ගත්ත ඉඩම්

කැල්ලක්. මේකේ කිසි දෙයක් වැරැද්දක් වෙලා නැහැ. මඩ ගහන්න ඕනෑ දෙයක් කියන්න පුළුවන්. (බාධා කිරීම්) මේ මඩ. දැන් මේ කථා කරපු මන්ත්‍රීතුමා, මංකොල්ලකාරයෝ, පාතාලකාරයෝ හොරට ගිවිසුම් අත්සන් කරලා රට අරන් ගියේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නම කිව්වේ නැහැ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මංකොල්ලකාරයෝ, පාතාලකාරයෝ - මේ කථා කරපු කට්ටිය වාගේ ජරා වැඩ කරලා නැහැ. ඒ නිසා මම කියනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමාට. මේ සභාවේ මණ්ඩලයක් පත් කරලා මේ ගැන පරීක්ෂණයක් කරලා මේ සභාවට වාර්තාවක් ඉදිරිපත් කරන්න. මේක සාමදානයෙන් කථා කරලා වැඩක් නැහැ නේ?

[සභාවේ ඝෝෂා]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොඩිකාර ගරු මන්ත්‍රීතුමා වැරැද්දක් කරලා නැත්නම් මේ කථාව FCID එකට යොමු කරලා - දැන් එතුමා අර කිව්ව රට අරන් ගිය කෙනා කවුද දන්නේ නැහැ. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර වාඩි වෙන්න. මීළඟට ලෙනාඩ් කරුණාරත්න මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙනවා. ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා කථා කරන්න.

[අ.භා.01.20]

**ගරු ලෙනාඩ් කරුණාරත්න**
Hon. Leonard Karunaratne

නොයෙකුත් බාධාවන් මධ්‍යයේ මා හටත් විනාඩි කිහිපයක් අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අද මේ විශේෂ යෝජනාව පිළිබඳව අපි කවුරුත් අගය කරමින් අදහස් දැක්වුවා. ඉෆ්තිකාර් මරික්කාර් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට. මම හිතන්නේ, අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීවරු මේ පිළිබඳව සාධනීය අදහසකින් යුක්තව මේ යෝජනාවට අනුග්‍රාහකත්වය ලබා දෙමින් සම්මත කළ යුතුයි කියන අදහසින් තමයි කාගෙත් අදහස් හා යෝජනා, කරුණු ඉදිරිපත් වුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ පිළිබඳව තිබෙන අදහස මීට වඩා තරමක් වෙනස්. හැබැයි, මේ යෝජනාවේ යම්කිසි ගැටළුවක් තිබුණා. පාරම්පරිකව පවුල්වල ජීවත් වන අය පිළිබඳව වශයෙන් දන්වලා තිබුණේ. හැබැයි, ඒ පාරම්පරික කියන ඒ වචනය තුළ කාල රාමුවක් නිර්වචනය නොවුණත් ඉන් පසුව මේ යෝජනාව සංශෝධනයට ලක් කරමින් අපේ ගරු මන්ත්‍රීතුමා නැවත වතාවක් ඒ යෝජනාව ඉදිරිපත් කර තිබුණා. වසර 40 කට වඩා වැඩි කාලයක් තුළ ඒ ඉඩම්වල පදිංචිව සිටින පාරම්පරිකව ජීවත් වන අයට මේ පර්චස් හතර පහ වැනි කුඩා බිම් කොටස්වලට අනුමැතිය ලබා දිය යුතුයි ඔවුන්ගේ ඊළඟ පරම්පරාවට හෝ ඒ ඉඩකඩම්වල ඒ අවශ්‍ය නීත්‍යානුකූල අයිතිය ලබා දීමට.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතනයක සභාපතිවරු වශයෙන් වැඩ කටයුතු කරපු බොහෝ දෙනෙක් මෙතැන සිටිනවා. මමත් වසර පහක් පළාත් පාලන ආයතනයක සභාපතිවරයකු වශයෙන් සේවය කළා. ඒ කාලය තුළදී මෙවැනි ඉල්ලීම් කැස්බෑව නගර සභා බල ප්‍රදේශය තුළත් අපට ලැබුණා. අපි සභාපතිවරයා සතු ඒ අභිමත බලය පාවිච්චි කරමින්, භාවිතා කරමින් මෙවැනි ඉල්ලීම්වලට ඉතාමත් අහිංසක, වරප්‍රසාද අඩු, දුගී දුප්පත් ඒ අහිංසක ගම් වැසියන්ගේ ඉල්ලීම්වලට අපි ඉඩ ලබා දුන්නාය කියන එක අපි මේ අවස්ථාවේදී පිළිගන්නවා. මෙතැන ඉන්න සියලුම ගරු සභාපතිවරුනුත්, ඒ සඳහා එසේ

[ගරු ලෙනාඩ් කරුණාරත්න]

අනුමැතිය ලබා දුන්නාය කියන එක අපි කවුරුත් දන්නවා. ඒ වෙනුවෙන් අපටත් කළ හැකි පහසුම දේ තමයි එය. මේ ගැටළුව, මේ අර්බුදය විසඳන්නට අපට බස්නාහිර පළාත වශයෙන්, මධ්‍යම රජය වශයෙන් මේ සඳහා අනාගතයේ ඒ සංවර්ධනය, අභියෝග, ඉලක්ක ජය ගන්නට හැකි ඒකට අනුගත වෙමින් යම්කිසි විසඳුමක්, උපක්‍රමයක් අපට ලබා දෙන්නට හැකි වෙලා නැහැයි කියන එක මම විශ්වාස කරනවා. පර්චස් හතර පහ බැගින් ඉඩකඩම්වලට අපි අනුමැතිය ලබා දෙන කොට ඒ හරහා ගොඩනැගෙන තවත් දහසකුත් ප්‍රශ්න තිබෙනවා. අපට අපේ ගමේ පුද්ගලයා මේ අහිංසක පුද්ගලයා මේ ඉඩමට අනුමැතිය ඉල්ලන කොට, මේ පර්චස් හතරට පහට නැවත වතාවක් තමන්ගේ දුවා දරුවා වෙනුවෙන් මේ බිම් කොටස, පර්චස් හතරට, පහට වෙන් කරලා ඒ බිම් කොටසට අනුමැතිය දෙන කොට සභාපතිවරයා වශයෙන් අපට යම්කිසි දේශපාලන පිළිගැනීමකුත් ලැබෙනවා. ගමට ගියාම අපව ඉතාමත් ඉහළින් පිළිගන්නවා ඒ ඉඩම් හිමියන්. අපේ සේවය ලබා ගත්, අපේ අනුමැතිය ලබා ගත් ඉඩම් හිමියෝ ගමට ගියාම අපට හොඳ දේශපාලන වාසියකුත් ලබා දෙනවා. ඒ නිසා අපි මේ ප්‍රශ්නය ඉතාම සරළව අරගෙන අපට කළ හැකි පහසුම දේ තමයි ඉඩම් කොටස අනුමත කරලා දෙන එක.

හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නම් ඒක අනුමත කරන්නේ නැහැ. මගේ මතය. මේ ඉඩම් කියලා කියන්නේ අපේ රටේ හෙට දවසේ සංවර්ධනයේදී භෞතික සංවර්ධනයේදී අපට භාවිතා කළ හැකි ඉතාමත්ම සීමිතම සම්පත තමයි ඉඩම්. අපේ සංවර්ධනයේදී අපි නිසි කළමනාකරණයක් කර ගත්තේ නැත්නම් මේ ඉඩම් කියන සීමිත සම්පත හෙට දවසේ අපේ ඒ සංවර්ධනයේ අභියෝගයේ ඉලක්කයන් කරා ළඟා කර ගන්නට අපට හැකි වෙන්නේ නැහැ. අපි උදාහරණයක් ගත්තොත් පර්චස් 20 ක් තිබෙන වැඩිහිටියෙකු, දෙමව්පියන්, ඒ දෙමව්පියන්ගේ දරුවන් තිදෙනා අතර ඒ පර්චස් 20 බෙදන කොට, නැත්නම් පර්චස් 10 ඒ තුන් දෙනා අතර බෙදන කොට පර්චස් හතරක් වාගේ ප්‍රමාණයකට බෙදෙන්න වෙන්නේ. නමුත් ඒ හරහා අපට පුළුවන්කම තිබෙන්න ඕනෑ, ඒ දූප්පත්, ඒ වැඩිහිටියාගේ අභියෝගය පළාත් සභාවක් වශයෙන්, එහෙම නැත්නම් මධ්‍යම රජයක් වශයෙන් භාර අරගෙන ඒ ඉඩම තුළ ඉඩම් කොටස් තුනකට වෙන් කරලා ගෙවල් තුනක් හදනවා වෙනුවට ඒ ඉඩම තුළ ඒකක තුනක ඒ ඉඩම් කොටස් වෙන් කරන්නේ නැතිව ඒ තිදෙනාට ජීවත් විය හැකි නිවසක් සෑදීමට අවශ්‍ය ආධාරය, එහෙම නැත්නම් නිවාස ණයක් ලබා දීලා ඔහුව ශක්තිමත් කරන එක තමයි කරන්න ඕනෑ. බිම් කොටස් තුනකට ඒ පර්චස් දහය වෙන් කරනවා වෙනුවට ඒ තිදෙනාට ඒකක තුනකින් යුත් නිවසක් ඒ තනි පර්චස් දහයේ ඉඩම තුළ ඉදි කිරීමට අවශ්‍ය මූල්‍ය සහ අනෙකුත් ශක්තිය, යටිතල පහසුකම් ලබා දීමේ වැඩ පිළිවෙළක් අපි පළාත් සභා වශයෙන් ක්‍රියාත්මක කළ යුතුයි. අපි පසුගිය දශක කිහිපය පුරාවටම මේ රට තුළ නොයෙකුත් රජයන් විසින් ක්‍රියාත්මක කරපු නිවාස යෝජනා ක්‍රම මම හිතන්නේ හෙට දවසේ අපේ අනාගතයේ සංවර්ධන ඉලක්කයන් කරා ගෙන යන්නට අවශ්‍ය පදනම මත නොවෙයි කටයුතු කෙරුණේ. ඒ නිසා අද මේ මොහොතේ අද දවසේ ක්‍රියාත්මක වන නිවාස සංවර්ධන යෝජනා ක්‍රමත්, නිවාස සැලසුම්, නොයෙකුත් නිවාස යෝජනා ක්‍රම අනුබල දෙන්නේ තනි ඒකක නිවාස සෑදීමට. නමුත් මම විශ්වාස කරනවා. අපි මේ ක්‍රමවේදය, මේ සංකල්පයෙන් බැහැර වෙන්නට ඕනෑ. අපට වඩා ඉඩම් තිබෙන අනෙකුත් රටවල් මේ ඉඩම්වල තිබෙන සීමිත සම්පත බොහොම පැහැදිලිව තේරුම් අරගෙන අද තට්ටු නිවාසවලට යන යුගයක් - තනි ඒකක නිවාස සාදන්නට අනෙකුත් රටවල රජයන් සහ අධිකාරීන් ඒ ඉඩම් අයිතිකරුවන්ට අනුබල නොදෙන තත්ත්වයක් අපි දකිනවා. අනෙකුත් රටවල් අධ්‍යයනය කළොත්. ඇයි? අපේ රටේ අපට මේ වගකීම, අභියෝගය බාර ගන්න බැරි.

පළාත් සභාව වශයෙන් මම විශ්වාස කරනවා, පර්චස් හතර පහ ඉඩම් කොටස්වලට ඉඩම කැඩෙන්න ඉඩ නොදී ඒ පර්චස් දහයක ඉඩමක් තිබෙනවා නම්, ඒ පර්චස් දහය ඉඩම ඒ ඉඩම් හිමියාට තමන්ගේ දරුවන් තුන් දෙනාට ඒ ඉඩම කොටස් තුනකට වෙන් කරලා දෙන්න අවශ්‍යතාවයක් තිබෙනවා නම් ඒ ඉඩම භෞතිකය වෙන් කරන්නේ නැතිව, ඒ ඉඩම තුළ නිවසක් ඒ තිදෙනාට ජීවත් විය හැකි නිවසක් සාදා දීමට හැකි පරිසරයක් ඒ හා සමඟ අවශ්‍ය මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබා දෙන වැඩ සටහනක් පළාත් සභාව වශයෙන් ඉදිරිපත් කළ යුතුයි. අන්න එතකොට තමයි ඒ තිදෙනාට ඒ පර්චස් දහය ඇතුළේ යම්කිසි දවසක පර්චස් කිහිපයක් ඉතිරි වෙන්නේ. අඩුම ගණනේ තවත් වෙනත් දෙයකට යොදවා ගන්න පුළුවන් වන පරිදි. තමන්ට පරිභෝජනය කළ හැකි එළවළු පැලයක්, පලතුරු පැළයක් හිටවා ගන්න පුළුවන් හැකි ඒ පර්චස් ප්‍රමාණයක් ඒ ඉඩම තුළ ඉතිරි වෙනවා. මම

හිතන්නේ, මේක තමයි පළාත් සභාවෙන් අපි හෙට දවසේ හඳුන්වා දිය යුතු දේ කියලා මම විශ්වාස කරනවා. මම මේ යෝජනාවට විපක්ෂව කථා කරනවා හෝ විරෝධය දක්වනවා නොවෙයි. නමුත් අපේ වගකීම, පළාත් සභාවේ අභියෝගය අපි තවමත් තේරුම් ගත්තේ නැහැයි කියන අදහස මගේ තිබෙන්නේ. ඒ නිසා ඒ වෙනුවෙන් පළාත් සභාවේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීමත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා.01.27]

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බෙහෙවින්ම ස්තූතිවන්ත වෙනවා මගේ යෝජනාවට පක්ෂවත්, විපක්ෂවත් කථා කරපු සියලුම මන්ත්‍රීවරුන්ට. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවේදී අර්ථ කථනය කළේ අර කට්ටි කඩන දේවල්වත්, එහෙම නැත්නම් පර්චස් හය හතර කිරීමක්වත්, දහයට අඩු කිරීමක්, සීමා කිරීමක්වත් නොවෙයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේකෙන් විය යුත්තේ ඒ දූප්පත් අසරණ පවුල්වල ජීවත් වන පවුලේ උදවියට ප්‍රායෝගිකව මතුවන ගැටළු විසඳා දීමේ කර්තව්‍යයක් මහජන නියෝජිතයන් හැටියට අපට ලබා දෙන්නට වෙනවා. මම කාලය මදි වුණත් එක උදාහරණයක් කෙටියෙන් කියන්නට ඕනෑ. බේරුවල නගර සභාවේ - සද්භාවයෙන් සියලුම නගර සභාවල නගරාධිපතිවරු ලිපියක් මගින් ජලයත්, විදුලියත් ලබා ගැනීමට අංකයක් ලබා දෙනවා. හැබැයි, සටහන් පොතේ සඳහන් වෙන්නේ නැහැ, ඒ වරිපනම් අංකය. එක්තරා ඉංජිනේරුවරයෙක් දුප්පත් පවුලකින් ඉපදුනු කාර්මික ඉංජිනේරුවරයෙක් නගර සභා නිවසක ජීවත් වුණේ.

# රීති අංක 30 යටතේ යෝජනාව
## MOTION UNDER RULE NO : 30

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින සභාවේ වැඩ කටයුතු අවසන් වන තුරු සභාවේ කාලය විනාඩි පහකින් දීර්ඝ කළ යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

ඒ ඉංජිනේරුවරයා දූප්පත් පවුලක නගර සභා ගෙයක ජීවත් වෙලා, ඉංජිනේරුවරයෙක් හැටියට පත් වෙලා, ඒ ගේ පරම්පරාවෙන් දෙකට බෙදා ගෙන ගෙවල් දෙකකට වෙන් කරලා ජීවත් වන කොට බේරුවල නගර සභාවේ මම නියෝජ්‍ය නගරාධිපතිවරයා වශයෙන් ඉන්න කාලයේ මම තාවකාලික අංකයක් දුන්නා. හැබැයි, මේ ඉංජිනේරුවරයා බේරුවල ප්‍රධාන පාසලකට මේ දරුවා ඇතුළත් කිරීමේදී, මේ දරුවා සුදුසු දරුවෙකු හැටියට තෝරා ගත්තා. හැබැයි, අහළ පහළ ඉන්න මනුස්සයෙක් පෙත්සමක් ගැහුවා. නිවසක් නැති දරුවෙකුට පාසල ලබා දෙනවා. පාසලෙන් බැහැරව මීටර් 300 ක් දුරින් ඉන්න දරුවාට පාසල ලැබුණේ නැහැයි කියලා. නගර සභාවෙන් ඉංජිනේරුවරයා ගැන සොයා බලන කොට වරිපනම් අංකයක් නැහැ. එහෙම නිවසක් නැහැ. පුවත පත්තරේ පළ වෙනවා, විදුලි කාර්මික ඉංජිනේරුවරයා බේරුවල විද්‍යාලයකට බොරු කුය ලේඛන ඉදිරිපත් කරලා අවස්ථාව ලබා ගත්තාය කියලා. එතකොට මානසිකව ඉංජිනේරුවරයාගේ ගෞරවයට මොකක්ද වෙන්නේ? ඒ නිසා තමයි මම යෝජනා කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා ලේඛනගත වෙන්නට ඕනෑ. මහ ඇමතිතුමා කියපු එක ඇත්ත. සද්භාවයෙන්ම සියලුම දේශපාලඥයින් මොන ආකාරයෙන් හරි අංකයක් ලබා දීලා, විදුලිය වතුර ලබා දෙනවා. ඒක ඇත්ත. සියලුම සභාපතිවරු අදත් ලංකාවේ දේවල් කරනවා. හැබැයි, නගර සභාවට, ප්‍රාදේශීය සභාවට ඒ බලය නැහැ, ඒ ලේඛන ඉදිරිපත් කරන්නට. නගර සභාවල ප්‍රාදේශීය සභාවල තිබෙන්නේ අනු කමිටු. මේවා නාගරික සංවර්ධන අධිකාරියේ කමිටු යෝජනා කරලා ඒ සැලසුම් කමිටුව අනුමත කළාට පස්සේ තමයි අනුමත කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, අපි සද්භාවයෙන් කියන්නේ. අපිත් එකඟ නැහැ. මමත් එකඟයි ලෙනාඩ් කරුණාරත්න ගරු මන්ත්‍රීතුමාගේ කථාවත් එක්ක. අපි අර නැවතත් මුඩුක්කු ජීවිතයට ගම ගෙනියන්නේ නැහැ. අර කුඩා කෑබලිවලට කට්ටි කඩලා ගෙනියන්න කියන්නේ නැහැ. හැබැයි, ඉතින් තමන්ගේ දෛවෝපගතව තමන්ට ලැබෙන දේවල්. තමන්ට වත්කමක් නැත්නම් මොන ආකරයෙන්ද ජීවත් වෙන්නේ? පොඩි පොඩි කෑලිවලට ගෙවල් හදා ගත්තේ නැත්නම්, එක ගෙදරක පවුල් හතරක් පහක් ජීවත් වන කොට ඊටත් වඩා ප්‍රශ්නවලට ඒ පවුල් මුහුණ දෙන්නට සිද්ධ වෙනවා. ඒ නිසා මේ ප්‍රායෝගික ගැටළු ගැන හිතලා බලලා තමයි මම ඒ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මම

[ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්]

මේ යෝජනාව ඉදිරිපත් කරද්දී අර මහා පරිමාණ ව්‍යාපාර කට්ටි කඩන ගෙවල්වලට දෙන්නේ නැහැ. මම හිතන්නේ, බේරුවල හිටපු සභාපතිතුමා වන ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමා බොහෝ ගෙවල්වලට විදුලිය ජලය ලබා දීලා තිබෙනවා. නැහැයි කියන්නේ නැහැ. සද්භාවයෙන් ලබා දෙනවා. සියලුම සභාපතිවරු කරනවා. නමුත් ප්‍රශ්නයක් මතු වෙන්නේ මේවා ලියාපදිංචි නොකර තාවකාලික අංකයක් හැටියට ලබා දුන්නත් මේවා ලේඛනගත වෙන්නේ නැති නිසා ප්‍රායෝගික ගැටළුවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා තමයි ගරු මහ ඇමතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරන්න වෙන්නේ. මේ සියලුම දේවල් ලේඛනගත වෙන්නට ඒ අවස්ථාවක් කර ගත යුතුයි. නගර සභාව තුළ, ප්‍රාදේශීය සභාව තුළ. බලයෙන් මුදල් දීලා දැනටත් ඒකට ඒජන්තලා ඉන්නවා. ඒවා මුදල් දීලා ක්‍රම ක්‍රමයෙන් ඒ දේවල් ලබා ගන්නවා. මුදල්වලින් ලබා ගන්නවා. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මමත් කොළඹ පර්චස් 3.60 ක ඉඩම් කෑල්ලකට රු. 50,000/- ක් මුදල් ගෙවලා ලබා ගත්තා. මන්ත්‍රීවරයෙක් වුණත් කරන්න දෙයක් නැහැ. කළ යුතු නම් ඒ දේවල් කළ යුතු වෙනවා. සාමාන්‍ය ගෙයක ජීවත් වන දුප්පත් පවුල්වලට එහෙම වියදම් කරලා ගන්නට බැරි අවස්ථා උදා වෙනවා. අනන්තයි. අප්‍රමාණයි. ඒ නිසා මේ ගරු සභාවේ අවධානය යොමු කරලා, මේ දේ ඉෂ්ට කර දීමටයි මම යෝජනා කරන්නේ ගරු සභාපතිතුමනි.

ඒ වාගේම තවත් ඉල්ලීමක් කරනවා. මම හිතන්නේ මහ ඇමතිතුමා පළාත් පාලන ආමාත්‍යවරයා හැටියට මේ අවස්ථාවේ නැහැ. මේ කාලගුණ තත්ත්වය බොහොම නරකයි. නියඟයක් එක්ක ජීවත් වන - මම හිතන්නේ මේ වසරේ මාස හයකට දෙවතාවක් ඇති වුණු නියඟය. එක දිගට. බේරුවල වාගේ ප්‍රදේශවල ලුණු වතුර තමයි ලැබෙන්නේ. අද කළු ගඟෙන් බේරුවල ප්‍රදේශයට ලැබෙන්නේ ලුණු වතුර. අනිකුත් ප්‍රදේශත් එහෙමයි. ඒ නිසා සෘජුවම සභාපතිට බලයක්, සභාපතිවරු නොමැති නිසා ප්‍රාදේශීය සභාවල ලේකම්වරුන්ට නියෝග නිකුත් කරලා සෘජුවම ඇමතිවරුන් එක්ක කථා කරලා ඉල්ලීමක් කළාම ඊට ඉහළ ඉන්න නිලධාරීන්ගේ තහංචි මතු වෙනවා එහෙම ඉල්ලන්න එපාය කියලා. සභාපති නැතිව ඉල්ලද්දී. එතකොට ඒ නියම රීති අනුව ඉල්ලීමක් කරන කොට නියඟයත් ඉවර වෙලා නැවතත් වර්ෂාව ඇති වුණාට පස්සේ තමයි බවුසර් ලබා ගන්නට වෙන්නේ. ඒ නිසා ඒ ලේකම්වරුන්ට අවස්ථාවක් උදා කරලා දෙන්න. අනෙකුත් ආයතනවල - වෝටර් බෝඩ් එකටත් කථා කරලා, පළාත් පාලන ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරලා පානීය ජලය ලබා දීමට, වතුර බවුසර් ලබා දෙන්නට අවස්ථාවක් ඇති කර ගන්නටත්, ජල ටැංකි මිලදී ලබා ගෙන හෝ ප්‍රාදේශීය සභා හරහා, නගර සභා හරහා ජනතාවට තාවකාලිකව පානීය ජලය ලබා දීමට අවස්ථාව ඇති කර දෙන්නය කියලත් මම යෝජනා කරනවා. අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## කල් තැබීම
## ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.35 ට, 2016 ඔක්තෝබර් මස 04 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***
*Accordingly, the Provincial Council was adjourned at 01.35 p.m till 09.30 a.m, on 04.10.2016.*